# වාර්ෂික වාර්තාව -2014



## පරමාණුක ශක්ති අධිකාරිය


අංක. **60/460,** බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.
දුරකථන : 2533427-8, 2533449  ෆැක්ස්: 2533448
විද්‍යුත් තැපැල: officialmail@aeb.gov.lk
වෙබ් අඩවිය : www.aeb.gov.lk

# 2014 වර්ෂය සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව

**පටුන** **පිටු අංකය**


| | |
|---|---|
| 1. සභාපතිතුමාගේ නිරීක්ෂණ | 04 |
| 2. විගණන කළමණාකරන කමිටුවේ නිරීක්ෂණ | 07 |
| 3. විකිරණ ආරක්ෂණ අංශය | 09 |
| 4. ජාත්‍යන්තර සහයෝගීතා අංශය | 12 |
| 5. සාමාන්‍ය විද්‍යාත්මක අංශය | 14 |
| 6. නිර්විනාශක පරීක්ෂණ අංශය | 19 |
| 7. විකිරණ පිරිසැකසුම් අංශය | 22 |
| 8. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය | 28 |
| 9. ජෛව විද්‍යා අංශය | 30 |
| 10. සමස්ථානික ජල විද්‍යා අංශය | 34 |
| 11. විඥාපන සේවා | 36 |
| 12. ජාත්‍යන්තර පරමාණුබල ඒජන්සියේ තාක්ෂණික සහයෝගීතා වැඩසටහන් | 38 |
| 13. මූල්‍ය ප්‍රකාශනය | 47 |
| 14. විගණකාධිපතිතුමාගේ වාර්තාව | 70 |
| 15. විගණකාධිපති වාර්තාව සඳහා සභාපතිතුමාගේ නිරීක්ෂණ | 80 |

## පරමාණුක ශක්ති අධිකාරිය පිළිබඳව.................

**1969 අංක 19 දරණ පරමාණුක ශක්ති අධිකාරි (ප.ශ.අ) පනත මගින් ශ්‍රී ලංකාවේ පරමාණුක ශක්ති අධිකාරිය ස්ථාපනය කරන ලදි.**

## අපගේ දැක්ම ,

**ජාතික අවශ්‍යතාවයන්ට අනුකූල ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත ආරක්ෂාව පෙරටු කොට ගත් ප්‍රශස්ත මට්ටමේ න්‍යෂ්ටික මධ්‍යස්ථානයක් බවට පත්වීමයි.**

## අපගේ මෙහෙවරයන් වන්නේ ,

- **ජාතික - සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා න්‍යෂ්ටික තාක්ෂණය යෙදවීම.**
- **අයනීකරණ විකිරණවලින් සිදුවිය හැකි අහිතකර බලපෑම්වලින් මහජනතාව, විකිරණ සේවකයන් හා පරිසරය ආරක්ෂා කිරීම සහතික කරනු වස්, නීති රෙගුලාසි සම්පාදනය හා ක්‍රියාවේ යෙදවීම.**

## අධ්‍යක්ෂ මණ්ඩලය

1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරී පනතේ 2(2) වගන්තිය ප්‍රකාරව පරමාණුක ශක්ති අධිකාරිය (ප.ශ.අ) අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් පාලනය වේ.

2014 වර්ෂයේ පරමාණුක ශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහතින් දැක්වේ.

1. ආචාර්ය රංජිත් එල් විජයවර්ධන මහතා (සභාපති)
   භෞතික විද්‍යාව පිළිබඳ බී.එස්.සී. ගෞරව උපාධිය, භෞතික විද්‍යාව පිළිබඳ එම්.එස්.සී උපාධිය, අධිශක්ති භෞතික විද්‍යාව පිළිබඳ පී.එච්.ඩී. උපාධිය (ඇමරිකා එක්සත් ජනපදය)
   (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය)

2. මහාචාර්ය ඩබ්.අභයවික්‍රම මහතා - (අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික)
   ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ බී.එස්.සී. උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, බී.එස්.සී. (මහිඩොල් විශ්ව විද්‍යාලය , බැංකොක් ), පී.එච්.ඩී (ලිවර්පූල් විශ්ව විද්‍යාලය, මහා බ්‍රිතාන්‍ය,)
   මහාචාර්ය, පරපෝෂී විද්‍යාව, පරපෝෂී විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය.

3. මහාචාර්ය බී.එම්.ඒ ඔස්වින් පෙරේරා මහතා - (අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) පශු වෛද්‍ය විද්‍යා පිළිබඳ උපාධිය (ශ්‍රී ලංකාව) ,පී.එච්.ඩී (ග්ලාස්ගව්)
   මාහාචාර්ය (විශ්‍රාමික)

4. පසන් ගුණසේන මහතා (අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික)
   නීතිඥ
   (සභාපති, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය)

5. වෛද්‍ය එන්.ජේ අභයගුණවර්ධන මහතා -( අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික)
   එම්.බී.බී. එස් , එම්.ඩී (විකිරණවේදී)
   උපදේශක විකිරණවේදී -විශේෂඥ

6. මහාචාර්ය ජනිතා අබේවික්‍රම ලියනගේ මහත්මිය (අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) - රසායන විද්‍යාව පිළිබඳ බී.එස්.සී. (විශේෂ) ගෞරව උපාධිය, පී.එච්.ඩී. (රසායන විද්‍යාව), රසායනික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, රසායනික විද්‍යා දෙපාර්තමේන්තුව, කැළණිය විශ්ව විද්‍යාලය.
   අධ්‍යක්ෂ - ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාතනය.

7. ආර් උඩුවාවල මහතා (අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) - බී.එස්.සී.ගෞරව-(භෞතික විද්‍යාව), ආයතනික නායකත්ව පිළිබඳ එම්.එස්.සී. උපාධිය (මොනෑෂ් විශ්ව විද්‍යාලය)

   අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව , මුදල් හා ක්‍රම සම්පාදක අමාත්‍යාංශය

8. එම්.කේ. සිතාරා ජයසේන මිය (අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික-ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නියෝජිත) -2014 ජූලි සිට බී.එස්.සී.ගෞරව-(භෞතික විද්‍යාව), ආයතනික නායකත්ව පිළිබඳ එම්.එස්.සී. උපාධිය (මොනෑෂ් විශ්ව විද්‍යාලය)
   අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව , මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

9. ඩී.ජී.එල්. වික්‍රමනායක මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

   බී.එස්.සී.ගෞරව-(භෞතික විද්‍යාව), එම්.එස්.සී. (නිර්විනාශක පරීක්ෂණ) කොළඹ විශ්ව විද්‍යාලය, එම්.එස්.සී. (න්‍යෂ්ටික විද්‍යාව) එක්සත් රාජධානිය.

සමාලෝචිත කාලපරිච්ඡේදය තුල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රැස්වීම් 13 ක් පවත්වන ලදී. අධිකාරියේ ක්‍රියාකාරකම් පිළිබඳ කරුණු, කාර්ය මණ්ඩලය පිළිබඳ කරුණු හා මූල්‍ය හා පරිපාලනය පිළිබඳ කරුණු ප්‍රතිපත්තිමය තීරණවලට එළඹීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව අධිකාරියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව ද අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිලිමත් විය.

## ජ්‍යෙෂ්ඨ කළමණාකරන මණ්ඩලය

| නම | තනතුර | සුදුසුකම් |
|---|---|---|
| ඩී.ජී.එල්. වික්‍රමනායක මහතා | අධ්‍යක්ෂ | බී.එස්.සී., එම්.එස්.සී.(කොළඹ වි.වි.) එම්.එස්.සී. (මහා බ්‍රිතාන්‍ය) |
| එච්.ජී.පී. කරුණාරත්න මහතා (29.05.2014 දින විශ්‍රාම යන ලදී) | අධ්‍යක්ෂ, ජාත්‍යන්තර හා මානව සම්පත් අංශය | බී.ඊ.ඩී.(කොළඹ වි. වි.) ඩී.බී.එම්. (එන්.අයි.බී.එම්) |
| සී. කාසිගේ මහතා | අධ්‍යක්ෂ, සාමාන්‍ය විද්‍යාත්මක අංශය | බී.එස්.සී (පේරාදෙණිය වි.වි.) එම්.එස්.සී. (කොළඹ වි.වි.) |
| එච්. එල්. අනිල් රංජිත් මහතා | අධ්‍යක්ෂ, විකිරණ ආරක්ෂණ අංශය | බී.එස්.සී , එම්.එස්.සී. (කොළඹ වි.වි.) |
| එච්.එම්.පී. විජේසේකර මහතා | වැඩබලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, මූල්‍ය හා පරිපාලන | වරලත් ගණකාධිකරණ ආවසරික සහතිකය, ඩී.බී.එම්. (එන්.අයි.බී.එම්) |
| වී.ඒ. වඩුගේ මහතා | අධ්‍යක්ෂ, ජෛව විද්‍යා අංශය | බී.එස්.සී (පේරාදෙණිය වි.වි.) එම්.එස්.සී. (කොළඹ වි.වි.) |
| එම්.සී.එස්. සෙනෙවිරත්න මිය | හිටපු අධ්‍යක්ෂ, ජෛව විද්‍යා අංශය | බී.එස්.සී. (ශ්‍රී'ජපුර වි.වි.) එම්.එස්.සී. (කොළඹ වි.වි.) |

## සභාපතිතුමාගේ නිරීක්ෂණ

2014 වර්ෂයේ පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉතා සතුටිනි. මීට පෙර වසර වලදී මෙන්ම මෙම වසරේදීත් අධිකාරිය ශ්‍රී ලාංකීය ජනතාවට න්‍යෂ්ටික තාක්ෂණය යොදාගෙන සේවා සපයන ලදී.
පරමාණුක ශක්ති නව පනත තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ප්‍රමුඛ කමිටුවක් මගින් කෙටුම් පත් කළ අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2014.11.04 දින ඒ සඳහා අනුමැතිය ලැබිණි.
ඒ අනුව නව පනත මගින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වශයෙන් ආයතන දෙකක් ස්ථාපනය කළ අතර 2015.01.01 දින සිට ක්‍රියාත්මක විය.
නියාමන සභාව මගින් න්‍යෂ්ටික ආරක්ෂාව හා සුරක්ෂිතතාවය සඳහා සහතික කරන අතර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය න්‍යෂ්ටික තාක්ෂණය මගින් සේවා සැපයීම හා සංවර්ධන කටයුතු සඳහා ක්‍රියා කරයි.
2015.01.01 දින සිට 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරී පනත වෙනුවට නව පනත ක්‍රියාත්මකවේ.

2014 වර්ෂයේ දී අධිකාරියේ ක්‍රියාකාරකම් පහත සඳහන් මාතෘකා යටතේ ඉදිරිපත් කොට ඇත.
අ) විකිරණ ආරක්ෂණය

ආ) ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ වැඩසටහන්

ඇ) න්‍යෂ්ටික ඉලෙක්ට්‍රොනික වැඩසටහන්

ඈ) ද්වීතිකමිතික විද්‍යාගාර සේවාව

ඉ) වෘත්තියන් හිදී විකිරණ වලට නිරාවරණයවීම මැනීමේ සේවාව

ඊ) නිර්විනාශක පරීක්ෂණ

උ) විකිරණ පිරිසැකසුම් තාක්ෂණය

ඍ) සමස්ථානික ජල විද්‍යාව

එ) න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා

ඒ) විඥාපන සේවා හා

ඔ) මිනිස් සම්පත් සංවර්ධනය

විකිරණ ප්‍රභව හා විකිරණශීලී සමස්ථානික භාවිතා කරන රාජ්‍ය හා පුද්ගලික ආයතන නිරන්තර අධීක්ෂණය කරමින් එම ස්ථාන වල විකිරණ ආරක්ෂණ කටයුතු සිදුකරන ලදි. විකිරණශීලී ද්‍රව්‍ය හා ප්‍රවිකිරණ උපකරණ (වෛද්‍ය එක්ස් කිරණ යන්ත්‍ර ඇතුළුව) භාවිත කරන්නන් ඒ සඳහා අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගත යුතු අතර 2014 වසරේ දී මෙවන් බලපත්‍ර 300 ක් නිකුත් කරන ලදී. මීට අමතරව විකිරණශීලි ද්‍රව්‍ය ආනයනය හා අපනයනය කිරීමට අධිකාරියේ අනුමැතිය ලබාගත යුතු අතර 2014 වසරේ දී මේ සඳහා දෙන ලද බලය පැවරීම් සංඛ්‍යාව 501 කි. විකිරණශීලි ද්‍රව්‍ය හා විකිරණශීලී සමස්ථානික භාවිතා කරන ස්ථාන අධීක්ෂණය පරමාණුක ශක්ති අධිකාරියේ කාර්යය භාරයක් වන අතර 2014 වසරේදී මෙවන් අධීක්ෂණ 125 ක් සිදු කරන ලදී. අධිකාරිය විසින් අධීක්ෂණයෙන් අනතුරුව, කළ යුතු වෙනස්කම් ඉදිරිපත් කළ පසු එම වෙනස්කම් වලට අනුකූලව ප්‍රවිකිරණ කාමර වෙනස් කිරීමෙන් අනතුරුව, ඒවා නිරීක්ෂණය කර එවන් කාමර 52 කට අනුමැතිය දෙන ලදී.

විකිරණ ආරක්ෂණ වැඩසටහන සඳහා පහසුකම් සැපයීම වශයෙන් උපකරණ ක්‍රමාංකන සේවා සිදු කිරීමට ආරක්ෂණ මට්ටමේ විකිරණමිතික ප්‍රමිතීන් හා රෝග නිධාන විකිරණමිතික ප්‍රමිතීන් (ISO 4037) ස්ථාපිත කිරීමට පරමාණුක ශක්ති අධිකාරියට හැකිවිය.

පුද්ගල විකිරණමිතික සේවය විකිරණ සේවකයන්ගේ ආරක්ෂාව තහවුරු කරන ඉතා වැදගත් සේවාවකි. 2014 ජූනි මාසයේ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් ප්‍රදානය කරන ලද තත්ව කළමණාකරන සහතිකය (ISO IEC -17025: 2005) පුද්ගල විකිරණමිතික සේවය සඳහා ලැබුණු ජාත්‍යන්තර පිළිගැනීමකි.

කර්මාන්ත අංශයේ ඵලදායිතාව වැඩි කිරීමට (යන්ත්‍ර සූත්‍ර වල ක්‍රියාකාරීත්වය කාර්යක්ෂම කිරීම තුලින්) නිර්විනාශක පරීක්ෂණ සේවා 160 ක් ලබා දෙන ලදී. ඊට අමතරව නිර්විනාශක පරීක්ෂණ ශිල්පීන් 266 ක් පුහුණු කරන ලදී.
ජෛව විද්‍යා අංශය, අධිකාරියේ න්‍යෂ්ටික විශ්ලේෂණ කටයුතු සඳහා වග කියන අංශය වේ. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය කාර්යයකි. 2014 වර්ෂයේ විකිරණශීලතාව සඳහා සාම්පල 7369 ක් විශ්ලේෂණය කරන ලදී.
2014 ජනවාරි 02 දින ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය වාණිජමය වශයෙන් ආරම්භ කරන ලදී.එය 2014 පෙබරවාරි 17 වන දින බියගම නිදහස් වෙළද කලාපයේ නිළ වශයෙන් විවෘත කරන ලදී.

ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා මිනිස් සම්පත් සංවර්ධනය ඉතා වැදගත් වේ. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගීතා වැඩසටහන යටතේ විශේෂඥ සේවා ලංකාවට සපයන අතර අධිශිෂ්‍යත්ව 17 ක්, විද්‍යාත්මක නිරීක්ෂණ චාරිකා 12 ක් හා කෙටිකාලීන සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා සඳහා ලාංකික විද්‍යාඥයන් 161 ක් හට (විදේශ රටවල පවත්වන ලද) සහභාගි වීමට අවස්ථාව සපයා දෙන ලදී.
අධිකාරියේ කාර්ය මණ්ඩලයේ උසස් වීම් ලබාදීම තුලින් මානව සම්පත් සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

## මූල්‍ය තොරතුරු

බාහිර පාරිභෝගිකයන්ට සපයන ලද සේවාවන්ගෙන් උපයන ලද දළ ආදායම් -2013 හා2014

(මිලියන වලින් වටිනාකම)

| | ආදායම් ප්‍රභවය | 2014 | 2013 |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය | 44.01 | ........ |
| 02 | බලපත්‍ර ගාස්තු | 4.10 | 3.83 |
| 03 | විකිරණ ආරක්ෂණ සේවා | 2.32 | 4.55 |
| 04 | න්‍යෂ්ටික උපකරණ නඩත්තුව/ පුද්ගල විකිරණමිතිය | 1.64 | 1.71 |

| | | | |
|---|---|---|---|
| 05 | නිර්විනාශක පරීක්ෂණ අධීක්ෂණ සේවා | 5.86 | 4.88 |
| 06 | නිර්විනාශක පුහුණු පාඨමාලා | 4.70 | 3.07 |
| 07 | න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා | 37.70 | 35.50 |
| 08 | විකිරණ පිරිසැකසුම් සේවා | ....... | 0.11 |
| 09 | ජල විද්‍යා අංශය | 0.61 | 0.86 |
| | එකතුව | 100.94 | 54.31 |

2014 වසරේ මුළු ආදායම 85% කින් වැඩි වී ඇත. පසුගිය වසර හා සසඳන විට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය මගින් ආදායම උත්පාදනය කර ඇත.
කොන්ක්‍රීට් පරීක්ෂණ, වෙල්ඩර් කාර්මිකයන් සඳහා පාඨමාලා බොයිලේරු අධීක්ෂණ සේවා හා නව පුහුණු පාඨමාලා ඇතිකොට නව ආදායම් උත්පාදන මාර්ග නිර්මාණය කොට ඉහත කී ප්‍රශ්ණය මඟ හරවා ගැනීමට බලාපොරොත්තු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්, ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මණ්ඩලය හා අධිකාරියේ සේවකයන් තරඟකාරී වෙළඳපොලක් තිබියදීත් ඉහත කී වැඩසටහන් සාර්ථකව ඉටු කිරීම සඳහා දක්වන ලද සහයෝගය පිළිබඳව මම ස්තුති වන්ත වෙමි.



සභාපති
පරමාණුක ශක්ති අධිකාරිය

# 1.විගණන හා කළමණාකරන කමිටු සමාලෝචනය -2014

මුදල් හා සැළසුම් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2010.12.14 දිනැති PED චක්‍රලේඛ අංක 55 ට අනුකූලව විගණන හා කළමණාකරන කමිටුව සෑදී ඇත.
පරමාණුක ශක්ති අධිකාරියේ 2014 වසරේ විගණන හා කළමණාකරන කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

අ) කේ. ආර්. උඩුවාවල මහතා (භාණ්ඩාගාර නියෝජිත)- සභාපති, විගණන හා කළමණාකරන කමිටුව- 2014 ජුනි දක්වා

ආ) එම්.කේ. සිතාරා ජයසේන මහත්මිය (භාණ්ඩාගාර නියෝජිත) සභාපති, විගණන හා කළමණාකරන කමිටුව 2014 ජූලි සිට

ඇ) මහාචාර්ය ජේ අබේවික්‍රම ලියනගේ මහත්මිය - කමිටු සාමාජික

ඈ) වෛද්‍ය එන්. ජේ. අබේගුණවර්ධන මහතා - කමිටු සාමාජික

ඉ) පී.පී. ගුණසේන මහතා - කමිටු සමාජික

ඉහතින් දක්වා ඇති සාමාජිකයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වන අතර ඔවුන් හට විද්‍යාත්මක, මූල්‍ය, පරිපාලන හා නීති ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇත.

අභ්‍යන්තර විගණක විගණන හා කළමණාකරණ කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර අධ්‍යක්ෂ ජෙනරාල් ඩී.ජී.එල් වික්‍රමනායක මහතා (අධ්‍යක්ෂ, ප.ශ.අ.) කමිටු රැස්වීම් වලට සහභාගී විය. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත ඒ. එල්. ජේ. විමලරත්න මහතා හා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වන ඒ.කේ.පී. පීරිස් මහතා නිරීක්ෂකයෙක් ලෙස රැස්වීම් වලට සහභාගී විය.

**කමිටු රැස්වීම්**
**රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව අධිකාරියේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වන ලදි. 2014 මූල්‍ය වසරේදී කමිටු රැස්වීම් 04 ක් පවත්වන ලදී.**

**කමිටුවේ විෂය පථය**
2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 55 ට අනුකූලව හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහ පාලනය පිළිබඳ මහ පෙන්වීමට අනුකූලව විගණන කමිටුව විසින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීමට උපරිම උත්සාහය දරන ලදි.

අ) අභ්‍යන්තර විගණකවරුන්ගේ අපක්ෂපාතී බව හා ඔවුන්ගේ කාර්යක්ෂමතාව සමාලෝචනය

ආ) අභ්‍යන්තර විගණන සැලැස්මට අනුකූලව අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන විගණන විමසුම් සහ වාර්තා අඛන්ඩව සලකා බැලීම.

ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති හා වෙනත් අදාළ නීති වලට අනුකූල වන ලෙස මූල්‍ය වාර්තාකරණය සිදුවන බව සාක්ෂාත් කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම.

ඈ)රජය විසින් නිකුත් කරන ලද සියළු නීති රෙගුලාසි හා චක්‍රලේඛ අදාල ආකාරයට යොදා ගන්නා බව නිරන්තරව සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කරමින් ඒවාට පටහැනි වූ විට ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරමින් අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඉ) අභ්‍යන්තර විගණන වාර්තා/ බාහිර විගණන වාර්තා කළමණාකරණ ලිපි හා පොදු ව්‍යාපාර කාරක සභා කමිටු නිර්දේශ සමාලෝචනය කරමින් ඌණතා හා දෝෂ මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම.

ඊ) අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දීමට හා ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම.

උ) විගණන කමිටු රැස්වීම අවසන්වීමෙන් අනතුරුව එහි නිර්දේශයන් හා වාර්තා, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරමින් නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට ඊට සහාය වීම.

## 2014 වසරේදී විගණන කමිටුවේ ක්‍රියාකාරකම්

1. විගණන කමිටුව විසින් 2014 වසර සඳහා සකස් කල වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර අනුමත කිරීම.

2. විගණන කමිටුව විසින් 2013 වසරේ අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ විගණන කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. එහි දී එකිනෙක අංශවල ප්‍රගතිය කාර්තු වශයෙන් පරීක්ෂා කර විගණන කමිටුවට වාර්තා කරන ලෙස විගණන කමිටුව අභ්‍යන්තර විගණකට උපදෙස් දුන් අතර අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ද නිර්දේශ කරන ලදී.

3. 2012 සහ 2013 විගණකාධිපති වාර්තා වල විමසුම් සඳහා ලබා දෙන ලද පිළිතුරු, විගණන කමිටුව විසින් සලකා බලන ලදී.

4. කමිටුව අභ්‍යන්තර විගණන වාර්තා වලින් පෙන්වා දී ඇති දෝෂ සහ ඌණතා සලකා බලන ලද අතර අධිකාරියේ ප්‍රධාන මූල්‍ය හා මෙහෙයුම් කාර්යයන් සියල්ලට කාර්යය පටිපාටීන් සකස් කිරීම නිර්දේශ කරන ලදී. තවද ගිණුම්කරනය සඳහා හඳුන්වා දෙමින් පවතින පරිගණක මෘදුකාංග ස්ථාපනය කිරීම කාර්යක්ෂමව කිරීමට ද උපදෙස් දෙන ලදී.

5. විගණන කමිටුව අධිකාරියේ සේවක අර්ථසාධක මුදල් ගෙවීම් සම්බන්ධව පවතින ගැටළු සහ ඒ සඳහා පොදු ව්‍යාපාර කාරක සභා කමිටුවේදී දී ඇති උපදෙස් සලකා බලන ලද අතර හිඟ දායක මුදල් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලෙස හා හිඟ දායක මුදල් ගෙවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී.

**සභාපති**

**විගණන හා කළමණාකරණ කමිටුව**

# 2. විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි

## 2.1. නියාමන අවශ්‍යතා සඳහා යටිතල පහසුකම් සංවර්ධනය

### 2.1.1. පරමාණුක ශක්ති පිළිබඳ නව පනත

පරමාණුක ශක්ති පිළිබඳ නව පනත ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මඟින් වර්ෂ 2014 නොවැම්බර් 04 දින සම්මත කරගන්නා ලදී. නව පනත 2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යනුවෙන් නම්කර 2014 නොවැම්බර් 07 දින රජයේ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කරන ලදී. නව පනත මඟින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ ශ්‍රී ලංකා පරමාණුක ශක්ති නියාමන සභාව යනුවෙන් ස්වාධීන අයතන දෙකක් ස්ථාපිත කරන ලදී. මෙම ආයතන දෙක 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වේ.

නියාමන සභාව මඟින් විකිරණ හා න්‍යෂ්ටික ක්‍රියා නියාමනය කරන අතර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මඟින් සමාජ ආර්ථික සංවර්ධනය සඳහා න්‍යෂ්ටික තාක්ෂණය යොදාගැනීමත් එම තාක්ෂණය මගින් සේවා සැපයීමත් සිදු කරයි.

නව පනත මඟින් 1969 අංක 19 දරණ පරමාණු ශක්ති අධිකාරී පනත අවලංගු වේ.

### 2.1.2. කාර්මික විකිරණ රේඛණය පිළිබඳ භාවිත සංග්‍රහය

මෙම භාවිත සංග්‍රහය භාවිතා කිරීම සඳහා පරමාණු ශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණි. මෙම භාවිත සංග්‍රහය බලපත්‍රලාභීන් අතර බෙදාහරින ලද අතර එමගින් න්‍යෂ්ටික ආරක්ෂණය පිළිබඳ ඔවුන්ගේ දැනුම වර්ධනය වීමත් නියාමන අවශ්‍යතාවයන් පිළිබඳවත්, පුද්ගල ආරක්ෂාව පිළිබඳවත් බොහෝ තොරතුරු ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වේ.

### 2.1.3. න්‍යෂ්ටික හා විකිරණ අනතුරක දී පෙර සූදානම හා ප්‍රතිචාර දැක්වීම සඳහා ජාතික සැලැස්ම

න්‍යෂ්ටික හා විකිරණ අනතුරු සඳහා ප්‍රතිචාර දක්වන්නන්ගේ අදහස් හා යෝජනා අනුව න්‍යෂ්ටික හා විකිරණ අනතුරක දී පෙර සූදානම හා ප්‍රතිචාර දැක්වීම සඳහා ජාතික සැලැස්මෙහි අවසාන කෙටුම්පත අවසන් කල අතර එය ආපදා කළමණාකරන මධ්‍යස්ථානය හරහා ආපදා කළමණාකරන සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවේ.

## 2.2. නියාමන කාර්යයන්

### 2.2.1. බලපත්‍ර නිකුත් කිරීම් හා ආයතනික පරීක්ෂාවන්

| | |
|---|---|
| කරන ලද ආයතනික පරීක්ෂාවන් සංඛ්‍යාව | = 138 |
| නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | = 300 |
| විකිරණශීලී ද්‍රව්‍ය ආනයනය හා අපනයනය සඳහා අවසර ලබාදීම් | = 501 |
| ප්‍රවිකිරණ කාමර අනුමත කිරීම් | = 52 |

### 2.2.2. න්‍යෂ්ටික ආරක්ෂණ වැඩසටහන ක්‍රියාවට නැංවීම

***විකිරණශීලී ප්‍රභව සඳහා ආරක්ෂාව***

- 2014 මාර්තු මස 5 -6 යන දිනවල මෙම වැඩසටහන සඳහා සහභාගී වන්නන් සමග පවත්වන ලද රැස්වීමේ දී සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රම විධි පිළිබඳව මේස මුහුණත් අභ්‍යාසයක් සැලසුම් කර එය 2014 අප්‍රියෙල් මස 7 -11 දක්වා සිදු කිරීමට කටයුතු කරන ලදී.
- මෙම මේස මුහුණත් අභ්‍යාසය, පොලිස් විශේෂ කාර්ය බලකායේ නිළධාරීන් ඇතුළුව 30 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සඳහා US GTRI හි සහාය ඇතිව බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටි ගැමා මධ්‍යස්ථානයේ දී සිදු කරන ලදී.
- 2014 අගෝස්තු මස 4-8 යන දිනවල ඇන්සල් ලංකා ආයතනයේ දී මේස මුහුණත් අභ්‍යාසයක් සිදු කරන ලද අතර එමඟින් එම ආයතනය සඳහා සපයා ඇති න්‍යෂ්ටික ආරක්ෂාව ප්‍රමාණවත් ද යන්න සොයා බැලීමත් අමතර ආරක්ෂාව අවශ්‍ය වේ නම් එය සැලසුම් කිරීමත් සිදු කරන ලදී.

න්‍යෂ්ටික අනතුරු සඳහා ප්‍රතිචාර දැක්වීම පිළිබඳ පුහුණුවක් ද විශේෂ කාර්ය බලකාය, පොලීසිය, ගිනි ආරක්ෂණ නිළධාරීන් සහ පරමාණුක ශක්ති අධිකාරියේ මෙන්ම ඇන්සල් ලංකා ආයතනයේ තාක්ෂණ නිළධාරීන් සඳහා බියගම නිදහස් වෙළඳ කලාප පරිශ්‍රයේ දී සිදු කරන ලදී. මෙයට 30 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගී විය.

- ප්‍රවිකිරණ මධ්‍යස්ථාන වල භෞතික ආරක්ෂාව ඉහල නැංවීම සඳහා 3න් අවුරුදු උපකරණ නඩත්තු වැඩසටහනක් එක්සත් ජනපද GTRI වැඩසටහන සමඟ ඒකාබද්ධව සිදු කිරීමට කටයුතු කරන ලදී.මේ යටතේ පහත සඳහන් ආයතන වල භෞතික ආරක්ෂාව සඳහා ක්‍රියාකාරකම් යොදන ලදී. ඇන්සල් ලංකා ආයතනය බියගම,පරමාණුක ශක්ති අධිකාරියේ විකිරණශීලී අපද්‍රව්‍ය ගබඩාව, මහරගම පිළිකා රෝහලේ විකිරණ චිකිත්සක මධ්‍යස්ථාන 4 ක් කරාපිටිය, බදුල්ල,මහනුවර අනුරාධපුර තෙලිප්පලායි යාපනය මහ රෝහල්වල විකිරණ චිකිත්සක මධ්‍යස්ථාන හා ආසිරි රෝහලේ රුධිර ප්‍රවිකිරණ මධ්‍යස්ථානය, කොළඹ මිනිස් පටක බැංකුව යනාදිය වේ.

ඉහත සඳහන් ආයතන වල භෞතික ආරක්ෂණ උපකරණ සවිකිරීම පිළිබඳ විශ්ලේෂනාත්මක පරීක්ෂණයක් ද එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. විකිරණ ආරක්ෂක උපකරණ සවිකිරීම පිළිබඳව පරීක්ෂණයක් එක්සත් ජනපද ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් මහරගම පිළිකා රෝහල හා කරාපිටිය මහ රෝහලෙහි සිදුකරන ලදී.



*රූපය.2.1: US GTRI කණ්ඩායම බියගම ගැමා මධ්‍යස්ථානයේ සිදුකරන ලද මේස මුහුණත් අභ්‍යාසය*

### *හිමිකරුවන් නොමැති විකිරණශීලී ප්‍රභව*



*රූපය .2.2: හිමිකරුවන් නොමැති විකිරණශීලී ප්‍රභවයක් සොයා ගැනීම කලාපීය පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මාකදුර*

හිමිකරුවන් නොමැති විකිරණශීලී ප්‍රභව හඳුනාගැනීම සඳහා ඒවා විමර්ශනය කිරීමේ වැඩසටහනක් පරමාණුක ශක්ති අධිකාරිය විසින් පහත සඳහන් මධ්‍යස්ථානවලදී සිදු කරන ලද අතර එම මධ්‍යස්ථාන වල තිබී හමුවූ න්‍යෂ්ටික ආමාන 6 ක් ආරක්ෂා සහිතව ප.ශ.අධිකාරියෙහි විකිරණශීලී අපද්‍රව්‍ය ගබඩාවේ ගබඩා කරන ලදී. එම මධ්‍යස්ථාන නම් කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය- බන්ඩාරවෙල, කිරුණෑලිඑලි - යාපනය, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මාකදුර, බතලෙගොඩ. කෘෂි භෝග හා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අගුණකොළ පැලැස්ස.

### *විකිරණශීලී ප්‍රභව ප්‍රවාහනයේ දී ආරක්ෂාව*

කොළඹ වරායේ සිට බියගම නිදහස් වෙළඳ කලාපය දක්වාත් කටුනායක ගුවන් තොටුපලේ සිට යාපනය දක්වාත් අධි ක්‍රියාකාරී විකිරණ ප්‍රභව ප්‍රවාහනය සඳහා කටයුතු කරන ලද අතර එක්සත් ජනපද GTRIසංවිධානය මගින් ප්‍රවාහනය කරන මාර්ගය සලකුණු කිරීම සඳහා උපකරණ සපයන ලදී. මෙම ප්‍රවාහන කටයුත්ත සඳහා ආරක්ෂාව GTRI මගින් පුහුණු කරන ලද විශේෂ කාර්යය බලකාය නිළධාරීන් මගින් සපයන ලදී.



*රූපය.2.3: විකිරණ ප්‍රභවය ප්‍රවාහනය කිරීමට පෙර පරීක්ෂාවට ලක්කිරීම*

**2.3. අන්තර් ජාතික පරමාණු බලශක්ති ඒජන්සියේ න්‍යෂ්ටික ආරක්ෂාව සඳහා උපකාර කිරීමේ වැඩසටහන (INSSP)**

- න්‍යෂ්ටික ආරක්ෂාව පිළිබඳ 3 අවුරුදු කාර්ය සැලැස්ම පරමාණුක ශක්ති අධිකාරිය විසින් ජාත්‍යන්තර පරමාණු බලශක්ති ඒජන්සියේ සහයෝගය ඇතිව පිළියෙල කරන ලදී. මෙම සැලැස්ම සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණි.

- 4 දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කණ්ඩායමක් මඟින් ශ්‍රී ලංකාවේ වරාය හා ගුවන්තොටුපල වල ආරක්ෂාව පිළිබඳව විශේෂඥ දූත මෙහෙවරක් 2014 දෙසැම්බර් මස 15-19 දක්වා සිදු කරන ලදී. කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල, මත්තල මහින්ද රාජපක්ෂ ගුවන්තොටුපල හා හම්බන්තොට වරාය යන ස්ථාන නිරීක්ෂණය කරන ලදී.

3. පුහුණු පාඨමාලා හා දැනුවත් කිරීමේ වැඩසටහන්

- රෝග නිධාන හා සම්බන්ධ විකිරණ ආරක්ෂණය හා තත්ව පාලනය පිළිබඳ රජයේ රෝහල් වල විකිරණවේදීන් සඳහා වූ ජාතික පුහුණු පාඨමාලාව 2014 නොවැම්බර් මස පවත්වන ලදී. මේ සඳහා විකිරණවේදීන් 33 දෙනෙකු සහභාගී විය.

- හෙද නිළධාරීන් සහ තාක්ෂණවේදීන් සඳහා වූ විකිරණ සමස්ථානික චිකිත්සාව සහ ප්‍රතිබිම්භකරණයේ දී පිළිපැදිය යුතු විකිරණ ආරක්ෂණ ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව 2014 අප්‍රියෙල් 23 -24 දිනයන්හි පවත්වන ලදී.

- විකිරණ අනතුරු සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් විශේෂ කාර්ය බලකා නිළධාරීන් සඳහා පවත්වන ලදී. මෙම පාඨමාලාව ගෝනහේන විශේෂ කාර්ය බලකා මුලස්ථානයේ 2014 මැයි මස 19 -23 පවත්වන්නට යෙදුන අතර එයට විශේෂ කාර්ය බලකා නිළධාරීන් 20 දෙනෙක් සහභාගිවිය.

- විකිරණ ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම සඳහා කළුතර විශේෂ කාර්ය බලකා පුහුණු පාසලේ දී විශේෂ කාර්ය බලකා නිළධාරීන් සඳහා 2014 ජූනි 20 දින පවත්වන්නට විය. ඒ සඳහා නිළාරීන් 30 ක් සහභාගී විය.

- ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය සඳහා පත් කරන ලද විකිරණ ආරක්ෂණ නිළධාරීන් පුහුණු කිරීම් සිදු කරන ලදී.

- ආරක්ෂාකාරී ලෙස විකිරණ යන්ත්‍ර භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් අනුරාධපුර මහ රෝහලේ වෛද්‍ය නිළධාරීන්, හෙද නිළධාරීන් සඳහා 2014 ජූලි මස 21 දින පැවැත්විණි. ඒ සඳහා ඉහත කී නිළධාරීන් 75 දෙනෙකු සහභාගී විය.

**4. විකිරණ අපද්‍රව්‍ය කළමණාකරණය**

- විකිරණශීලී ද්‍රව්‍ය සහිත ලෝහ අපද්‍රව්‍ය (අබල ලෝහ ද්‍රව්‍ය) කන්ටේනරයක් කොළඹ වරායේදී නිරීක්ෂණය කල අතර එම කන්ටේනරය ශ්‍රී ලංකා රේගුවේ ඉල්ලීම පරිදි ප්‍රතිඅපනයනය කිරීම සඳහා අවසර දෙන ලදී.

  සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කැනඩාවෙන් ආනයනය කරන ලද විකිරණශීලී ද්‍රව්‍යයන් යාපනයේ රෝහල් වෙත ප්‍රවාහනය කරන තුරු පරමාණුක ශක්ති අධිකාරියේ ගබඩාවේ ගබඩා කරන ලදී.

- ලංකා දුම්කොල සමාගම විසින් භාවිතයෙන් ඉවත් කරන ලද Sr-90 විකිරණ ප්‍රභව 3 ක් ප.ශ.අ. යේ අපද්‍රව්‍ය ගබඩාවේ ගබඩා කරන ලද අතර ඒ සඳහා රු..300000.00 ක ගාස්තුවක් අයකරන ලදී.

**5. වෙනත් ක්‍රියාකාරකම්**

- බියගම ඇන්සල් ලංකා සමාගම, ජාතික පිළිකා මධ්‍යස්ථානය මහරගම, ලංකා පටක බැංකුව සහ කරාපිටිය ශික්ෂණ රෝහල යන ස්ථානවල සවිකරන ලද භෞතික ආරක්ෂණ පද්ධතිවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම සඳහා ස්ථානීය පරීක්ෂාවක් එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුවේ විශේෂඥ කණ්ඩායමක් විසින් සිදු කරන ලදී. මෙම පරීක්ෂාව මගින් එක්සත්

ජනපද GTRI වැඩසටහන සඳහා තව දුරටත් ආධාර උපකාර දිය යුතු ද යන්න තක්සේරුවට භාජනය කරන ලදී.

- බියගම ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි 2013.07.03 සිට 2014.01.03. වකවානුව විකිරණ ආරක්ෂණ නිලධාරීන් පත්කිරීම විකිරණ ආරක්ෂණ අංශය මගින් සිදු කරන්නට යෙදුනි.

  බියගම ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ දී යොදා ගන්නා විකිරණ ආරක්ෂණ පරීක්ෂණ වාර්තා පිළියෙල කරන ලදී.

- බියගම ගැමා මධ්‍යස්ථානයේ නියාමන කටයුතු සඳහා විකිරණ ආරක්ෂණ පරීක්ෂණ සිදු කරන ලදී.

# 3. ජාත්‍යන්තර සහයෝගිතා අංශය

අන්තර්ජාතික පරමාණු බල ඒජන්සියේ ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් පරමාණුක ශක්ති අධිකාරිය ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘති කළමණාකරණ රාමුව (PCMF) භාවිතය මගින් ජාතික ව්‍යාපෘති සංකල්ප පිළියෙල කිරිම සඳහා මෙහයවනු ලබයි. PCMF භාවිතය මගින් ව්‍යාපෘති සංකල්ප 12 ක් අන්තර්ජාතික පරමාණු බල ඒජන්සිය වෙත යොමුකර ඇති අතර ඉන් පහක් වැඩි දියුණු කොට සැලසුම් අවධියට ගෙන ඒම සඳහා තෝරා ගෙන ඇත. මෙම ව්‍යාපෘති 2016 – 2017 ද්විවාර්ෂිකය තුල ක්‍රියාත්මක කිරිමට නියමිතය. මෙම ව්‍යාපෘති දේශිය වැඩසටහන් රාමුව (CPF) හා ජාතික සංවර්ධන සැලසුම් වන මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව පිලියෙල කර ඇත. පහත දැක්වෙන්නේ එසේ අනුමත වූ ව්‍යාපෘති පහයි.

| | ව්‍යාපෘතිය | සහභාගිවන ආයතනය |
|---|---|---|
| 1 | පරමාණු ශක්ති අධිකාරිය තුල න්‍යෂ්ටික විශ්ලේෂණ හැකියාවන් ශක්තිමත් කිරීම | පරමාණුක ශක්ති අධිකාරිය |
| 2 | වාතය මගින් ව්‍යාප්ත වන රෝග සඳහා වෛද්‍ය හා අනුක කීට විද්‍යාව සඳහා කලාපීය පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් ගොඩනැගීම | අනුක වෛද්‍ය අංශය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය. |
| 3 | කිරි ගවයින් නිෂ්පාදනය මගින් ජීවන තත්වය උසස් කිරීම : ග්‍රාමීය ශ්‍රී ලංකාව තුල කාන්තා ගොවීන් සවිබල ගැන්වීම | පශු වෛද්‍ය හා සතත්ව විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය. |
| 4 | යෞවන සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ ආමන්ත්‍රණය තුලින් කන්තුක පරිවෘත්තීය අනතුරු වලක්වා ගැනීම | කායික විද්‍යා අංශය, වෛද්‍ය විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය. |
| 5 | නිර්විනාශක පරීක්ෂණ සඳහා ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීම මගින් නිර්විනාශක පරීක්ෂණ ශක්තිමත් කිරීම හා දිගටම පවත්වාගෙන යාම. | නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය, පරමාණුක ශක්ති අධිකාරිය. |

මෙම කාලය තුලදී අන්තරජාතික පරමාණු බල ඒජන්සිය, දකුණු කොරියාවේ RCARO ආයතනය හා ජපානයේ MEXT ආයතන මගින් ලබාදුන් අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් න්‍යෂ්ටික විද්‍යාවට හා තාක්ෂණයට අදාළව දේශිය විද්‍යාඥයින් පුහුණු කිරිමට පරමාණුක ශක්ති අධිකාරියට අවස්ථාව ලබාගත හැකි විය. එවැනි විදේශිය පුහුණු පාඨමාලා, වැඩමුළු හා රැස්වීම් ආදි අවස්ථා 84 කට මෙරට ජාතික ආයතන වල සේවය කරන විද්‍යාඥයින්, ඉංජිනේරුවන් හා පර්යේෂකවරු සහභාගි කරවීමට හැකි විය. අන්තර්ජාතික පරමාණු බල එජන්සියේ විකිරණ තාක්ෂණය යොදාගන්නා සාමාජික රටවල පිහිටුවා ඇති කර්මාන්ත, වෛද්‍ය විද්‍යාව හා තාක්ෂණය යන ක්ෂෙත්‍රයන්ට අදාළ ආයතන වල තෝරා ගනු ලැබූ නිළධාරින් පුහුණු කරනු ලැබිය.

ජාතික ව්‍යාපෘති සංකල්ප අන්තර්ජාතික පරමාණු බල ඒජන්සියට යොමුකිරිම සඳහා PCMF වෙබ් අඩවි පද්ධතිය යොදාගත් අතර එම ව්‍යාපෘති අධීක්ෂණය කිරිම හා පරමාණුක ශක්ති අධිකාරියට අවශ්‍ය තොරතුරු ලබාගැනිම සඳහා TCPRIDE පද්ධතිය යොදා ගන්නා ලදී. තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් සඳහා මෙවැනි වෙබ් අඩවි මත පදනම් වූ පද්ධතින් බහුලව යොදාගනු ලබයි. අධිශිෂ්‍යත්ව හා

විද්‍යාත්මක නිරික්ෂණ චාරිකා වලට අදාළ අයදුම්පත්‍ර අන්තර්ජාතික පරමාණු බල ඒජන්සියට යොමු කිරීම සඳහා In touch වෙබ් අඩවි පද්ධතිය යොදාගනු ලබන අතර මෙම ක්‍රමය අනෙකුත් අයදුම්පත්‍ර යොමුකිරීම සඳහා ද අන්තර්ජාතික පරමාණු බල ඒජන්සිය අයදුම්කරුවන් දිරිගන්වනු ලබයි.

## 3.1 තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම.

වසර 2014 – 2015 සඳහා අන්තර්ජාතික පරමාණු බල ඒජන්සිය මගින් ජාතික ව්‍යාපෘති 05 ක්, කලාපිය ව්‍යාපෘති 17 ක් හා ඊට අමතරව අන්තර්කලාපිය ව්‍යාපෘති අනුමත කර ඇති අතර 2014 වසර තුළදී ඒවා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

ජාතික ව්‍යාපෘතින් හා කලාපිය ව්‍යාපෘතින් සංවර්ධනය කිරීම අරමුණු කොට ගෙන, පරමාණුක ශක්ති අධිකාරියේ පුහුණු වීම් හා ඇගයීම් අංශය සමඟ එක්ව ව්‍යාපෘති විමර්ශනය හා ඇගයීම් වලට අදාළ රැස්වීම් 2014 වර්ෂය මුළුල්ලේම පවත්වාගෙන ගියේය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පියයේ න්‍යෂ්ටික වෛද්‍ය ඒකකය, මැලේරියා මර්ධන ව්‍යාපාරය, සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, භූ විද්‍යා හා පතල් කාර්යංශය යන ආයතන සඳහා ජාතික ව්‍යාපෘති ඔස්සේ අන්තර්ජාතික පරමාණු බල ඒජන්සිය තාක්ෂණික ආධාර ලබාදීම සිදුකරයි. 2014 වසරේ සිට නිර්විනාශක ජාතික පර්යේෂණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර අන්තර්ජාතික පරමාණු බල ඒජන්සිය මගින් පුද්ගලයන් පුහුණු කිරීම සිදුකරයි.

## 3.2 ශ්‍රී ලංකාව් පවත්වන ලද අන්තර් ජාතික පරමාණු බල ඒජන්සියේ වැඩසටහන්.

2014 වර්ෂය තුල අන්තර් ජාතික පරමාණු බල ඒජන්සියේ වැඩසටහන් 6 ක් අධිකාරිය විසින් මෙරට පවත්වනු ලැබිය.

| ව්‍යාපෘති අංකය | වැඩමුළුව | කාලය |
|---|---|---|
| RAS/5/066 | පළමු සම්බන්ධීකාරක හා උපදේශාත්මක රැස්වීම | 2014 මැයි 05 සිට 09 දක්වා |
| RAS/1/014 | මධ්‍ය වාර්ෂික සමාලෝචන රැස්වීම | 2014 ජූනි 23සිට 27 දක්වා |
| RAS/9/0/71 | විකිරණ අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව | 2014 ජූනි 30 සිට ජූලි 04 දක්වා |
| RAS/6/063 | න්‍යෂ්ටික හෘද විද්‍යාවේ සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා කලාපීය පුහුණු පාඨමාලාව | 2014 ජූලි 07 සිට 13 දක්වා |
| RAS/7/023 | පුරා විද්‍යා වස්තූන් කෙරෙහි වායු අංශු පදාර්ථ වල බලපෑම පිළිබඳ කලාපීය වැඩමුළුව | 2014 ජූලි 07 සිට 11 දක්වා |
| RAS/5/062 | බහු විචල්‍ය සංඛ්‍යානය පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව | 2014 ඔක්තොම්බර් 13 සිට 24 දක්වා |

ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ මෙවැනි වැඩසටහන් මගින්, මෙරට විද්‍යාඥයින් හා පර්යේෂකවරුන් විශාල සංඛ්‍යාවකට විදේශ රටවල් වලින් පැමිණි විශේෂඥයින් හා විද්‍යාඥයන් සමඟ අදහස් හුවමාරුකර ගැනිමට අවස්ථාව ලැබුණි.

## 3.3 අන්තර්ජාතික පරමාණු බල ඒජන්සියේ සාමාජික රටවල් සමඟ ද්විපාර්ශවික සාකච්ඡා සංවිධානය කිරීම.

පරමාණු ශක්ති අධිකාරිය රුසියාවේ ROSATOM (රුසියාවේ සමූහාණ්ඩුවේ රාජ්‍ය පරමාණුක නියෝජිතාන සහයෝගිතාව) පකිස්ථානය හා ඉන්දියාව, සමඟ ද්විපාර්ශවික සාකච්ඡා පැවත්වූ අතර, ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික තාක්ෂණය දියුණු කිරීම සඳහා තාක්ෂණික ආධාර ලබාගැනිම මේ සඳහා අරමුණු විය.

### රුසියාව සමඟ පැවැත්වූ ද්විපාර්ශවික සාකච්ඡා

2014 අප්‍රේල් මස 22 සිට 24 දින දක්වා පවත්වන ලැබූ සාකච්ඡාව සඳහා භාෂා පරිවර්තකයෙක් ද ඇතුළුව හත්දෙනෙක් යුතු කණ්ඩායමක් මෙරටට පැමිණි අතර, පරමාණුක ශක්තිය සාමකාමී යෙදවුම් සඳහා තාක්ෂණික ආධාර ලබාගැනිම පිළිබඳ ඔවුන් සමඟ වැඩිදුර සාකච්ඡා පවත්වන ලදි. මෙහිදි පහත කරුණු පිළිබඳ අවධානය යොමු විය.

- උසස් න්‍යෂ්ටික විද්‍යා පරික්ෂණාගාර.
- පරික්ෂණ ප්‍රතික්‍රියාකාරක.
- විකිරණශිලි අපද්‍රව්‍ය සුරක්ෂිතාගාර.
- Th (තෝරියම්) නිස්සාරණය.

**පකිස්ථානය සමඟ පැවැත්වූ ද්විපාර්ශවික සාකච්ඡා**

පකිස්ථාන පරමාණු ශක්ති කොමිෂන් සභාවේ සහායෝගය ඇතිව දෙරට අතර අවබෝධතා ගිවිසුමක් කෙටුම්පත් කරන ලද අතර, සෞඛ්‍ය, කෘෂිකර්මය, කර්මාන්ත හා පරිසර යන අංශ වැඩි දියුණු කිරීමට තාක්ෂණික ආධාර ලබාගැනීමට මෙමඟින් අපේක්ෂා කරයි.

**ඉන්දියාව සමඟ පැවැත්වූ ද්විපාර්ශවික සාකච්ඡා**

මෙම සාකච්ඡා වල අරමුණ වන්නේ දැනුම හා ප්‍රවීනයන් හුවමාරු කිරීම, සම්පත් හුවමාරුව, අත්දැකීම් හුවමාරු කර ගැනීම හා විද්‍යාත්මක කාර්යමණ්ඩලය පුහුණු කිරීම ආදියයි.

a) න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී භාවිතයන් සඳහා වූ මූලික හා ප්‍රායෝගික පරීක්ෂණ.

a) කර්මාන්ත, කෘෂිකර්මය හා ජල කළමණාකරන සඳහා විකිරණශීලි සමස්ථානික භාවිතය.

b) සෞඛ්‍ය ආරක්ෂණය ඇතුළුව න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව සඳහා විකිරණශීලි සමස්ථානික භාවිතය.

c) න්‍යෂ්ටික ආරක්ෂණය, විකිරණ ආරක්ෂණය, න්‍යෂ්ටික හා විකිරණ උවදුරු ලිහිල් කිරීම හා පරිසර ආරක්ෂණය.

d) න්‍යෂ්ටික ආරක්ෂාව.

e) විකිරණශීලි අපද්‍රව්‍ය කළමණාකරණය කිරීම.

ඉන්දියාව සමඟ දෙවැනි ද්විපාර්ශවික සාකච්ඡා වටය 2014 මැයි මස 05 හා 06 යන දිනවලදී ශ්‍රී ලංකාවේ පැවැත්වුණි. අන්තර්ජාතික පරමාණු බල ඒජන්සියේ ප්‍රධාන සමුළුවේදී ශ්‍රී ලංකාවේ නියෝජිත මණ්ඩලය හා ඉන්දියාවේ නියෝජිත මණ්ඩලය මුණගැසී වැඩිදුර සාකච්ඡා පවත්වා ඇත.

තෙවැනි රැස්වීම පැවැත්වුයේ 2014 ඔක්තොම්බර් මස 10 දින ඉන්දියාවේදිය.

## 3.4 MEXT - ජපානයේ න්‍යෂ්ටික පර්යේෂකයින් හුවමාරු වැඩසටහන 2014

ශ්‍රී ලංකාවේ විවිධ ආයතන වලින් අයදුම්පත්‍ර 12 ක් මෙම වැඩසටහන සඳහා ලැබුණි. එම වැඩසටහනට සහභාගී වීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා විදුලිබල මණ්ඩලයේ විද්‍යාඥයින් දෙදෙනෙක් ජපානයෙන් තෝරාගන්නා ලදි.

## 3.5 අන්තර්ජාතික පරමාණු බල ඒජන්සියේ මහ සමුළුව

49 වැනි අන්තර්ජාතික පරමාණු බල ඒජන්සියේ මහ සමුවව සඳහා ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලයේ ප්‍රධානියා ලෙස තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කල අතර, පරමාණු ශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හරහා අන්තර්ජාතික අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහභාගී විය. අන්තර්ජාතික පරමාණු බල ඒජන්සියේ තාක්ෂණ සහයෝගිතා අංශයේ නිළධාරින් සමඟ තාක්ෂණ සහයෝගිතා වැඩසටහන් පිළිබඳ රැස්වීම් පැවැත්වූ අතර රුසියාව, පකිස්ථානය, ඉන්දියාව සමඟ ද්පාර්ශවික සාකච්ඡා පැවැත්විය.

# 4. සාමාන්‍ය විද්‍යාත්මක අංශය

## 4.1. න්‍යෂ්ටික උපකරණ නඩත්තු වැඩසටහන

සමාජ ආර්ථික සංවර්ධනය සඳහා න්‍යෂ්ටික තාක්ෂණය යොදා ගැනීමේදී න්‍යෂ්ටික උපකරණ වල මනා ක්‍රියාකාරීත්වය අත්‍යාවශ්‍ය කරුණකි. මේ සඳහා සාමාන්‍ය විද්‍යා සේවා අංශය මඟින් න්‍යෂ්ටික උපකරණ නඩත්තු වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. න්‍යෂ්ටික උපකරණ අළුත්වැඩියා කිරීම,

මෘදුකාංග යාවත්කාලීන කිරීම, ඒවා පාවිච්චිය සඳහා උපදෙස් දීම යනාදිය මෙම වැඩසටහන තුලින් සිදු කරමින් න්‍යෂ්ටික තාක්ෂණයේ ප්‍රතිලාභ මහජනතාවට ලබා ගැනීමට සලස්වා ඇත.

### 4.1.1. න්‍යෂ්ටික ඉලෙක්ට්‍රොනික උපකරණ නඩත්තුව / සේවා සැපයීම

අ). 2014 වර්ෂයේ දී සිදු කරන ලද උපකරණ නඩත්තු සේවා, මෘදුකාංග ඇතුලත් කිරීම, ක්‍රියාකරන්නන්ව පරීක්ෂා කිරීම් 53 කි.

ආ). ශ්‍රී ලංකා පරමාණුක ශක්ති අධිකාරිය තුල භාවිතා වන පරිගණක මෘදුකාංග හා දෘඩාංග

අළුත්වැඩියා කිරීම්, අභ්‍යන්තර පරිගණක ජාලගත සේවා සැපයීම් - 55

ඇ). උපදේශනාත්මක සේවා සහ සංවර්ධන ක්‍රියාවන් :

i. සාමාන්‍ය විද්‍යා සේවා අංශයේ න්‍යෂ්ටික උපකරණ විශේෂඥ කණ්ඩායම විසින් න්‍යෂ්ටික අනතුරු පූර්ව දැනුම්දීමේ පද්ධතියේ නඩත්තු හා ක්‍රමාංකන කටයුතු කිරීමේ වගකීම බාරගත්
ii. අතර නොරොච්චෝලේ සවිකරන ලද න්‍යෂ්ටික අනතුරු අනාවරකය ගලවා පුත්තලම ප්‍රදේශයේ නැවත ස්ථාපනය කිරීම.

iii. අනාවරක ක්‍රමාංකනය හා නඩත්තු කිරීම, ප්‍රධාන සේවා සැපයීමේ පරිගණක නඩත්තු කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම යනාදිය නිරතුරුවම සිදු කරමින් මහජනතාව වෙත විශ්වාසනීය දත්ත ලබා දීමට කටයුතු කිරීම.

### 4.1.2. පුහුණු කිරීම්

සාමාන්‍ය විද්‍යා සේවා අංශයේ විද්‍යාඥයින්ගේ මහපෙන්වීම යටතේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා අංශයේ උපාධි අපේක්ෂක සිසුන්හට ගෘහාශ්‍රිත රේඩෝන් වායුව මැනීම සඳහා ඇල්ෆා විකිරණයට සංවේදී RAD7 අනාවරක භාවිතය පිළිබඳ පුහුණුවක් ලබා දීම.

## 4.2. ද්විතියික සම්මත විකිරණමිතක විද්‍යාගාරය (SSDL)

ශ්‍රී ලංකා පරමාණුක ශක්ති අධිකාරියේ ද්විතික සම්මත විකිරණමිතික විද්‍යාගාරය මඟින් විකිරණ උපකරණ ක්‍රමාංකනය සඳහා ප්‍රමිතින් ඉතා උසස් ත්ත්ව යටතේ පවත්වාගෙන යනු ලබයි.
විකිරණ උපකරණ ක්‍රමාංකනය කිරීමේ මූලික සේවා ලාභීන් වන්නේ විකිරණ මඟින් ප්‍රතිකාර ලබන රෝගීන්, විකිරණ සේවකයන් හා සාමාන්‍ය මහජනතාවයි.

ද්විතික සම්මත විකිරණමිතික විද්‍යාගාරය ජාත්‍යන්තර මිනුම්කරණ පද්ධතිය සමග සම්බන්ධ වි ඉහත කි සේවාවන් සඳහා නිවැරදි මිනුම්කරණ ප්‍රමිතීන් සිදු කරයි.
ද්විතික සම්මත විකිරණමිතික විද්‍යාගාරයේ උපකරණ ප්‍රංශයේ පිහිටා ඇති ජාත්‍යන්තර බර සහ මිනුම් කාර්යංශයේ ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රමාංකනය කර ඇත. මෙම උපකරණවල ත්ත්වයන් ඉතා උසස් මට්ටමින් නඩත්තු කරන අතර ඒවායේ නිවැරදිතාව සහතික කිරීම සඳහා තත්ව පාලනය ISO /IEC 17025: 2005 තත්වපාලන ප්‍රතීතන තත්වයන්ට අනුව පවත්වාගෙන යනු ලබයි. මෙම විෂයේ නව ප්‍රවනතාවයන්ට අනුකූලව විද්‍යාගාරය යාවත්කාලීන කිරීම නොකඩවා සිදුකරමින් පවතී. මෙම විද්‍යාගාරය 2009 වර්ෂයේ සිට ප්‍රතීතන තත්වය ලබා ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ භාවිතා වන විකිරණ ආරක්ෂණ රෙගුලාසි වලට අනුව විකිරණශීලී ද්‍රව්‍ය හා විකිරණ භාවිතා කරන්නන් හට සිදුවිය හැකි විකිරණ අවශෝෂණය මැන ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. සාමාන්‍ය විද්‍යා සේවා අංශය මඟින් දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි පුද්ගල විකිරණ මිතික සේවය ක්‍රියාත්මක කරවයි.
විකිරණමිතික සේවය මඟින් මාසිකව සහ ද්වි මාසික වශයෙන් වසරකට පුද්ගලයින් 900කගේ පමණ විකිරණ අවශෝෂණය පරික්ෂා කරන අතර මේ සඳහා භාවිතා කරන තාක්ෂණික උපකරණය වන්නේ තාප සංදීප්ත විකිරණමිතික මානයයි.
මෙම සේවාව සිදු කෙරෙන විද්‍යාගාරය සඳහා වර්ෂ 2014 දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ISO 17025: 2005 ට අනුකූල ප්‍රතීතන සහතිකය ලබා ඇත.





*රූපය 4.1: ද්විතිකමිතික විද්‍යාගාරයේ විකිරණ නිවාරණ කුටිය හා පාලන කුටිය*

**සේවා සහ ක්‍රියාකාරකම්:**

- 2014 වර්ෂයේ දී රජයේ සහ පෞද්ගලික ආයතන වලට අයත් විකිරණ මිතික උපකරණ 70 ක් ක්‍රමාංකනය කර ඇත.

  [විකිරණ ප්‍රභවයන් භාවිතා කරන ආයතන වල සේවකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා එම ආයතන පුද්ගල විකිරණ මිතික සේවය සහ අයණීකරන විකිරණ මාපක ක්‍රමාංකනය කර ගැනීම අනිවාර්යය වේ.].

- තාපසංවේදී විකිරණමිතික මාපක කියවීම සඳහා භාවිතා කරන උපකරණයන් ක්‍රමාංකනය කිරීම සඳහා සහ එම උපකරණ වල තත්ව පාලනය සඳහා අවශ්‍ය වන තාපසංවේදීතා මාපක 600 ක් ප්‍රවිකිරණය කිරීම.

- පරිසරයේ විකිරණ ප්‍රමාණයන් මැනීම සඳහා යොදා ගන්නා පරිසර තාපසංවේදීතා මාපක වල තත්ව පාලන සහ මිණුම් කටයුතු සඳහා ඒවා ප්‍රවිකිරණය කිරීම.

- මහරගම, යාපනයේ තිලිප්පලෙයි පිළිකා රෝහල් වල පිළිකා ප්‍රතිකාර කටයුතු සඳහා යොදාගන්නා විකිරණ කදම්භ ක්‍රමාංකනය කරන ලදී.

- පිළිකා චිකිත්සක මධ්‍යස්ථාන වල යොදා ගන්නා විකිරණ කදම්භ වල නිවැරදිතාව සහතික කිරීම සඳහා අන්තර් ජාතික පරමාණුක ශක්ති ඒජන්සිය සමඟ සම්බන්ධ වී තාප සංවේදීතා මාපක විගණනයක් කරන ලදී.

- ද්වීතියික මිතික විද්‍යාගාරයේ විකිරණමිතික සම්මතයන් සහ ඒවා මැනීමට ආධාර කරගනු ලබන අනෙකුත් උපකරණ වල නඩත්තු කටයුතු නිරන්තරයෙන් සිදු කරන ලදී.

- ප්‍රාග්ධන බෙදා ගැනීමේ පදනම මත අන්තර් ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය සමඟ අංක SRL/0/010 තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය යටතේ විකිරණ ආරක්ෂණය තත්වයේ හා රෝග හඳුනාගැනීමේ තත්වයේ ක්‍රමාංකන සේවා ලබාදීමට යොදා ගන්නා X - කිරණ පද්ධතියක් ලබා ගන්නා ලදී. මෙම උපකරණය ද්වීතියික විකිරණමිතික විද්‍යාගාරයේ සවිකර ඇති අතර විකිරණ කදම්භ වල නිවැරදිතාව මැනීම මේවන විට සිදු කරමින් පවතී.

- ද්වීතියික විකිරණමිතික විද්‍යාගාරයේ ඇති නිරපේක්ෂ සම්මතයන් හා විකිරණමිතික සම්මතයන් වල ස්ථාවර භාවය සහ නිවැරදි භාවය සහතික කිරීම සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයකට යටත්ව තහවුරු පරීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

- ද්වීතියික විකිරණමිතික විද්‍යාගාරයේ ඇති තත්ව කළමණාකරණ වැඩසටහන නොනත්වා වැඩි දියුණු කරමින් පවතී.

- ද්වීතියික මිතික විද්‍යාගාරයේ නිවැරදි භාවය සහ (Traceability) සහතික කිරීම සඳහා අන්තර් ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය උපකාර ලබාදීමට කටයුතු කරන ලදී.

## 4.3. පරිගණක යෙදීම්

I. ආයතනයේ ප්‍රාදේශීය ජාලයේ ධාරිතාව වැඩි කිරීම සඳහා මෙගා බයිට් 8 ක පුළුල් කලාපීය දත්ත සැපයුමක් ස්ථාපනය කරන ලදී.

II. අධිකාරියේ වෙබ් අඩවිය මෙන්ම ප්‍රාදේශීය ජාලය නඩත්තු කරන ලදී.

III. පරිගණක සේවා ( පරිගණක ක්‍රියාත්මක කිරීමේ මෘදුකාංග ස්ථාපනය, පරිගණක පද්ධති වල ප්‍රශ්ණ හඳුනාගැනීම හා දෘඩාංග ප්‍රතිසංස්කරණය, න්‍යෂ්ටික වර්ණාවලීක්ෂ පද්ධතියෙහි මෘදුකාංග සම්බන්ධ ගැටළු නිවැරදි කිරීම ) ආදිය සිදු කරන ලදී.

IV. Quick Book ගිණුම් පැකේජය ආදිය මගින් කාර්යාල ස්වයංක්‍රීය කරන පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා පරිගණක ආශ්‍රිත සහාය ලබාදීම.

පරිගණක ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට බාධාවක් වශයෙන් ආයතනයේ දැවෙන ප්‍රශ්ණයක් ලෙස මූලික දැනුමැති කාර්ය මණ්ඩලය හිගය පවතී. මේවන විට පරිගණක අංශයේ එක් උපාධිධාරී නිළධාරිණියක සේවය ලබා දෙමින් සිටි.

### 4.4 වෘත්තීයමය වශයෙන් අයනීකාරක විකිරණ ආශ්‍රිතව සේවය කරන පුද්ගලයින්ගේ විකිරණ මාත්‍රා මැනීම සඳහා පුද්ගල විකිරණමිතික සේවය:

මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ දිවයින පුරා සිටින විකිරණ ආශ්‍රිතව සේවය කරන වෘත්තිකයන්ට විකිරණ ආරක්ෂණ පිළිබඳ සහතික වීමය.

ශ්‍රී ලංකාවේ භාවිත වන විකිරණ ආරක්ෂණ රෙගුලාසි වලට අනුව විකිරණශීලී ද්‍රව්‍ය හා විකිරණ භාවිතා කරන්න්නන් හට සිදු විය හැකි විකිරණ අවශෝෂකයන් මැන ගැනීම අත්‍යාවශ්‍ය කරුණකි. සාමාන්‍ය විද්‍යාත්මක සේවා අංශය මගින් දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි පුද්ගල විකිරණමිතික සේවය ක්‍රියාත්මක කරයි.



*4.2: ස්වයංක්‍රීය සංදීප්තතා මාපක කියවනය*

විකිරණමිතික සේවය මගින් මාසිකව හා ද්විමාසික වශයෙන් වරකට පුද්ගලයින් 900 කගේ පමණ විකිරණ අවශෝෂණයන් පරීක්ෂා කරන අතර මේ සඳහා භාවිතා කරන තාක්ෂණික උපකරණ වන්නේ තාප සංදීප්ත විකිරණමිතික මානයයි .

මෙම සේවාව සිදු කෙරෙන විද්‍යාගාරය සඳහා වර්ෂ 2014 දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ISO 17025:2005 ට අනුකූල ප්‍රතීතන සහතිකය ලබා ඇත.

**පුහුණු කිරීම** : තත්ව පාලන පද්ධති අනුව පුද්ගල විකිරණමිතික සේවා අංශයේ නිළධාරීන්ට පුහුණුවක් ලබා දී ඇත.

## 4.5. පාරිසරික විකිරණශීලීතාව මැනීමේ වැඩසටහන 2014:

### 4.5.1 විකිරණශීලීතාවේ පාදම දත්ත මැනීම

**විකිරණශීලීතාවේ පාදම දත්ත ලබාගැනීම සඳහා පරිසර විකිරණශීලීතාව මැනීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය විකිරණ ආරක්ෂණ අංශය හා ජෛව විද්‍යාත්මක අංශය හා සහයෝගීව සිදුකරන ලදී. 2014 වර්ෂය තුලදී පරිසරයේ විකිරණ මාත්‍රා සීග්‍රතාවයන් සහ පාරිසරික සාම්පල (තණකොළ සහ පස්) ස්ථාන 67 ක දී ලබාගන්නා ලදී. 2014 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකාවේ විවිධ ස්ථාන 321 ක විකිරණ මාත්‍රා සීග්‍රතාවය සහ පාරිසරික සාම්පල් එකතු කිරීම සිදු කරන ලදී. (මුළු දිවයිනම ආවරණය වන පරිදි පාරිසරික දත්ත 400 ක් ලබාගැනීමට තීරණය කර ඇත.)**

**මෙම දත්ත විදහා දැක්වීම සඳහා පරිගණක මෘදුකාංගයක් නිපදවන ලදී.**

**ස්ථාන 224 කින් ලබාගන්නා ලද පස් හා තණකොළ සාම්පල වල ගැමා වර්ණාවලි විශ්ලේෂණ දත්ත ලබාගැනීම අවසන් කර එම දත්ත පරිගණක මෘදුකාංග මගින් විදහා දක්වයි.**




*රූපය. 4.3: ශ්‍රී ලංකාවේ කළ කරන ලද පෙදෙස් මගින් සාමාන්‍ය ගැමා විකිරණ මාත්‍රා විදහා දක්වයි..*

### 4.5.2. ස්ථානීය ගැමා වර්ණාවලි මැනීම




සාමාන්‍ය විද්‍යාත්මක අංශය මගින් පාදම දත්ත ලබාගැනීම සඳහා තාක්ෂණික සහාය සහ විශේෂඥ දැනුම ලබාදෙන අතර ජාත්‍යන්තර පරමාණු බලශක්ති ඒජන්සිය තාක්ෂණික නිර්දේශය (TECDOC-1092) ට අනුකූලව උපකරණ ක්‍රමාංකනය, දත්ත එක්රැස් කිරීම යනාදිය සිදු කරන ලදී.

*රූපය 4.4: ශ්‍රී ලංකාවේ ස්ථානීය ගැමා විශ්ලේෂණ 100 ක් සිදු කරන ලදී.*

### 4.5.3 ශ්‍රී ලංකාවේ රේඩෝන් වායුව මැනීමේ වැඩසටහන

රේඩෝන් වායුව මැනීමේ වැඩසටහන ජපානය Nuclear Institute of Radiological Science (NIRS) සහ ටෝකියෝ විශ්ව විද්‍යාලයේ උපකාර ලැබුණු අතර මූලික අධ්‍යාපන ආයතනය සමඟ සහයෝගයෙන් සිදු කරන ලදී.මෙම වැඩසටහන ශක්තිමත්ව කරගෙන යාම සඳහා ටෝකියෝ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ටකාසි ඉමතෝ මහතා 2014 දෙසැම්බර් මස 10 සිට 12 අතර ලංකාවට පැමිණෙන ලදී.

ලංකාවේ දකුණු පළාත ආවරණය වන පරිදි නිවාස අභ්‍යන්තර හා පිටත රේඩෝන්/ තෝරෝන් මැනීම සම්පූර්ණ කර ඇත. නිවාස පිටත රේඩෝන් / තෝරෝන් මට්ටම මැනීම ස්ථාන 47 ක සිදු කරන අතර ඒ සඳහා Cr- 39 අනාවරකය ටෝකියෝ විශ්ව විද්‍යාලය මඟින් සපයන ලදී.
නිවාස අභ්‍යන්තර රේඩෝන් මට්ටම නිවාස 47 ක සිදු කරන ලද අතර ඒ සඳහා ඇල්ෆා ඉරි අනාවරකය ජාත්‍යන්තර පරමාණු බලශක්ති ඒජන්සිය මඟින් සපයන ලදී.



*රූපය 4.5: නිවාස අභ්‍යන්තර හා පිටත රේඩෝන් සහ තෝරෝන් මැනුම් සිදු කරන ස්ථාන*

වාතයේ ජලයේ සහ පසේ රේඩෝන්/තෝරෝන් මට්ටම් මැනීම සඳහා RAD7 ක්‍රියාකාරී ක්‍රමය සහිත රේඩෝන් මැනීමේ උපකරණය ඒ සඳහා අවශ්‍ය අනෙකුත් මෙවලම් සමඟ මිලදී ගන්නා ලදී.මෙම උපකරණය පාවිච්චි කිරීම විදහා දැක්වීම සඳහා DURRIDGE සමාගමේ සභාපති ඩෙරක් ලේන් ස්මිත් මහතා දින 3ක වැඩමුළුවක් පවත්වන ලදී. ඉහත උපකරණය මඟින් නිවාස අභ්‍යන්තර රේඩෝන්/තෝරෝන් මැනීම මධ්‍යම පළාතේ නිවාස සිදු කරන ලදී.

# 5. නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය



*රූපය . 5.1: නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය විවෘත කිරීම*

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යෂ්ථානය ස්ථාපනය කිරීම

නිර්විනාශක පරීක්ෂණ සඳහාම වෙන්වුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය 2011 වසරේ දී දියත් කරන ලදී. මෙහි ව්‍යාපෘති වටිනාකම රුපියල් මිලියන 500 කි.

එහි ප්‍රතිපලයක් ලෙස 2014 වසරේ ඔක්තොම්බර් මස 14 වන දින නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය උත්සවාකාරයෙන් විවෘත කර එහි වාණිජ කටයුතු සඳහා මුල පිරුණි. කලාපයේ අනෙකුත් නිර්විනාශක පරීක්ෂණ සේවා සපයන්නන් හා තරඟකාරී අන්දමින් අන්තර්ජාත්කව පළිගත් ප්‍රමිත්න්ට අනුකූලව ගොඩනඟන ලද, ප්‍රතීතකරණයට ලක්වූ විද්‍යාගාර සහ ඉහල ප්‍රමිතියකින් යුත් විද්‍යාගාර උපකරණ සහිතව නිර්විනාශක පරීක්ෂණ සේවා කාර්මික ක්ෂේත්‍රයට දායාද කිරීමේ අරමුණ ඇතිව මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ කටයුතු සැළසුම් කරන ලදී.

මෙම මධ්‍යස්ථානය පිහිටුවීම මඟින් නිර්විනාශක පරීක්ෂණ ක්ෂේත්‍රය වඩාත් ශක්තිමත් ලෙස කාර්මික ක්ෂේත්‍රයේ ගුණාත්මක බව සහ ඵලදායීතාවය ඉහල නැංවීමට දායක කරගත හැකිවනු ඇත.
මෙම මධ්‍යස්ථානය පිහිටුවීම මඟින් නිර්විනාශක පරීක්ෂණ ක්ෂේත්‍රය තුල සැපයිය හැකි තාක්ෂණික සේවාවන් සමහරක් මෙසේය.

විකිරණ රේඛ පරීක්ෂාව (RT), අති ධ්වනි තරංග පරීක්ෂාව (UT), චුම්භක අංශු පරීක්ෂාව (PT), වර්ණක ද්‍රාව විදුම් පරීක්ෂාව, සුළි ධාරා පරීක්ෂාව, කාන්දු පරීක්ෂාව, දෘෂ්‍ය පරීක්ෂාව, ශබ්ද විමෝචන පරීක්ෂාව (NT), කම්පන පරීක්ෂාව, ආතති පරීක්ෂාව, තාප විමෝචන පරීක්ෂාව,ඩිජිටල් විකිරණ රේඛ පරීක්ෂාව, ටෝමොග්‍රෆි, පාරධ්වනි පරීක්ෂාව හා ගොඩනැඟිලි ඉදිකිරීම් ස
ඉහත සඳහන් සියළුම ක්ෂේත්‍රයන් ඔස්සේ නිර්විනාශක පරීක්ෂකවරුන් පුහුණු කිරීම, ඔවුන්ට යෝග්‍යතා සහතික නිකුත් කිරීම සහ ඔවුන්ව ජාත්‍යන්තරව පිළිගත් සහතික කරණයට ලක් කිරීම මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ තවත් එක් අරමුණකි.
නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය මඟින් එහි ක්‍රියාකාරකම් පහත දැක්වෙන ප්‍රධාන දිශා තුන ඔස්සේ දියත් කරනු ලබයි.

- මිනිස් බලය සංවර්ධනය කිරීමේ වැඩසටහන
- සේවා සැපයීම
- පර්යේෂණ හා සංවර්ධනය

## 5.1. මිනිස් බලය සංවර්ධනය කිරීමේ වැඩසටහන :

විවිධ නිර්විනාශක පරීක්ෂණ විධික්‍රම යටතේ වාර්ෂික පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. එහි ප්‍රතිපලයක් ලෙස පසුගිය වසර කිහිපය තුල රටතුල පුහුණුව ලැබූ නිර්විනාශක පරීක්ෂකවරුන්ගේ ප්‍රමාණය ඉහල ගොස් ඇත. එයට අමතරව රාජ්‍ය හා පුද්ගලික ආයතන ඔවුන්ගේ ආයතන තුලම නිර්විනාශක පරීක්ෂණ පහසුකම් පිහිටුවාගෙන ඇත. තවද මෙම වැඩසටහන යටතේ සාර්ථකව පුහුණුව නිම කරන්නන්හට අන්තර්ජාතිකව පිළිගත් සහතික පත්‍රයක් පිරිනමන බැවින් මෙම ක්ෂේත්‍රයේ පුහුණුව ලද ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථාව ද නිර්මාණය වී ඇත.

මෙම වැඩසටහන යටතේ පුහුණු පාඨමාලා ISO 9712 ප්‍රමිතියට අනුකූලව ද නිර්විනාශක පරීක්ෂකවරුන් සහතික කරණය කිරීම ISO 17024 ප්‍රමිතියට අනුකූලව ද සිදුකරනු ලබයි. 2014 වසර තුල නිර්විනාශක පරීක්ෂණ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා පුද්ගලයින් 266 දෙනෙකු සහභාගී වී ඇත. තවද නිර්විනාශක පරීක්ෂණ ක්ෂේත්‍රයේ නිරත වන පුද්ගලයින් 36 දෙනෙකු 2014 වර්ෂය තුල විවිධ ක්‍රම/අංශ ඔස්සේ සහතික කරණයට ලක්ව ඇත. 2014 වසර තුල මෙම නිර්විනාශක පරීක්ෂණ වැඩසටහන් තුලින් උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 4.6 (බදු රහිතව) ක් පමණ වේ.




*රූපය 5.2: 2014 වර්ෂය තුල පුහුණු පාඨමාලා වැඩමුළු සහ නැවත සිදු පවත්වන ලද පරීක්ෂණ*




*රූපය 5.3: 2014 වර්ෂය තුල පුහුණු පාඨමාලා වැඩමුළු සහ නැවත සිදු පවත්වන ලද පරීක්ෂණ සහ සහතික කිරීම් තුලින් ලද ආදායම*

## 5.2. නිර්විනාශක පරීක්ෂණ සේවා සැපයීම :

කාර්මික ක්ෂේත්‍රයේ පද්ධති වලට නිර්විනාශක පරීක්ෂණ සේවා සිදුකිරීම තුලින් ඒවායේ දෝෂ/පළුදු හඳුනාගනිමින් ඒවායේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමත් එමඟින් ඵලදායීතාවය ඉහළ නැංවීමත් සිදුවෙයි. 2014 වර්ෂය තුළ මෙම මධ්‍යස්ථානය මඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වෙත නිර්විනාශක පරීක්ෂණ සේවා 160 ක් සිදු කරමින් රුපියල් මිලියන 5.9 ක (බදු රහිතව) පමණ ආදායමක් උපයා ඇත.

.




*රූපය 5.4: 2014 වර්ෂය සඳහා සපයන ලද නිර්විනාශක පරීක්ෂණ*




2014 වර්ෂය සඳහා නිර්විනාශක පරීක්ෂණ මඟින් උපයන ලද මුළු ආදායම (බදු රහිතව)
රු. 10,490,024.56




*රූපය 5.6: 2014 වර්ෂය තුල නිර්විනාශක පරීක්ෂණ මඟින් ලද මුළු ආදායම*

## 5.3 සංවර්ධන වැඩසටහන්

### 5.3.1. තත්ව කළමණාකාරණ ඒකකයේ ක්‍රියාකාරකම්

#### 5.3.1.1. නිර්විනාශක පරීක්ෂකවරුන් සහතිකරණයට ලක්කිරීමේ ඒකකයෙහි (CBNDT) හි තත්ව පාලනය සම්බන්ධ ක්‍රියාකාරකම්

- 2014 ජූලි 01 හා 02 යන දෙදින තුල තත්ව පාලන ඒකකයේ වාර්ෂික අභ්‍යන්තර විගණනය සිදු කෙරිණි.
- තාක්ෂණ උපදේශණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්විණි
- නිර්විනාශක පරීක්ෂකවරුන් සහතිකරණයට ලක්කිරීමේ ඒකකයෙහි ධජය හා නව සහතික පත්‍රයේ ආකෘතිය හඳුනා ගැණිනි.
- නිර්විනාශක පරීක්ෂක වරුන් 36 දෙනෙකුට විවිධ ක්‍රම ඔස්සේ සහතික කරණයට ලක්විණි.
- CBNDT හි අයදුම් පත්‍ර ගාස්තු අයකිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.
- ET- Level 1, PT-Level 2, RT-Level 1, RT- Level 3 සහ MT- Level 1විභාග දෙකක් වන පරිදි විභාග / පරීක්ෂණ 07 ක් පැවැත්විණි.

- ISO/ IEC 17024: 2012 ප්‍රමිතිය ඔස්සේ CBNDT ප්‍රමිතිකරණයට ලක්කිරීම සඳහා නව අයදුම් පත්‍රය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. එයට සමගාමීව CBNDT හි අනෙකුත් ලියවිලි ද සංශෝධනය කරන ලදී.

- ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් 2014 නොවැම්බර් මස 17,18 සහ 24 යන තෙදින තුල තක්සේරු කිරීමේ වැඩසටහන පැවැත්විණි.

- නිර්විනාශක පරීක්ෂකවරුන්ගේ යෝග්‍යතා පරීක්ෂණ තක්සේරු කිරීමේ වැඩසටහනක් 2014 දෙසැම්බර් මස 30 සහ 31 යන දෙදින තුල ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරිණි.

5.3.1.2. Inspection Body හි තත්ව කළමණාකරණය සම්බන්ධ ක්‍රියාකාරකම්

- ISO 17020: 2012 ප්‍රමිතියට අනුකූලව අදාළ ලියකියවිලි සංශෝධනය කෙරිණි.

- IB ප්‍රතීතකරණයට ලක්කිරීමට අදාල අයදුම් පත්‍රය ISO 17020: 2012 ප්‍රමිතියට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරිණි.

- නව SOP බොහොමයක් පිළියෙල කෙරිණි..

5.3.2. Boiler and Pressure Vessel Safety Management ඒකකයේ ක්‍රියාකාරකම්

- Boiler අයිතිකරුවන් සහ Boiler නිෂ්පාදකවරුන් ඇතුලත් දත්ත සංචිතයක් ගොඩනගන ලදී.
- Ceylinco Insurance (PLC) හි ඉංජිනේරුවන් උදෙසා දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කෙරිණි.
- ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ වලට සහභාගිවෙමින් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්විණි.

5.3.3. Welder Qualification Programme

- නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථාන පරිශ්‍රය තුල “Welder Qualification Facility” වලට අදාළ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කෙරිණි.
- මෙයට අදාළ උපකරණ සහ අනෙකුත් උපාංග මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකෙරිණි.

5.3.4. Concrete Testing

- Concrete Testing සේවා 09 ක් සැපයිණි.

# 6. විකිරණ පිරිසැකසුම් ඒකකය

පරමාණුක ශක්ති අධිකාරියෙහි කර්මාන්ත යෙදවුම් අංශය යටතේ ක්‍රියාත්මක වන විකිරණ පිරිසැකසුම් ඒකකයේ කාර්යයන් අතර ප්‍රධානත්වය යොමු කෙරෙනුයේ ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනය (IAEA) හා පරමාණුක ශක්ති අධිකාරියේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් යටතේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වල නියැලීම වේ.

1. **විකිරණ පිරිසැකසුම් ඒකකයේ ප්‍රධාන අරමුණු:**

   1. පාරිසරික, සෞඛ්‍ය, කෘෂි කර්මාන්තය ඇතුළු අනෙකුත් කර්මාන්ත ආදී විවිධ ක්ෂේත්‍රන්හි දී භාවිතයට ගැනෙන හානිකර අපද්‍රව්‍යයන්ගෙන් තොර නව නිෂ්පාදනයන් විකිරණ පිරිසැකසුම් තාක්ෂණික ක්‍රමවේදයන් උපයෝගී කරගනිමින් නිපදවීම.

2. පාරිසරික, කෘෂිකර්මාන්ත, සෞඛ්‍ය සහ අනෙකුත් කර්මාන්ත ආශ්‍රිත පර්යේෂණ ආයතනයන් සම්බන්ධ වෙමින් ඒවායේ සහයෝගයන් ඇතිව ක්ෂේත්‍ර අධ්‍යයනයන් ආශ්‍රිත පර්යේෂණ සිදුකිරීම මගින් නිපැයුම් වල තත්වයන් වැඩි දියුණු කිරීම.

**2. දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්**

වර්තමානයේ ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනය යටතේ කලාපීය සහයෝගීතා එකඟතාවය (IAEA/RCA) මත ක්‍රියාත්මක ව්‍යාපෘතියක් හා කලාපීය සහයෝගීතා එකඟතාවය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (RCA/UNDP) යටතේ ක්‍රියාත්මක එක් ව්‍යාපෘතියක් මෙම ඒකකය යටතේ ක්‍රියාත්මක වේ.

2.1 ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය යටතේ කගාපීය සහයෝගීතා එකඟතාවය (IAEA/RCA) මත ක්‍රියාත්මක වන විකිරණ බද්ධ කිරීමේ තාක්ෂණය උපයෝගී කරගනිමින් කර්මාන්ත යෙදුම් හා පාරිසරික ආරක්ෂණය සඳහා උසස් තත්වයේ (Radiation Grafted Product) නිෂ්පාදනයන් හදුන්වා දීමේ ව්‍යාපෘතිය (RAS/1/014)

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ විකිරණ පිරිසැකසුම් තාක්ෂණය උපයෝගී කරගනිමින් උසස් තත්වයේ විකිරණ උපයෝගී කරගනිමින් බහු අවයවීකයනට බද්ධ කිරීම් සිදු කොට,

1. කෘෂිකාර්මික කටයුතු සඳහා වැදගත් වන අවශෝෂිත ජලය සෙමින් මුදා හැරිය හැකි ප්‍රබල ජල අවශෝෂක (Super Water Absorbent) නිපදවීම හා එමගින් කෘෂි ක්ෂේත්‍රය තුල දී ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.
2. කෘෂි කාර්මික කටයුතු සඳහා වැදගත් වන අවශෝෂිත පොහොර සෙමින් මුදා හැරිය හැකි පොහොර අවශෝෂක ද්‍රව්‍යයන් නිපදවීම හා එමගින් කෘෂි ක්ෂේත්‍රය තුල පොහොර අරපිරිමැස්මෙන් භාවිතා කිරීමේ ක්‍රම වේදයක් සැකසීම.
3. පාරිසරික සංරක්ෂණ කාර්යයහිදී පරිසරයට එකතු වන විෂ හා හානිකර වූ අපද්‍රව්‍යයන් ඉවත් කිරීම සඳහා උපයෝගී කරගනු ලබන බැරලෝහ අවශෝෂකයන් මෙන්ම අපද්‍රව්‍යක් ලෙස ජලයට එකතු වන තෙල් වර්ග අවශෝෂණය කොට ඉවත් කල හැකි අවශෝෂකයන් නිපදවීම හා එතුලින් රටතුල හරිත පරිසරයක් නිර්මාණය කරලීම උදෙසා දායකත්වය සැපයීම.
4. කර්මාන්ත ක්ෂේත්‍රයේ දී අපද්‍රව්‍යයන් ලෙස බැහැර කරන සායම් වර්ග, බැර ලෝහ

   අයන, රසායනික සංකීර්ණ ආදිය වෙන් කර ගැනීමට සහ ඒවා නැවත භාවිතා කිරීමට වැදගත් වන සහ උපයෝගී කර ගත හැකි තුනී පටල ස්වරූපයේ හෝ ජෙලයක් ආකාරයේ හෝ කෙඳි ස්වරූපයේ හෝ දෙමුහුම් ආවරණ ස්වරූපයක් සහිත අවශෝෂක ද්‍රව්‍යයන් නිපදවීම සහ එමගින් අපද්‍රව්‍ය කළමණාකරණයට මෙන්ම පරිසර සංරක්ෂණයට ද දායකත්වයක් සැපයීම.

**2.1.1. විකිරණ තාක්ෂණය උපයෝගී කර ගනිමින් ප්‍රබල ජල අවශෝෂකයක් හා අවශෝෂිත පොහොර සෙමින් මුදා හැරිය හැකි පොහොර අවශෝෂකයක් නිපදවීමේ පර්යේෂණය:**

විකිරණ තාක්ෂණය උපයෝගී කර ගනිමින් බද්ධයන් සිදු කරමින් සැකසෙන ප්‍රබල ජල අවශෝෂකයට එය අවශෝෂනය කරගත් ජලය සෙමින් මුදා හැරීමේ හැකියාව ඇති බැවින් තද ඉඩෝරයන් සහිත වියළි ප්‍රදේශයන්හි කෘෂි කාර්මික කටයුතු සඳහා අවශ්‍ය කරන ජලය ඵලදායී ලෙස කළමනාකරණය කරගත හැකිවන අතර, එම ප්‍රදේශයන්හි පවතින ජල හිඟය සඳහා ද පිළියමක් වනු අත. එමෙන්ම එම නිෂ්පාදන භාවිතා කිරීමේ දී වගාව සඳහා ජලය යෙදිය යුතු වාර ගණන අඩු වීමෙන් කම්කරුවන් සඳහා වැය කළ යුතු පිරිවැය අවම වන අතර වගාවට අවශ්‍ය ජලය සඳහා වන පිරිවැය ද අවම කර ගත හැකි වනු ඇත. එමෙන්ම කාර්යය බහුල නාගරික පරිසරය තුල නිසි කලට ජලය යෙදීමට නොහැකිවීම හේතුවෙන් වන වගා හානිය ද වලක්වා ගත හැකි වනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ පරමාණුක ශක්ති අධිකාරියෙහි පර්යේෂණ කණ්ඩායම විසින් විකිරණ උපයෝගී කරගනිමින් ප්‍රබල ජල අවශෝෂකයක් නිපදවීමේ පර්යේෂණ ආරම්භ කර ඇති අතර අප රටේ එක් එක් ප්‍රදේශයන්හි පවතින දේශගුණික තත්වයන් සහ පසෙහි ස්වභාවය ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් එම ප්‍රබල ජල අවශෝෂකයෙහි ගුණාංගයන් වෙනස් කරමින්

පර්යේෂන හා සංවර්ධන කාර්යයන් සිදු කරනු ලබයි. එහිදී විශේෂයෙන් එළවළු වගාවට ප්‍රසිද්ධියක් දරණ කල්පිටිය ආශ්‍රිත ප්‍රදේශයන්හි පවතින ජල සම්පත හිඟ වූ වියළි කාලගුණ තත්වය හා ජලය රදාපැවතීම දුර්වල වූ වැලි බහුලව ඇති පස සැලකිල්ලට ගනු ලැබූ අතර ඒ අනුව වගාවට යොදනු ලබන ජලය ඉතා කෙටි කාලයක් තුලදී අවශෝෂනය කල හැකි ගුණාංගයන් සහිතව මෙම ප්‍රබල ජල අවශෝෂකයක් නිපදවීමේ පර්යේෂණ සිදු කරනු ලබයි.

ස්වභාවික බහු අවයවීකයක් වන මඤ්ෙඤාක්කා පිටි වලට විකිරණ තාක්ෂණය යොදා ගනිමින් ඇක්‍රිලික් අම්ලය බද්ද කිරීමෙන් මූලික වශයෙන් මෙම ප්‍රබල ජල අවශෝෂකයක් නිපදවීම සිදු කරනු ලබන අතර එහි ගුණාංගයන් වැඩිදියුණු කිරීම සඳහා විවිධ රසායනික ද්‍රව්‍යයන් අත්හදා බැලීමේ පර්යේෂණ සිදු කරනු ලබයි.

වෙනත් කෘතිම ජල අවශෝෂක පස තුල දිරාපත් වීමට බොහෝ කාලයක් ගතවන අතර එය පරිසරයට හානිදායක වේ. මෙම නිපැයුමේ ඇති එක ප්‍රධාන විශේෂත්වයක් වනුයේ එය සාපේක්ෂව පහසුවෙන් පස තුල දිරාපත්වීමයි. ඒ මගින් පරිසරයට සිදුවන හානිය අවම වනු ඇත.

එමෙන්ම අවශෝෂිත පොහොර සෙමින් මුදා හැරිය හැකි පොහොර අවශෝෂකයක් නිපදවීම සඳහා වන මූලික පරයේෂණ හා සංවර්ධන කටයුතු ඉදිරියේ දී ආරම්භ කිරීමට නියමිතය.

එමෙන්ම පරමාණුක ශක්ති අධිකාරියෙහි පර්යේෂණ කණ්ඩායම විසින් පර්යේෂණ සිදුකෙරෙන ඉහත සියළු නිෂ්පාදන වල සාර්ථක නියැදීන් කෘෂි ක්ෂේත්‍රයන්හි යෙදීම් සම්බන්ධ පර්යේෂණ කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

ස්වභාවික බහු අවයවීකයක් වන මඤ්ෙඤාක්කා පිටි වලට විකිරණ තාක්ෂණය යොදා ගනිමින් ඇක්‍රිලික් අම්ලය බද්ද කිරීමෙන් මූලික වශයෙන් මෙම ප්‍රබල ජල අවශෝෂකයක් නිපදවීම සිදු කරනු ලබන අතර එහි ගුණාංගයන් වැඩිදියුණු කිරීම සඳහා විවිධ රසායනික ද්‍රව්‍යයන් අත්හදා බැලීමේ පර්යේෂණ සිදු කරනු ලබයි.

වෙනත් කෘතිම ජල අවශෝෂක පස තුල දිරාපත් වීමට බොහෝ කාලයක් ගතවන අතර එය පරිසරයට හානිදායක වේ. මෙම නිපැයුමේ ඇති එක ප්‍රධාන විශේෂත්වයක් වනුයේ එය සාපේක්ෂව පහසුවෙන් පස තුල දිරාපත්වීමයි. ඒ මගින් පරිසරයට සිදුවන හානිය අවම වනු ඇත.

එමෙන්ම අවශෝෂිත පොහොර සෙමින් මුදා හැරිය හැකි පොහොර අවශෝෂකයක් නිපදවීම සඳහා වන මූලික පරයේෂණ හා සංවර්ධන කටයුතු ඉදිරියේ දී ආරම්භ කිරීමට නියමිතය.

එමෙන්ම ප

රමාණුක ශක්ති අධිකාරියෙහි පර්යේෂණ කණ්ඩායම විසින් පර්යේෂණ සිදුකෙරෙන ඉහත සියළු නිෂ්පාදන වල සාර්ථක නියැදීන් කෘෂි ක්ෂේත්‍රයන්හි යෙදීම් සම්බන්ධ පර්යේෂණ කටයුතු කෘෂිකර්මදෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.



*රූපය .6.1: පරීක්ෂාවට ලක්කරෙන ප්‍රබල ජල අවශෝෂකයක්*

### 2.1.2 නොවියන ලද කෘතිම බහු අවයවීක පටලයන් ඇසුරෙන් නිපදවෙන රසායනික අවශෝෂක

මිනිසාගේ නොයෙකුත් ක්‍රියාකාරකම් හේතුවෙන් කැඩ්මියම්, ඊයම්, තඹ, ආසනික් ආදී බැර ලෝහ පරිසරයට එකතු වන අතර විශේෂයෙන් ජලය සහ අනෙකුත් මිනිස් පරිභෝජනයට ගනු ලබන දෑ සඳහා එකතුවීම තුලින් මිනිසාගේ සෞඛ්‍යට දැඩි තර්ජනයක්ව පවතී. මේවන විට ද අපරට තුල වකුගඩු රෝගයන් සීග්‍රයෙන් පැතිර යන අතර එය ඉහත බැර ලෝහ පරිසරයට එකතු වීම හේතුවෙන් ඇති වන්නක් බවට අනුමාන කෙරේ. විශේෂයෙන්ම එම ප්‍රදේශයන්හි පානීය ජලයේ බොහෝ ලෝහ ලවන වර්ග අන්තර්ගත වන අතර නිසි පිරිසිදු කිරීමේ ක්‍රියාවලියකින් තොරවම එම ප්‍රදේශයන්හි ජනයා එම ජලය පරිභෝජනය කරති.

මෙම පානීය ජලයේ ඇති ලෝහ ලවන වර්ග ඉවත් කිරීම සඳහා එක් තාක්ෂණ ක්‍රමවේදයක් ලෙස ලවන වර්ග අධිශෝෂණය කර ගතහැකි පරිදි විකිරණ පිරිසැකසුම් තාක්ෂණය මඟින් බද්ධ කර සකස් කර ගනු ලබන කෘතිම බහුඅවයවීක පටල පෙරනයන් යොදාගැනීමට ඇති හැකියාව සම්බන්ධව මෙම පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි.මෙම පර්යේෂණ කටයුතු මූලික වශයෙන් නොවියන ලද ප්‍රොපිලීන්/ පොලි එතිලීන් බහු අවයවීකය පටලයන් හා ඒකානුක

ඇක්‍රිලික් අම්ලය යොදා ගනිමින් විකිරණ පිරිසැකසුම් තාක්ෂණයෙන් බද්ධ කර කැටායන අධිශෝෂණය ගුණයන්ගෙන් යුක්ත වූ පටලය සකස් කර ගනු ලබන අතර එම බද්ධ කරනු ලැබූ පටලයන් යොදාගනිමින් ජලය තුල ඇති කොපර් ($Cu^{2+}$) ඉවත් කිරීමට ඇති හැකියාවන් සම්බන්ධ මූලික පර්යේෂණ සිදු කරනු ලබයි. අවසානයේ මෙම තාක්ෂණය ජල පෝෂක තුල පවතින කැටායනයන් ඉවත් කිරීමට ඇති සාර්ථකත්වය සම්බන්ධ පර්යේෂණ සිදුකිරීමට බලාපොරොත්තු වේ.

එමෙන්ම යොදාගනු ලබන ඒකානුකයන් වෙනස් කරමින් සායම් වර්ග, අපද්‍රව්‍ය බැහැරවන තෙල් වර්ග හා අනෙකුත් රසායන වර්ග අධිශෝෂණය සඳහා ද මෙම පර්යේෂණයන් තවදුරටත් පුළුල් පරාසයකට යොමු කිරීමට ඉදිරියේදී බලාපොරොත්තු වේ.

### 2.2.3 කයිටොසාන් ස්වභාවික බහු අවයවීක ව්‍යුත්පන්නය පටලයක් ඇසුරෙන් නිපදවෙන හානිකර වූ බැර ලෝහ අවශෝෂක

ලොව සුලභවම පවතින ස්වභාවික බහුඅවයවීකය සෙලියුලෝස් වන අතර සියළු වෘක්ෂලතාවන් සකස් වී ඇත්තේ එම පදාර්ථය මූලික කරගනිමිනි. දෙවනුව ඇත්තේ කයිටීන්ය. එය ඉස්සන්, කකුළුවන් හා දැල්ලන් ආදී කවච ගනයට අයත් සතුන් තුල අන්තර්ගත වේ. මෙම කයිටීන් රසායනික ප්‍රතික්‍රියාවන්ට භාජනය කොට කයිටොසාන් නැමති බහු අවයවීක ව්‍යුත්පන්නය සකස්කරගනී. ඉහත භාවිතා කරන ලද කෘතිම බහු අවයවීක මෙන් නොව මෙය ස්වභාවික බහු අවයවීක ව්‍යුත්පන්නයක් වන අතර එය පරිසරය තුලදී පහසුවෙන්ම දිරාපත්වීමට ලක්වන බැවින් පරිසර හිතකාමී වේ. මෙම පරිසර හිතකාමී ස්වභාවික බහුඅවයවීක ව්‍යුත්පන්නය යොදා ගනිමින් ඉහත 2.1.2 හි පරිදිම ඒකානුක ඇක්‍රිලික් අම්ලය හෝ වෙනත් ඒකානුකයක් යොදාගනිමින් විකිරණ පිරිසැකසුම් තාක්ෂණයෙන් බද්ධ කර බැර ලෝහ කැටායන අධිශෝෂක ගුණයන්ගෙන් යුක්ත වූ පටලය සකස් කර ගත හැක. ඒවා පහසුවෙන් දිරාපත් වන බැවින් පරිසර හිතකාමී ගුණයෙන් යුක්ත වේ. එම අධිශෝෂකයන්ද බැර ලෝහ, විෂ රසායනයන් ආදී අහිතකර දෑ අධිශෝෂණය මගින් ඉවත් කරලීම සම්බන්ධ පර්යේෂණ සඳහා යොදා ගනු ලබයි.



*රූපය .6.2 -බද්ධයන් සිදුකර නොමැති කයිටොසාන් පටල*



*රූපය .6.3- $Cu^{2+}$ ලෝහ අයන අධිශෝෂිත විකිරණ තාක්ෂණික බද්ධයන් සිදු කරන ලද කයිටොසාන් පටල*

### 2.2. ජාත්‍යන්තර පරමාණු බලශක්ති ඒජන්සිය යටතේ කලාපීය සහයෝගීතා එකගතාවය (IAEA/ RCA) මත ක්‍රියාත්මක වන ස්වභාවික බහු අවයවීකයන් (කයිටීන්/ කයිටොසාන්) විකිරණ පිරිසැකසුම් තාක්ෂණය උපයෝගී කරගනිමින් බහු අවයවීක බිදලීමෙන් නව නිෂ්පාදනයන් බිහිකරලීමේ ව්‍යාපෘතිය (RAS/8/109)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ විකිරණ තාක්ෂණය උපයෝගී කරගනිමින් ස්වභාවික බහු අවයවීක දාමයන් බිදලමින් කෙටි දාම බවට පරිවර්තනය කර එම කෙටි දාමයන් හා ඒවාහි ව්‍යුත්පන්නයන්ගේ ගුණාංගයන් අනුව විවිධ විවිධ කෘෂිකාර්මික යෙදීම් සඳහා භාවිතා කිරීමයි.

ලොව දෙවනුවට සුලභවම පවතින ස්වභාවික බහු අවයවීකය වන කයිටීන් ඉස්සන්, කකුළුවන්, දැල්ලන් ආදී කවච ගණයට අයත් සතුන් තුල අන්තර් ගත වන අතර, මෙම කයිටීන් රසායනික ප්‍රතික්‍රියාවන්ට භාජනය කොට කයිටීන් නැමති බහු අවයවීක ව්‍යුත්පන්නය සකස් කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පරමාණුක ශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ කලාපීය සහයෝගීතා ගිවිසුම යටතේ අනුග්‍රහය දක්වයි.

ඉහත ව්‍යාපෘතිය යටතේ විකිරණ පිරිසැකසුම් ඒකකයේ පර්යේෂණ කණ්ඩායම විසින් මෙම කයිටොසාන් නැමති බහු අවයවීක ව්‍යුත්පන්නය යොදාගනිමින් එය විකිරණ තාක්ෂණය මගින් එක්

එක් පරාසයන්ට අයත් වන දිගවල් සහිත කෙටි දාම බවට බිඳලමින් එම කෙටි දාමයන් හා ඒවා රසායනික වශයෙන් නවීකරණය කරන ලද ව්‍යුත්පන්නයන් කෘෂි ක්ෂේත්‍රයෙහි විවිධ මට්ටම් වල පර්යේෂණ කටයුතු සඳහා යොදා ගැනීම පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගන්නොරුව උද්‍යාන බෝග වගා පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත නිකුත් කරනු ලැබීය.




රූපය 6.4: කයිටො පවර් පැකේජය

ඉහත පර්යේෂණයන්ගේ සාර්ථක ප්‍රතිඵලයන් ලෙස මේ වන විට නව නිපැයුම් දෙකක් එළි දැක්වී ඇති අතර ඒවා කයිටො පවර්- 1 යනු ශාඛ වර්ධනයට හා ලෙඩ රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩ දියුණු කල හැකි ඔලිගො කයිටොසාන් පරාසයේ නිපැයුමක් වන අතර කයිටො පවර් -2 යනු ශාඛ වලට හානි කර ක්ෂුද්‍ර ජීවීන් මර්ධනය කල හැකි ප්‍රබල ශාඛ ආරක්ෂා නිපැයුමක් වේ. මෙම කයිටො පවර්- 1 හා කයිටො පවර් - 2 නව නිපැයුම් යොදා ගැනීම තුලින් නිරෝගී ශාඛ වර්ධනයක් හා ඉහල අස්වැන්නක් ලබාදෙන අතර එය දැනට භාවිතා කෙරෙන බැර ලෝහ හා අනෙකුත් විෂ රසායනයන් අඩංගු ශාඛ වර්ධකයන්ට හා දිලීර/ බැක්ටීරියා නාශකයන්ට හොඳ විකල්ප විසඳුමක් වනු ඇත.

මෙම කයිටො පවර් නව නිපැයුම යොදාගනිමින් තක්කාලි, මාළු මිරිස්, කරවිල ආදී විවිධ එළවළු වර්ග මෙන්ම ගොටුකොළ, මුකුණුවැන්න ආදී පලා වර්ග සඳහා ද පර්යේෂණ සිදු කර දැනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත සමාන නිෂ්පාදනයන් හා සමාන මට්ටමේ වූ සාර්ථක ප්‍රතිඵලයන් අත්කරගෙන ඇත.එමෙන්ම මෙම කයිටො පවර් නව නිපැයුම යොදා ගනිමින් ෆාදර් ලෝන් නැමති කොස් විශේෂයේ ඇට තවන් කිරීම හා බද්ධ කිරීමේ පර්යේෂණ සිදු කර ඇත. මෙම නිෂ්පාදන දැනට භාවිතා කරනු ලබන ක්‍රමවේදයන්ට සාපේක්ෂව දෙගුණයක සාර්ථකත්ව වර්ධනයක් පෙන්නුම් කර ඇත. එනම් දැනට භාවිතා කරනු ලබන ක්‍රමවේදයන්ට අනුව සාපේක්ෂව දෙගුණයක සාර්ථකත්ව වර්ධනයක් පෙන්නුම් කර ඇත. එනම් දැනට භාවිතා
කරනු ලබන ක්‍රමවේදයන්ට අනුව 40% ක සාර්ථකත්වයක් පෙන්නුම් කරන නමුත් එය කයිටො පවර් භාවිතයෙන් 80% ක් දක්වා වැඩි දියුණු විමක් පෙන්වයි.



රූපය.6.5: සාර්ථක ලෙස බද්ධ කරන ලද කොස් බීජ පැල




රූපය .6.6: කයිටොපවර් මඟින් ප්‍රතිකාර කර පලිබෝධ පාලනය කරන ලද තක්කාලි හා ගොටුකොළ

### 2.2.1. "සහසක් නිමැවුම් 2014" තරඟයෙන් ත්‍යාගයන් හිමිවීම

නව නිපැයුම් කරුවන්ගේ කොමිසම විසින් 2014 දෙසැම්බර් 16 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී "සහසක් නිමැවුම් 2014" තරඟය පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. එම තරඟය සඳහා විකිරණ පිරිසැකසුම් ඒකකය විසින් නිපදවන ලද කයිටො පවර් නව නිපැයුම ඉදිරිපත් කරන ලද අතර එහිදී විවෘත අංශයේ "පරිසර" තාක්ෂණ ක්ෂේත්‍රයෙන් ප්‍රථම ස්ථානය හිමි කර ගන්නා ලදී.



රූපය 6.6: "සහසක් නිමැවුම් 2014" හි දී පදක්කමක් ලබාගැනීම

### 2.2.2. ව්‍යාපෘතියේ අනාගත සැලැස්ම

- කයිටො පවර් සුළු වාණිජ පරිමාණයෙන් නිෂ්පාදනය කිරීමට අදාල පර්යේෂණ තවදුරටත් ක්‍රියාත්මක කිරීම.
- කයිටො පවර් සුළු වාණිජ පරිමාණයෙන් නිෂ්පාදනය සඳහා වන පිළිවෙත සකස් කිරීම.
- කයිටො පවර් ක්ෂේත්‍රයන්ට යෙදීමෙන් පසු ඉතිරිවන අවශේෂයන් විශ්ලේෂණය කිරීමේ පර්යේෂණ සිදු කිරීම.

**මධ්‍ය වාර සමාලෝචන රැස්වීම**

ජාත්‍යන්තර පරමාණු බලශක්ති ඒජන්සිය යටතේ කලාපීය සහයෝගීතා එකඟතාවය (IAEA/RCA) මත ක්‍රියාත්මක වන විකිරණ පිරිසැකසුම් තාක්ෂණය උපයෝගී කරගනිමින් කර්මාන්ත යෙදුම් හා පාරිසරික ආරක්ෂණය සඳහා උසස් තත්වයේ විකිරණ බද්ධ (Radiation Grafted) සංයෝග නිපදවීමේ ව්‍යාපෘතියෙහි (RAS/1/014) මධ්‍ය වාර සමාලෝචන රැස්වීම පරමාණු බලශක්ති ඒජන්සියේ නියෝජිතවරියගේ ප්‍රධානත්වයෙන් 2014 ජූනි මස 23 දින සිට 27 වන දින දක්වා වත්තල පෙගසස් රීෆ් හෝටලයේ දී පවත්වන ලදී. ඒ සඳහා රටවල් 20 ක නියෝජිතයන් සහභාගී වූ අතර එම සමාලෝචන රැස්වීම ශ්‍රී ලංකා පරමාණු ශක්ති අධිකාරියේ විකිරණ පිරිසැකසුම් ඒකකය විසින් සංවිධානය කරන ලදී. එහිදී 2012-2014 කාල පරිච්ඡේදය තුල මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකල ක්‍රියාකාරකම් හා ඒවාහි සාර්ථකත්වයන් සම්බන්ධව සාකච්ඡා කල අතර 2015 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ වන ඉදිරි සැලැස්ම සකස් කරන ලදී.

2.3 කලාපීය සහයෝගීතා එකඟතාවය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (RCA/UNDP) අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන ඉලෙක්ට්‍රෝන කදම්බ තාක්ෂණය (Electron Beam Technology) යොදාගනිමින් ආහාර හා කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන වල අගය වැඩිකරලීමේ හා ආසියා ශාන්තිකර කලාපය තුල පරිසරය අපවිත්‍ර කාරක සංයෝගයන් විනාශ කිරීම මඟින් පරිසරය සංරක්ෂණයට දායක වීමේ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ඉලෙක්ට්‍රෝන කදම්බ තාක්ෂණය උපයෝගී කරගනිමින් ආහාර හා කරමාන්ත හා ආශ්‍රිත නිෂ්පාදන වල තත්වයන් වැඩිදියුණු කොට අගය වැඩි කරලීම හා කර්මාන්ත ශාලාවලින් පරිසරයට නිකුත්වන විෂ දුම් හා අනෙකුත් අපවහනයන් ගෙන් පරිසරයට සිදුවන බලපෑම අවම කරලීම සම්බන්ධ දැනුම කලාපීය රටවල් අතර පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමයි.

2014 වර්ෂය තුල සිදුකරන ලද වැඩ කටයුතු :

- මෙම ව්‍යාපෘතිය යටතේ මූලික හා උසස් දැනුම ගුණාත්මක වැඩි දියුණු කිරීම සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ආසියා ශාන්තිකර කලාපය තුල පදාර්ථයන් සඳහා ඉලෙක්ට්‍රෝන කදම්බ තාක්ෂණය යොදාගැනීම පුහුණු පාඨමාලාවක් (RCA/UNDP) 2014 අප්‍රියෙල් මස 14 -25 කාලසීමාව තුල පවත්වන ලදී. ඒ සඳහා ව්‍යාපෘති කමිටු සාමාජිකයන් දෙදෙනෙකු සහභාගි විය.
- එමෙන්ම මෙම ව්‍යාපෘතිය යටතේ මූලික හා උසස් දැනුම සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ආසියා ශාන්තිකර කලාපය තුල ආහාර හා කෘෂි කාර්මික නිෂ්පාදන සඳහා

ඉලෙක්ට්‍රෝන කදම්බ තාක්ෂණය යොදාගනිමින් අගය එකතු කිරීමේ පුහුණු පාඨමාලාවක් (RCA/UNDP) 2014 ජූනි මස 16-20 කාලසීමාව තුල පවත්වන ලදී. ඒ සඳහා ව්‍යාපෘති සාමාජිකයන් දෙදෙනකු සහභාගි විය.

- 2014 අප්‍රියෙල් මස 29 වන දින, ජූලි මස 22 වන දින හා අගෝස්තු මස 27 යන දිනයන්හිදී, ඉහත පුහුණු පාඨමාලා සඳහා සහභාගි වූ සාමාජිකයන් තිදෙනා විසින් ඔවුන් එම පාඨමාලා තුලදි ලබා ගත් දැනුම අධිකාරියේ සියළු සාමාජිකයන් සමග බෙදා ගැනීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.
- 2014 නොවැම්බර් මස 12 වන දින, ඉලෙක්ට්‍රෝන කදම්බ තාක්ෂණය යොදාගැනීමේ ව්‍යාපෘතියට සම්බන්ධ පුහුණුව ලත් සාමාජිකයන් විසින් එම තාක්ෂණය සම්බන්ධව වැඩමුළුවක් පවත්වන ලදී. ඒ සඳහා ආහාර, කෘෂි කාර්මික හා අනෙකුත් කර්මාන්තයන් නියෝජනය කරමින් 40 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගි විය.

- තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද කරන ලද "දැයට කිරුළ" 2014 ජතික ප්‍රර්ශන වැඩසටහන 2014 පෙබරවාරි 22 දින සිට මාර්තු 02 වන දින දක්වා කුලියාපිටියේ දී පවත්වන ලද අතර "විද්‍යා සතිය" ප්‍රදර්ශන වැඩසටහන 2014 නොවැම්බර් 04 වන දින සිට 08 වන දින දක්වා කාර්මික තාක්ෂණ ආයතන
- පරිශ්‍රයේ දී පැවැත්වන ලදී. එහිදී ඉලෙක්ට්‍රෝන කදම්බ තාක්ෂණ හා එහි යෙදුම් සම්බන්ධව එම වැඩසටහන් වලට සහභාගි වූ පාසැල් සිසුන් සහ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.



රූපය 6.7: "විද්‍යා සතිය" ප්‍රදර්ශන වැඩසටහන

- ඉලෙක්ට්‍රෝන කදම්බ තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධ RCA/UNDP ව්‍යාපෘතියේ වාර්ෂික සමාලෝචන රැස්වීම 2014 නොවැම්බර් මස 19 හා 20 යන දෙදින තුල මියන්මාරයේ දී පවත්වන ලද අතර ඒ සඳහා ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාර ( )සහභාගි විය. එහිදී මෙම ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂය තුල ලැබූ සාර්තකත්වයන් සම්බන්ධව හා
- 2015 වර්ෂය සඳහා "කාර්යය සැලැස්ම" සකස් කිරීමේ කටයුතු සම්බන්ධව සාකච්ඡා කරන ලදී.

# 7. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ (SLGC) වාණිජ මට්ටමේ සේවා සැපයීම වර්ෂ 2014 ජනවාරි මස 02 වන දින සිට ආරම්භ කරන ලදී. බියගම අපනයන සැකසුම් කලාපය තුල පිහිටුවා ඇති මෙම ආයතනය වර්ෂ 2014 පෙබරවාරි මස 17 වන දින, අතිගරු බැසිල් රාජපක්ෂ ඇමති තුමන් අතින් නිළ වශයෙන් විවෘත කරන ලදී.



රූපය 7.1: ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය නිළ වශයෙන් විවෘත කිරීම

## සේවා ලාභීන්

පසුගිය දශක ගණනාව පුරාවටම රජයේ රෝහල් වල භාවිතය සඳහා ශල්‍ය අත්වැසුම් ආනයනය කරන ලදී. නමුත් මේ වන විට ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව තුල නිපදවන ශල්‍ය අත්වැසුම් ජීවානුහරණය කිරීම සිදු කරනු ලබන අතර ඒවා සියලුම රජයේ රෝහල් වල භාවිතා කෙරේ. මේ අනුව රජයේ රෝහල් සඳහා ශල්‍ය අත්වැසුම් ආනයනය උදෙසා ලක් රජය වැය කල ඇති විශාල මුදල සම්පූර්ණයෙන්ම රට තුලම රඳවා ගැනීමට හැකි වී ඇත. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ ප්‍රධාන සේවා ලාභියා වන්නේ ලලාන් රබර් පුද්ගලික ආයතනයයි. ශල්‍ය අත්වැසුම් ජීවානුහරණ සේවාව සැපයීම උදෙසා එම ආයතනය හා පරමාණුක ශක්ති අධිකාරිය අතර ව්‍යාපාරික ගිවිසුමක් ඇති කරගන්නා ලදී.



*රූපය.7.2:* ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ සේවා ප්‍රවර්ධනය

<u>ව්‍යාපාරික සාකච්ඡා සහ ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය වෙත නිරීක්ෂණ චාරිකා:</u>

පහත දැක්වෙන ආයතන ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය වෙත පැමිණ ප්‍රවිකිරණ සේවාවන් ලබා ගැනීම සම්බන්ධව සාකච්ඡා පවත්වන ලදී. ප්‍රයිම් පොලිමර් සමාගම, මින්රා ගාර්මන්ට්ස්, සිසිලි ප්‍රොජෙක්ට්ස් පෞද්ගලික සමගම, මෙඩි ප්ලස් සර්ජිකල්ස්, ෆ්රෙඩො ස්විස්, ලේක්නර් මල්ටි මොල්ඩ්ස්, රුහුණු ෆුඩ්ස්, වෙස් මුහුණු වැනි ලී වලින් තැනූ විසිතුරු භාණ්ඩ අපනයන කරුවන්, බොගවන්තලාව තේ, මැණික් අපනයන කරුවන්, ෆීනික්ස් සමාගම, බැසිලූර් තේ, ටී ටැන්ග්, ස්පයිස් ඔෆ් ලයිෆ්, මෙඩි සෙන්ස්, කුවික් තේ, හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාර, නිඩ්රෝ සප්ලයර්ස්, විචිත්‍ර වැකුම් ඩිහයිඩ්රේට් ෆුඩ්ස්, ග්ලැක්සෝ ස්මිත් ක්ලයින් සමාගම.

<u>**අත්හදාබැලීම්**</u>

පහත දැක්වෙන ආයතන ඔවුන්ගේ නිෂ්පාදන ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය තුලදී ගැමා ප්‍රවිකිරණයට ලක් කර අත්හදා බැලීම් සිදු කරන ලදී.
ටී ටැන්ග්, ස්පයිස් ඔෆ් ලයිෆ්, මෙඩි සෙන්ස්, කුවික් තේ, හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාර, නිඩ්රෝ සප්ලයර්ස්, විචිත්‍ර වැකුම් ඩිහයිඩ්රේට් ෆුඩ්ස් හා ග්ලැක්සෝ ස්මිත් ක්ලයින් සමාගම.

<u>**පර්යේෂණ හා සංවර්ධන කටයුතු**</u>

පහත දැක්වෙන පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබා දෙන ලදී.
මැලේරියා මර්ධනය සඳහා වඳ කෘමි තාක්ෂණය යොදාගැනීමේ ව්‍යාපෘතිය
ඖෂදීය ශාක ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවිකිරණය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය හා වයඹ විශ්ව විද්‍යාලය මගින් සිදුකරන සතුන් හට රෝග ඇතිකරන ජීවීන්ගේ පිලවුන් ප්‍රවිකිරණ ව්‍යාපෘතිය

උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් සිදුකරන නව ශාක ප්‍රභේද බිහිකිරීමේ පර්යේෂණ කටයුතු

<u>**ජයග්‍රහණ**</u>

- ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය වර්ෂ 2014 ඔක්තෝබර් මස 27 වන දින ISO 9001:2008 තත්ත්ව සහතිකය හිමි කර ගන්නා ලදී .

- වර්ෂ 2014 දී ශල්‍ය අත්වැසුම් ඝන මීටර 3918 ක් ප්‍රවිකිරණය කරන ලද අතර ඒ හරහා රුපියල් මිලියන 43.1 ක ආදායමක් උපයා ගන්නා ලදී.

# 8. ජෛවී විද්‍යා අංශය (LSD)

ජෛව විද්‍යා අංශයේ මූලික වගකීම වන්නේ න්‍යෂ්ටික හා ඒ ආශ්‍රිත විශ්ලේෂණ කටයුතු පරමාණුක ශක්ති අධිකාරිය තුල ස්ථාපිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම මගින් රටේ සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීමයි. ජෛව විද්‍යා අංශය ප්‍රධාන කොටස් 03කින් සමන්විත වේ.

1)Nuclear Analytical Services Unit - න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා අංශය
2)Health and Enviromental Studies Unit - සෞඛ්‍යය හා පාරිසරික අධ්‍යයන අංශය
3)Nuclear Agiculture Unit - න්‍යෂ්ටික තාක්ෂණයේ කෘෂිකාර්මික යෙදවීම් අංශය

ජෛව විද්‍යාත්මක අංශය එහි සේවාව විකිරණ ආරක්ෂණ හා නියාමන අංශය, ආනයනික අපනයනික අංශය, කර්මාන්ත අංශය , පර්යේෂණ හා අධ්‍යයන අංශය සඳහා න්‍යෂ්ටික හා ඒ ආශ්‍රිත ක්‍රමවේදයන් භාවිතයෙන් ලබා දී ඇත.

න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා අංශය පාරිභෝගිකයන් සඳහා 2014 දී කිරිපිටි සාම්පල 4273 ක් සඳහා විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කර ඇත . කිරිපිටි පාරිභෝගිකයන් සඳහා ඒවා විකිරණශීලී ද්‍රව්‍ය වලින් අපවිත්‍ර වී ඇතිදැයි පරික්ෂා කර බැලීම මගින් පාරිභෝගික ආරක්ෂාව සහතික කරනු ලැබේ. මීට අමතරව ආනයනික ටින් මාළු සාම්පල 1464 ක් සඳහා 2014 වර්ෂයේ දී විශ්ලේෂණ වාර්තා පාරිභෝගිකයන් වෙත ඉදිරිපත් කර ඇත. මෙමගින් මාළු පාරිභෝගිකයන් ගේ විකිරණශීලී ද්‍රව්‍ය වලින් වන ආරක්ෂාව තහවුරු කර ඇත. තේ කොළ හා අනෙකුත් අපනයන ද්‍රව්‍ය පාරිභෝගිකයන් 1605 ක් සඳහා විශ්ලේෂණ වාර්තා ආනයනකරුවන් වෙත නිකුත් කර ඇත.

**ජෛවීය** විද්‍යා අංශය දැනට න්‍යෂ්ටික විශ්ලේෂණ විද්‍යාගාර 03කින් සමන්විත වේ.

1) Lowlevel Counting Labaratory for Gamma Spectrometry.(අඩු විකිරණ මාත්‍රා මැනීම සඳහා වන විද්‍යාගාරය) .
2) Alpha Counting Labaratory ( ඇල්ෆා විකිරණ මැනීම සඳහා වන විද්‍යාගාරය)
3) XRF Labaratory (X කිරණ ප්‍රතිදීපන විද්‍යාගාරය)

## 8.1 ගැමා වර්ණාවලිමීතිය භාවිතයෙන් සිදුකරන සේවා

2014 දී ජෛවීය විද්‍යාත්මක අංශය මගින් එහි විශ්ලේෂණ සේවාව රටේ ආනයන , අපනයන අංශය , දේශීය කර්මාන්තකරුවන් හා පර්යේෂණ හා සංවර්ධන ආයතන ආදිය සඳහා සාම්පල 7500 කට වඩා වැඩි ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීම මගින් ලබාදී ඇත. ආනයනික කිරිපිටි සඳහා තේ , පොල් අපනයනකරුවන් සඳහා සහ යම් විශේෂිත වූ සාම්පල සඳහා තම සේවාව ලබාදී ඇත. මෙම පරික්ෂවන්හි මූලික අරමුණ වන්නේ මෙම සාම්පල විකිරණශීලී ද්‍රව්‍ය වලින් අපවිත්‍ර වී ඇතිදැයි සොයාබැලීමයි. මෙමගින් ජෛවීය විද්‍යා අංශය මගින් ඉපැයූ මූලික අදායම 2014 වර්ෂයේ දී රු මිලියන 37.4 කි .



*රූපය 7.1: ගැමා වර්ණාවලීක්ෂමිතික විද්‍යාගාරය*

පසුගිය අවුරුදු 10 හි දී පරික්ෂා කරන ලද ප්‍රස්තාරිකව නිරූපනය කර ඇත.




*රූපය 7.2 : න්‍යෂ්ටික විශ්ලේෂණ කටයුතු මගින් ආදායම ඉපයීම (2002-2014)*

**8.2 ගැමා වර්ණාවලිමිතිය මගින් සිදුකල පර්යේෂණ හා සංවර්ධන කටයුතු**

**a)** පරමාණුක ශක්ති අධිකාරියේ අනිකුත් අංශ කීපයක් හා එක්ව පාරිසරික විකිරණශීලිතාව මැනීම අඛණ්ඩව සිදුකරගෙන යනු ලබයි. මෙහි මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පාරිසරික විකිරණශීලිතාවය පිළිබඳ සිතියමක් සකස් කිරීමයි. මේ සඳහා දිවයිනේ විවිධ ස්ථානවලින් ලබාගත් පස් නියදීන් හා ශාක කොටස් නියැදීන් 81 ක පවත්නා විකිරණශීලිතාව සඳහා විශ්ලේෂණය කරන ලදී .



*රූපය .7.3: විශ්ලේෂණය සඳහා පස් සාම්පල පිළියෙල කිරීම*

**b). සමුද්‍ර පරිසරයේ විකිරණශීලිතාව මැනීමේ වැඩසටහන**

2011 මාර්තු මස සිදුවූ Fukushima (ෆුකුශිමා) න්‍යෂ්ටික අනතුරින් පසුව එමගින් සිදුවූ සාගර පරිසරය විකිරණශීලි ද්‍රව්‍ය මගින් අපවිත්‍ර වීම පරික්ෂා කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙමගින් ශ්‍රී ලංකාවේ අවට මුහුදේ විකිරණශීලිතාවය පිළිබඳ ඉතා සාර්ථක දත්ත ජාලයක් ස්ථාපිත කිරීමට හැකියාව ලැබී ඇත. මේ සඳහා අන්තර්ජාතික පරමාණුක ශක්ති නියෝජිත ආයතනයෙහි (RAS/ 7/21) ව්‍යාපෘතිය හරහා තාක්ෂණික සහය ලබා දුනි . මෙය ආසියා ශාන්තිකර කලාපයේ රටවල ෆුකුශිමා න්‍යෂ්ටික අනතුර මගින් විකිරණශීලී ද්‍රව්‍ය සාගර ජලයට එක්වීමෙන් සිදුවූ බලපෑම මූලිකව අධ්‍යනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියකි.

ඊට සමගාමීව පරමාණුක ශක්ති අධිකාරිය මගින් ආනයනික අමු මාළු හා ටින් මාළු සාම්පල විශ්ලේෂණය කර අධ්‍යනය කරනු ලැබේ . එමගින් එම ආහාර වල තත්ත්වය සහතික කිරීමක් සිදුකරයි. මෙහිදී Cs 137 සහ Cs 134 අඩංගු මාළු සාම්පල හමු වූ නමුත් එම ප්‍රමාණය ශ්‍රී ලංකා රජයේ ඒ සඳහා ක්‍රියාත්මක වන පරිසාධන මට්ටමට වඩා අඩුය. මෙම පරීක්ෂාවන් අඛණ්ඩව සිදු කරන ලබන අතර මේ අනුව ආනයනික අමු මාළු හා ටින් මාළු විකිරණශීලි ද්‍රව්‍ය මගින් අපවිත්‍ර වී ඇති ප්‍රමාණය නොගිනිය හැකි තරම්ය.

**8.3 පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති**

**a) IAEA / RAS / 7 /023 න්‍යෂ්ටික විශ්ලේෂණ ක්‍රම භාවිතයෙන් වායු දූෂණ මැනීමේ ව්‍යාපෘතිය**

පරමාණුක ශක්ති අධිකාරියේ ජෛවීය විද්‍යා අංශය මධ්‍යම පරිසර අධිකාරිය හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව එක්ව සිදු කරනු ලබන ව්‍යාපෘතියකි. නව සාම්පල ගැනීමේ මධස්ථානය ලෙස මහනුවර ප්‍රදේශයේ කටුගස්තොට කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය යොදා ගන්නා ලදී. අන්තර් කලාපීය දත්ත ගොනුවක් යාවත්කාලීන කොට දත්ත ජාල සංවිධානයක් වෙත භාර දෙන ලදී . දත්ත විශ්ලේෂණය සංඛ්‍යාන මෘදුකාංගයක් ආධාරයෙන් (Statistical Software) සිදු කරන ලදී.

IAEA / RCA කලාපීය වැඩමුළුව (සංස්කෘතික උරුමයන් වන වස්තූන් සඳහා වායු දූෂණ කාරක ප්‍රභවයන්ගේ බලපෑම.)

මෙම වැඩ මුළුව සංවිධානය කරනු ලැබුවේ RCA/ IAEA ව්‍යාපෘති අංක RAS/ 7 /023 “න්‍යෂ්ටික විශ්ලේෂණ ක්‍රම භාවිතයෙන් පවතින් වායු දූෂණ මැනීමේ ව්‍යාපෘතිය” මගින් වත්තල පෙගසස්රීෆ් හෝටලයේදී 2014 ජුලි 7 - 11 වනදා දක්වයි. මෙහි අරමුණ වූයේ ආසියා ශාන්තිකර කලාපීය රටවල් වල වායු දූෂණ අංශුන් හා වායු දූෂක වායූන් මගින් සියලුම සංස්කෘතික උරුමයන් හා වස්තූන් , ගෘහස්ථ හා විවෘත කැටයම් , පුරාවිද්‍යාත්මක ප්‍රදේශ , භාණ්ඩ සඳහා වන බලපෑම සාකච්චා කිරීම , විශ්ලේෂණය හා දැනුම වැඩි කිරීමයි.

b) IAEA / RAS /062 න්‍යෂ්ටික විශ්ලේෂණ ක්‍රම භාවිතයෙන් ආහාර ද්‍රව්‍ය වල අනන්‍යතාව හඳුනා ගැනීම සඳහා තාක්ෂණික දැනුම හා හැකියාව වැඩි කිරීම හා එමගින් ආහාර ද්‍රව්‍ය වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන ව්‍යාපෘතිය

ආහාර ද්‍රව්‍ය වල සම්භවය හා එහි අයිතිය සහතික කිරීමේ හැකියාව සංවර්ධනය වෙමින් පවතින රටවල සුවිශේෂී ආර්ථික වැදගත්කමක් උසුලයි. උදාහරණ ලෙස සමහර ද්‍රව්‍ය ඒවායේ තත්වය හා අනන්‍යතාවය හෝ එහි සංයුතිය සම්බන්ධයෙන්, සුවිශේෂී නිෂ්පාදන කරන ප්‍රදේශ පදනම් කර ගත් ලේබල මගින් අලෙවිය වැඩි කර ගත හැක. ( උදා: එය පවතින භූගෝලීය ප්‍රදේශය ) පරිභෝගික ආරක්ෂාව හා සාර්ථක දේශීය හා අන්තර්ජාතික වෙළඳාමක් තහවුරු කිරීම සඳහා උසස්ම තත්වයේ , ආරක්ෂිත ආහාර නිෂ්පාදනය මූලික අවශ්‍යතාවයක් වේ. එමෙන්ම මෙය ජාතික කෘෂිකාර්මික සම්පත් වල තිරසාර සංවර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය වේ. ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ආහාර හඳුනා ගැනීම සඳහා වන ක්‍රමවේදයන් මහගු කාර්යයක් ඉටු කරයි.

මෙම ව්‍යාපෘතියේ අරමුණ ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික තාක්ෂණය මත පදනම් වූ ආහාර අන්වේෂණ පද්ධතියක් ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය තාක්ෂණික හැකියාව දියුණු කිරීමයි.

මුලින්ම සහල් සහ පැණි වැනි ද්‍රව්‍ය සඳහා මෙවැනි පද්ධතියක් හඳුන්වා දෙනඅතර අනාගතයේ තේ, කුළුබඩු, වැනි ද්‍රව්‍ය සඳහා ආදර්ශක ලෙස ප්‍රයෝජනයට ගත හැක.

## 8.4 QA / QC

## ISO Accredited Laboratory ( ISO ප්‍රතීතනය කරන ලද විද්‍යාගාරය )

පරමාණුක ශක්ති අධිකාරියේ LLC විද්‍යාගාරය ISO / IEC 17025 : 2005 අන්තර්ජාතික තත්ව සහතිකය මගින් ප්‍රතීතනය කරන ලද විද්‍යාගාරයකි. මෙම තත්ත්ව සහතිකය මුළු ලෝකයේම ඉතා ඉහළ පිළිගැනීමකට ලක්ව ඇති ලොවම හඳුනන ඉතා ඉහළ මට්ටමේ පරීක්ෂණ විද්‍යාගාරයක් සඳහා වන තත්ත්ව සහතිකයකි.

ISO/ IEC: 17025
TL 012-01

මීට අමතරව ජෛවීය විද්‍යා අංශය එහි තත්ත්ව පද්ධතිය හා ගුණාත්මක භාවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා QA / QC වැඩසටහන් වලට දේශීය මෙන්ම අන්තර්ජාතික වශයෙන් අඛණ්ඩව සහභාගී වේ.

අභ්‍යන්තර හා බාහිර PT වැඩසටහන් (ප්‍රවීණතා පරීක්ෂණ) ගුණාත්මකතාව පිළිබඳ විගණන සෑම අවුරුද්දකට වරක්ම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් සිදුවන අඛණ්ඩ ඇගයීම් අන්තර්ජාතික පරමාණුක ශක්ති ඒජන්සිය මගින් පැවැත්වෙන ප්‍රවීණතා පරීක්ෂණ සඳහා නිරතුරුව සහභාගීවීම මගින් ජෛවීය විද්‍යා අංශය තම තාක්ෂණික හැකියාව හා පරිපාලන හැකියාව මනාව විදහා පා ඇත.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් LLC විද්‍යාගාරයේ න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සඳහා විවිධ පස් වර්ග , Sediment(අවසාධිත), ජලය,පිටිකිරි, ශාකමය සාම්පල ( තේ, පොල්, ශාක ඇට වර්ග) සහ වෙනත් ද්‍රව්‍යයන් ( මාළු , සකස් කළ ආහාර , ඖෂධ , ඛණිජවැලි ) විශ්ලේෂණය සඳහා වන දැක්ම ( Scope) පුළුල් කර ඇත.

එමෙන්ම X කිරණ ප්‍රතීතන රසායනාගාරයේ තත්ත්ව පද්ධතිය නැවත සමීක්ෂණය මගින් සහ පළමු පරීක්ෂණය සම්පූර්ණ කිරීමෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් නැවත ප්‍රතීතනය කිරීම සඳහා නිර්දේශ කරන ලදී.

**8.5 විකිරණ රසායනවිද්‍යා ( radiochemistry ) විශ්ලේෂණ හා ඇල්ෆා වර්ණාවලීමිතිය ස්ථාපිත කිරීම.**

ඇල්ෆා විශ්ලේෂණය සඳහා වන විධික්‍රම තහවුරු කර ගැනීම සඳහා ( method validation ) IAEA හා මැලේසියානු පරමාණුක ශක්ති අධිකාරිය (MINT) මගින් අඛණ්ඩව පවත්වන ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් සඳහා අඛණ්ඩව සහභාගිවේ.

ස්වභාවික පාරිසරික සාම්පල වල ( පස් හා ශාකමය ජීවී) U – 238 , U – 235, V- 234 , Th – 232, Th - 230 , Th – 228 හා Po – 210 සඳහා විකිරණ රසායනික වෙන් කර ගැනීමේ විධික්‍රම භාවිතා කරනු ලැබේ.

අළුතින් සපයාගන්නා ලද තනි සාම්පලයක් විශ්ලේෂණය සඳහා වන Liquid Scintillation counter (LSC) , උපකරණය පාරිසරික සාම්පල වල බීටා විකිරණශීලී මූල ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා භාවිතා කල හැක. කිරි වල ඇති විකිරණශීලී ස්ට්‍රොන්ටියම් මැනීම සඳහා වන පරීක්ෂණාගාර විධි ක්‍රමය 2015 දී ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

**8.6 න්‍යෂ්ටික කෘෂිකර්මාන්තය**

න්‍යෂ්ටික කෘෂිකර්මාන්තය සඳහා වන ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වන IAEA/TC/SRL/5045 ව්‍යාපෘතිය යටතේ විකෘති ඇති කිරීම මගින් ශාක අභිජනනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. ( Matation breeding ) සහල් , මුන් , මිරිස් , ලොකු ළූනු , සොයා බෝංචි යන වගාවන් සඳහා බතලේගොඩ සහල් පර්යේෂණ ආයතනයේ හා මහඉලුක්පල්ලම භෝග පරීක්ෂණ ආයතන හා සංවර්ධන මධ්‍යස්ථානයේ ආරම්භ කරන ලදී. බීජ විකිරණශීලී තත්ත්වයට භාජනය කිරීම සඳහා තාක්ෂණික සහය අන්තර්ජාතික පරමාණුක ශක්ති ආයතනයේ සයිබස්ඩොෆ් , ඔස්ට්‍රියාවේ , FAO / IAEA විද්‍යාගාරය මගින් සිදු කරන ලදී.

**8.7 පුහුණු වැඩසටහන්**

IAEA / RCA අන්තර්ජාල භාවිතයෙන් බහු විචල්‍ය සංඛ්‍යානනය ආහාර වල අනන්‍යතාවය හඳුනා ගැනීම සඳහා ස්ථායි සමස්ථානික හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය විශ්ලේෂණය භාවිතය යන මැයින් කොළඹ පරමාණුක ශක්ති අධිකාරියේ සත්කාරකත්වයෙන් ඔක්තෝම්බර් 13 -24 දක්වා වැඩමුළුවක් පැවැත්වෙන ලදී. IAEA / RCA ව්‍යාපෘති අංකය RAS / S /062 න්‍යෂ්ටික විශ්ලේෂණ ක්‍රම භාවිතයෙන් (ආහාර සුරක්ෂිතතාව හා ආරක්ෂාව පාලනය සඳහා වන තාක්ෂණික හැකියාව වර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘතිය) අන්තර්ජාතික හා දේශීය පුද්ගලයන් 28කගේ සහභාගීත්වයෙන් සිදු කෙරුණි.

සැප්තම්බර් 27 සිට ඔක්තෝම්බර් 05 දක්වා සාගර දූෂණය පාලනය කිරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා වන IAEA / TC ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ කලපු හා සාගර පද්ධතිය අඛණ්ඩව පරීක්ෂා කර බැලීම සඳහා වන ජාතික වැඩපිළිවෙළක් ස්ථාපිත කිරීම සඳහා IAEA විශේෂඥ නවසීලන්තයේ GNS Science ආයතනයේ ආචාර්යය Karyn Zogers මහත්මියගේ ප්‍රධානයෙන් විශේෂඥ පුහුණුවක් ලබා දෙන ලදී.

අප්‍රේල් 7 සිට 11 තෙක් IAEA / RCA ව්‍යාපෘතියක RAS / 7 /024 යටතේ ( න්‍යෂ්ටික හා සමස්ථානික විශ්ලේෂණ තාක්ෂණික ක්‍රම භාවිතයෙන් දේශගුණික වෙනස්වීම ඇගයීම සහ ඒ මගින් තිරසාර සාගර පාරිසරික පද්ධතිය පාලනය කිරීම සඳහා වන ව්‍යාපෘතිය ) යටතේ නියැදි ලබාගැනීම හා පිළියෙළ කිරීම කරන ආකාරය පුහුණු කිරීම සඳහා විශේෂඥ පුහුණුවක් ආචාර්ය IAEA විශේෂඥ Karyn Zogers මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ලදී.

ජෛවීය විද්‍යා අංශය මගින් විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂිත හා පශ්චාත් උපාධි සිසුන් සඳහා පුහුණු හා පර්යේෂණ ව්‍යාපෘති කිරීමේ පහසුකම් සපයා දෙනු ලබයි. 2014 වර්ෂයේදී පශ්චාත් උපාධි සිසුන් තිදෙනෙකු සඳහා ඔවුන්ගේ පශ්චාත් උපාධි පර්යේෂණ ව්‍යාපෘති සඳහා ( න්‍යෂ්ටික විශ්ලේෂණ භාවිතයෙන්) සහ උපාධි සිසුන් 08 දෙනුකු සඳහා ඔවුන්ගේ කාර්මික හා සීමාවාසික පුහුණුව සඳහා පහසුකම් සලසා දෙන ලදී.

## Recent Scientific Publications (in 2014)

1)" Existing Marine Radioactivity level of $^{40}K$ , $^{226}Ra$ , $^{232}Th$ , $^{137}Cs$ & $^{134}Cs$ in sea sediment & $^{137}Cs$ & $^{134}Cs$ levels in sea water Sri Lanka " was presented at the 11th coordination meeting of the IAEA's Network of Analytical laboratories for the measurement of Environmental Radioactivity

සාගර අවසාධිත වල ඇති $^{40}K$ , $^{226}Ra$ , $^{232}Th$ , $^{137}Cs$ , $^{134}Cs$, සහ සාගර ජලයේ පවත්නා $^{137}Cs$ , $^{134}Cs$ මට්ටම් පිළිබඳව අන්තර්ජාතික පරමාණුක ශක්ති ආයතනයේ පාරිසරික විකිරණශීලීතාවය මැනීමේ විශ්ලේෂණ විද්‍යාගාර ජාලය (ALMERA ) 11 වෙනි සහභාගීත්ව රැස්වීමේදී (2014 ඔක්තෝම්බර් 7 – 10 දක්වා ඕස්ට්‍රේලියාවේ වියනාහිදී පැවෙති) විද්‍යාත්මක ප්‍රකාශනයක් ඉදිරිපත් කරන ලදී.

2) "Stable isotope analysis for paddy rice in Sri Lanka : A possible med for geographic origin discrimination "

ශ්‍රී ලංකාවේ වී සඳහා ස්ථායි සමස්ථානික විශ්ලේෂණය එහි භූගෝලීය සම්භවය වෙනස්වීම පදනම් කරගෙන කළහැකි ක්‍රමයක් යන මැයෙන් විද්‍යාත්මක ප්‍රකාශනයක් ආහාර වල ආරක්ෂාව හා තත්ත්වය පිළිබද අන්තර්ජාතික විද්‍යාත්මක සමුළුවේ න්‍යෂ්ටික හා ඒ ආශ්‍රිත යෙදවීම් කොටසේදී එළි දක්වන ලදී. (ඔස්ට්‍රියාවේ වියනාහිදී අන්තර්ජාතික පරමාණුක ශක්ති ඒජන්සියේ 2014 නොවැම්බර් 10 -13 දිනයන් හිදී පැවැත්විණි).

# 09.ජල විද්‍යා අංශය

**<u>2014 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්</u>**

(1) මොරගහකන්ද ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශයේ භූගත ජල මූලාශ්‍ර හා එහි හැසිරීම් පිළිබඳ මූලික අවබෝධයක් ලබාගැනීම සඳහා දත්ත රැස් කිරීම මෙහි මූලික අරමුණ වේ.මහවැලි අධිකාරිය සමඟ සම්බන්ධව මෙහි අධ්‍යයන කටයුතු සිදු කරන ලදී. මේ සඳහා වර්ෂයක් තුල ගනු ලබන ස්වභාවික ජලයේ සමස්ථානික දත්ත ප්‍රමාණවත් වන අතර එමඟින් ජලාශයේ වැඩ අවසන් වූ පසු පහත් බිම් වලට සිදුවන බලපෑම් මෙන්ම ජලාශයේ කාන්දුවීම් සිදුවන ස්ථාන ද පහසුවෙන් හඳුනාගැනීමට සමස්ථානික ජල විද්‍යා තාක්ෂණය උපකාරීවේ.



*රූපය. 8.1: මොරගහ කන්ද ජලාශ භූමි භාගයේ මූලික පරීක්ෂණ කටයුතු වල නියැලෙමින්*

2.මන්නාරම සහ මුරුක්කන් ප්‍රදේශ වල භූගත ජලයේ හැසිරීම පිළිබඳ අධ්‍යයනය ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය සමඟ ඒකාබද්ධව ආරම්භ කරන ලදී. මෙහිදී වසරක් තුල ජල සාම්පල රැස්කිරීම මෝසම් වර්ෂාවට පෙර සහ පසු ලෙස කාල පරාස දෙකකදී සිදු කල අතර සමස්ථානික ජල විද්‍යා තාක්ෂණය භාවිතයෙන් ජලයේ භූගත හැසිරීම සහ රසායනික විද්‍යා පරීක්ෂණ මඟින් ජලයේ ගුණාත්මක භාවයේ වෙනස් වීම් ද පරීක්ෂා කරන ලදී.

3. අන්තර් ජාතික ජල කළමණාකරන ආයතනයේ අනුග්‍රහයෙන් වකුගඩු රෝග බහුල ප්‍රදේශයක් වන දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ සමස්ථානික ජල අධ්‍යයන සිදු කරන ලදී. මෙහිදි මූලික පරමාර්ථය ලෙස වකුගඩු රෝගය සඳහා බලපෑම් සිදු

කරන භූගත ජල මූලාශ්‍ර වර්ගීකරණය කළ අතර මෙම අධ්‍යයනය වකුගඩු රෝග බහුල උතුරු මැද පළාතේ අනෙකුත් ප්‍රදේශ වලට ද සිදු කිරීම සඳහා පියවර ගන්නා ලදී.



රූපය. 8.2: ජල නියැදි රසායනික විශ්ලේෂණ කටයුතු සඳහා සකස් කිරීම

4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන පෞරාණික සිතුවම් සංරක්ෂණ ව්‍යාපෘතියට සමගාමීව දඹුලු ලෙනේ අළුතෙන් ඇතිවූ ජල කාන්දුව සිදුවන ස්ථානය තහවුරු කර ගැනීම සඳහා සමස්ථානික ජල විද්‍යා තාක්ෂණය භාවිත කිරීමට පියවර ගෙන ඇත.



*රූපය .8.3: දඹුලුගල අවට පරිසරය විශ්ලේෂණය*

- 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්:

1. කලාඔය සහ අබන්ගහ ප්‍රදේශ වල සමස්ථානික ජල විද්‍යාව භාවිතයෙන් භූගත ජලයේ හැසිරීම පිළිබඳව අධ්‍යයනයන් සිදු කල අතරම 2012 වසරේ සිට 2014 දක්වා රසායනික තාක්ෂණයද භාවිතා කරන ලදී. මෙය වියළි කලාපයේ භූගත ජලයේ හැසිරීම නිරීක්ෂණය සඳහා කරනු ලැබූ මූලික අධ්‍යයනයක් වන අතර ඉදිරියේ දී ද පරීක්ෂණ සඳහා උපයෝගී කරගැනීමට කටයුතු කරමින් පවතී.

2. වැසි ජලයේ සමස්ථානික අගයන් පිළිබඳ මූලික දත්ත රැස් කිරීම 2012 සැප්තැම්බර් සිට 2014 අප්‍රියෙල් දක්වා කාලය තුල සිදු කරන ලදී. මෙහිදී වියළි කලාපයේ තෝරාගත් ස්ථාන 19 ක වැසි ජල රැස් කිරීමේ පද්ධති සවිකිරීම සිදු කල අතර මෙමඟින් සෑම මසකම වැසි ජල සාම්පල රැස් කිරීමට කටයුතු කෙරිණි. තවද කොළඹ ප්‍රදේශයේ වැසි ජලය රැස්කිරීම හා එහි සමස්ථානික දත්ත වාර්තා සකස් කිරීම 2008 වසරේ සිට සෑම මසකම සිදු කරමින් පවතී.

3. විදුලි බල මණ්ඩලය මගින් ඉදිකිරීම් කටයුතු සිදුකරන බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතිය සිදු කරන ප්‍රදේශයේ භූගත ජලයේ හැසිරීම පිළිබඳ පරීක්ෂණ 2013 වසරේ එම මණ්ඩලය සමඟ ඒකාබද්ධව ආරම්භ කළ අතර දැනට එහි පළමු පියවර ලෙස ව්‍යාපෘති ප්‍රදේශයේ ජලයේ හැසිරීම පිළිබඳ අවබෝධයක් ලබා ගෙන ඇත.

4. සමස්ථානික ජල විද්‍යා තාක්ෂණය සහ රසායනික පරීක්ෂණයන් භාවිතා කරමින් යාපන අර්ධද්වීපයේ භූගත ජලයේ හැසිරීම සහ ජලයේ ගුණාත්මක භාවයන් පිළිබඳ අධ්‍යයනය කිරීම 2012 වසරේ ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය අන්තර් ජාතික පරමාණු ශක්ති ඒජන්සිය යටතේ ඇති RAS/ 7/022 ව්‍යාපෘතිය යටතේ ජල සම්පත් මණ්ඩලය සමඟ අනුබද්ධව සිදු කල අතර මෙහිදී විශේෂඥ දැනුම සපයන ලද්දේ අන්තර් ජාතික පරමාණු ශක්ති ඒජන්සිය මගිනි.

- අනෙකුත් ක්‍රියාකාරකම්

1. කොරියානු පරමාණුක ශක්ති පර්යේෂණ ආයතනය (KAERI) මගින් කළ ඉල්ලීමකට අනුව සමස්ථානික ජල විද්‍යා අංශය මගින් කොරියානු ජල සාම්පල වල අන්තර්ගත ට්‍රිටියම් ප්‍රමාණය විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. මෙහිදි සාම්පල විශ්ලේෂණය සඳහා මුදල් අයකිරීම සිදු කල අතර මෙය පරමාණුක බලශක්ති මණ්ඩලය තමන්ගේ විශ්ලේෂණ සේවාවන් විදේශයන්ට සැපයූ ප්‍රථම අවස්ථාව ලෙස ද සැලකේ.

2. සමස්ථානික ජල විද්‍යා අංශයේ රසායනික සේවාවන් පුළුල් කිරීම සඳහා හඳුන්වා දුන් Ion chromatography (IC) පද්ධතිය මගින් ජලයේ අඩංගු ඇනායන සහ කැටායන දත්ත නිවැරදිව ලබාගත හැකි අතර මෙය සමස්ථානික දත්ත වලින් ලබා ගන්නා නිගමන තවදුරටත් පැහැදිලි කිරීමට උපකාරී වේ. මේ පිළිබඳව සිංගප්පූරුවේ පැවති දින දෙකක පුහුණුවකට සමස්ථානික ජල විද්‍යා අංශයේ විද්‍යාත්මක නිළධාරීන් දෙදෙනෙකුට සහභාගි වීමට අවස්ථාව උදා විය.

# 10. විඥාපන සේවා

## 10 .1. 2014 වර්ෂය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

### 10.1.1. ප්‍රදර්ශන

(අ) අධිකාරිය 2014 පෙබරවාරි මස 17 සිට 25 දක්වා කුලියාපිටියේ පවත්වන ලද දැයට කිරුල ප්‍රදර්ශනයට සහභාගී වීම.




*රූපය .9.1: දැයට කිරුල ප්‍රදර්ශනය සඳහා නිර්මාණය කරන ලද අධිකාරියේ ප්‍රදර්ශන කුටිය*

(ආ) තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද "විද්‍යා සතිය-2014" සඳහා සහභාගි විය.




*රූපය .9.2: විද්‍යා සතිය සඳහා නිර්මාණය කරන ලද අධිකාරියේ ප්‍රදර්ශන කුටියේ කොටසක්.*




*රූපය .9.3: තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද විද්‍යා සතිය වෙනුවෙන් පැවැත්වූ පාගමන සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලය සහභාගිවිය*

(ඇ) පරමාණුක ශක්ති අධිකාරිය සහභාගිවූ වෙනත් ප්‍රදර්ශන

i විහාරමහා දේවි විද්‍යාලය - කිරිබත්ගොඩ

ii කාර්මික තාක්ෂණ ආයතනය

iii රිනයිසන්ස් -2014, ශාන්ත අන්තෝනි විද්‍යාලය - මහනුවර

**10.1.2. සම්මන්ත්‍රණ**

i නාෂ්ටික තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය - මාතලේ

ii නාෂ්ටික තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය - කොළඹ

iii නාෂ්ටික විද්‍යාව පිළිබඳශාන්ත මරියා විද්‍යාලය - කෑගල්ල

iv නාත්තන්ඩිය විද්‍යා මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණය සඳහා සහභාගීවීම

**"දැයට කිරුළ 2014" ප්‍රදර්ශනයට සමගාමීව පැවැත්වූ ප්‍රශ්ණ විචාරාත්මක දැනුම මිනුම හා කථික තරගාවලිය**

"දැයට කිරුළ 2014" ප්‍රදර්ශනයට සමගාමීව ශ්‍රී ලංකා තරුණ නාෂ්ටික වේදීන්ගේ සංගමය විසින් ප්‍රශ්ණ විචාරාත්මක දැනුම මිනුම හා කථික තරගාවලියක් සංවිධානය කරන ලදී. සිසුන් 70කට වඩා වැඩි ප්‍රමාණයකට තරගාවලියේ දී සහතිකපත් හා ත්‍යාග ප්‍රදානය කරන ලදී. මෙම තරගාවලිය සංවිධානය කිරීමට සහාය වූ වයඹ විශ්ව විද්‍යාලීය සිසුන් හට සහතිකපත් ප්‍රදානය ශ්‍රී ලංකා තරුණ නාෂ්ටික වේදීන්ගේ සංගමය විසින් සිදුකරන ලදී.

ප්‍රදර්ශන කුටිය තුලදී පෝස්ටර්, අත්පත්‍රිකා හා වීඩියෝ දර්ශන යොදා ගනිමින් නාෂ්ටික බලය යොදාගනිමින් විද්‍යුතය උත්පාදනය ගැන වැදගත් තොරතුරු ලබා දෙන ලදී.



*රූපය 9.4: වයඹ විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා අංශයේ දේශනයක් සිදු කරමින්*



*රූපය 9.5: කුලියාපිටිය මධ්‍ය විද්‍යාලයේ දේශණයක් සිදු කරමින්*

- **විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මහජනතාවට හා සිසුනට නාෂ්ටික විද්‍යාව හා තාක්ෂනය යොදාගෙන නාෂ්ටික බලයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම පිළිබඳ දැනුවත් කරන ලදී.**
- **"විදුලිය නිෂ්පාදනය" පිළිබඳ අත් පත්‍රිකා 5000 ක් නිකුත් කරන ලදී.**
- **නාෂ්ටික බලය යොදාගෙන විදුලිය නිෂ්පාදනය ගැන වාර්තාමය වැඩසටහනක් සකස් කර නිෂ්පාදනය කරන ලදී.**

වැඩිදුර තොරතුරු සඳහා :

YNSS වෙබ් අඩවිය : http://ynssl.wordpress.com/

YNSS Facebook Group**:** Youth Nuclear Society of Sri Lanka (YNSS)

IYNC වෙබ් අඩවිය : http://www.iync.org

**විදේශිය සම්මන්ත්‍රණ/පුහුණු වැඩසටහන්/වැඩමුළු/රැස්වීම් සඳහා ප.ශ.අධිකාරියේ නිළධාරින්ගේ සහභාගිත්වය - 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා.**

ජෙ. වි. නි.- ජොෂ්ඨ විද්‍යාත්මක නිළධාරි
වි. නි. - විද්‍යාත්මක නිළධාරි
තා. ස. - තාක්ෂණික සහයක

නි. අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ප. ශ. අ. - පරමාණුක ශක්ති අධිකාරිය
අ. ප. බ. ඒ - අන්තර්ජාතික පරමාණුශක්ති ඒජන්සිය

| අංකය | නිළධාරියාගේ නම | තනතුර | පාඨමාලාවේ/සම්මන්ත්‍රණයේ/වැඩමුළුවේ/රැස්විමේ හෝ සමුළුවේ අදාළ අංගයේ නම | කාලවකවානුව | රට | අනුග්‍රාහක ආයතනය |
|---|---|---|---|---|---|---|
| 1 | යු. ඩබ්. කේ. එච්. ද සිල්වා මහතා | ජෙ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | නියාමන මණ්ඩල සංවිධානය හා නිපුණත්වය පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව. | 27.01.2014 31.01.2014 | පිලිපීනය | අ. ප. ශ. ඒ |
| 2 | එන්. පි. එන්. කරුණාරත්න මෙනවිය | වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | | | | |
| 3 | එච්. එල්. අනිල් රංජිත් මහතා | අධ්‍යක්ෂ, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | විකිරණශිලි ප්‍රභවයන්ගේ ආරක්ෂාව පිළිබඳ හතරවන කලාපීය විමර්ශන රැස්වීම. | 11.02.2014 14.02.2014 | තායිලන්තය | අ. ප. ශ. ඒ |
| 4 | කේ. කේ. පි. අයි. කේ. කඩදුන්න මහතා | ජෙ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | | | | |
| 5 | දුලාංජලි මධුෂා මෙනවිය | වි. නි, ජෛව විද්‍යා අංශය. | ආහාර පරික්ෂා සඳහා ස්ථායි සමස්ථානික හා අංශු මුලද්‍රව්‍ය විශ්ලේෂණයේ යෙදවුම් පිළිබඳ පුහුණු වැඩමුළුව. | 03.02.2014 14.02.2014 | පිලිපීනය | අ. ප. ශ. ඒ |
| 6 | කේ. ආර්. සි. ද සිල්වා මහතා | ජෙ. වි. නි., විකිරණ පිරිසැකසුම් අංශය. | කර්මාන්ත හා පාරිසරික යෙදවුම් සඳහා විකිරණ මගින් බහු අවයවික බද්ධකිරිම පිළිබඳ පුහුණු වැඩමුළුව. | 14.02. 2014 18.02.2014 | වියට්නාමය | අ. ප. ශ. ඒ |
| 7 | ඩි. ජි. එල්. වික්‍රමනායක මහතා | අධ්‍යක්ෂ ජෙනරාල්, | කලාපිය සහයෝගිතා ගිවිසුමේ ක්‍රියාකාරි කණ්ඩායම් රැස්විම. | 17.02.2014 21.02.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 8 | කේ. එන්. ආර්. ප්‍රනාන්දු මහතා | ජෙ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය | ජාත්‍යන්තර ජාලය සඳහා න්‍යෂ්ටික ආරක්ෂාව පුහුණුව හා නඩත්තු මධ්‍යස්ථාන පිළිබඳ වාර්ෂික රැස්විම. | 19.02.2014 21.02.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 9 | ඊ. එ. එන්. වි. එදිරිසිංහ මහතා | ජෙ. වි. නි, සමස්ථානික ජල විද්‍යා අංශය, | ජා. ප. බ. ඒ/ ක. ස. ගි කලාපිය සහයෝගිතා ගිවිසුමේ ව්‍යාපෘති අංක RAS/7/022 මධ්‍ය වාර්ෂික විමර්ශන රැස්විම. | 30.06.2014 04.07.2014 | පිලිපීනය | අ. ප. ශ. ඒ |
| 10 | යු. ඩබ්. කේ. එච්. ද සිල්වා මහතා | ජෙ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය | ජා. ප. බ. ඒ යේ න්‍යෂ්ටික අධිකරණ තුල දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව. | 07.07.2014 10.07.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 11 | ඒ. බි. සි. ජයනි මිය | වි. නි, නිර්විනාශක පර්යේෂණ මධ්‍යස්ථානය. | පෙට්‍රෝලියම් රසායනික යන්ත්‍රාගාර විමර්ශනය සඳහා ගැමා Tomography යෙදවුම් පිළිබඳ පුහුණු වැඩමුළුව. | 14.04.2014 18.04.2014 | මැලේසියාව | අ. ප. ශ. ඒ |
| 12 | අචාර්ය. ආර්. එල්. විජේවර්ධන මහතා | සභාපති | පුර්ව දැනුම්දිම් හා සහයෝගිතා ගිවිසුම් පිළිබඳ හත්වන රැස්විම. | 19.05.2014 23.05.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 13 | කේ. ආර්. සි. ද සිල්වා මහතා | වි. නි, විකිරණ පිරිසැකසුම් අංශය. | ආහාර නිෂ්පාදන වල ගුණාත්මකභාවය වැඩි කිරිම සඳහා ඉලෙක්ට්‍රෝන කදම්භ වල යෙදවුම් පිළිබඳ පුහුණු වැඩමුළුව. | 16.06.2014 20.06.2014 | කොරියාව | ආර්. සි. ඒ. ආර්. ඕ |

**විදේශීය සම්මන්ත්‍රණ /පුහුණු වැඩසටහන් වැඩමුළු/ රැස්වීම් සඳහා ප. ශ. අධිකාරියේ නිළධාරීන්ගේ සහාභාගීත්වය -2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

| අං කය | නිළධාරියාගේ නම | තනතුර | පාඨමාලාවේ/සම්මන්ත්‍රණයේ/වැඩමුළුවේ/රැස්වීමේ හෝ සමුළුවේ අදාළ අංගයේ නම | කාලවකවානුව | රට | අනුග්‍රාහක ආයතනය |
|---|---|---|---|---|---|---|
| 14 | ඩී. සී. කේ. කේ. දිසානායක මිය | ජ. වි නි, ජෛව විද්‍යා අංශය, | වැඩි දියුණු කරන ලද අමුද්‍රව්‍ය සඳහා ඉලෙක්ට්‍රෝන කදම්භ වල යොදාගැනීම පිළිබඳ පුහුණු වැඩමුළුව. | 14.04. 2014<br>25.04.2014 | කොරියාව | ආර්. සී. ඒ. ආර්. ඕ |
| 15 | ආර්. එම්. එම්. පී. රණවීර මයා | තා. ස, විකිරණ පිරිසැකසුම් අංශය, | | | | |
| 16 | ටී. එච්. එස්. ශාන්ත මහතා | නි. අ. ,විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | ජා. ප. බ. ඒ යේ න්‍යෂ්ටික අධිකරණ තුල දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව. | 07.07.2014<br>10.07.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 17 | යූ. ඩබ්. කේ. එච්. ද සිල්වා මහතා | ජ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | විකිරණ අපද්‍රව්‍ය කලමණාකරණයේ යටිතල ව්‍යුහය ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මධ්‍ය වාර්ෂික ව්‍යාපෘති සහයෝගිතා රැස්වීම. | 10.03.2014<br>14.03.2014 | තායිලන්තය | අ. ප. ශ. ඒ |
| 18 | එස්. එස්. කේ. කොළඹගේ මහතා | ජ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | විකිරණවේදි අනතුරු සඳහා පළමු අනුකූලතා අන්තර්කලාපිය පුහුණුවන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව. | 17.03.2014<br>21.03.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 19 | ටී. එච්. එස්. තේනුවර මහතා | නි. අ, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | න්‍යෂ්ටික ආරක්ෂණ තොරතුරු කළමණාකරණ පද්ධතිය සමඟ දකුණු-නැගෙනහිර ආසියාතික කලාප දැනුම හා පලපුරුද්ද ඇතිකර ගැනීමේ උපකලාපිය රැස්වීම. | 01.04.2014<br>04.04.2014 | මැලේසියාව | අ. ප. ශ. ඒ |
| 20 | එච්. එම්. එන්. ආර්. බණ්ඩාර මහතා | නි. අ, ජාත්‍යන්තර සහයෝගිතා අංශය. | | | | |
| 21 | අචාර්ය. ආර්. එල්. විජයවර්ධන මහතා | සභාපති, | න්‍යෂ්ටික බලයේ සැලසුම්කරණය හා වර්ධනය සඳහා තීරණ ගැනීමට සහයෝගය ලබාදීමේ පුහුණු පාඨමාලාව. | 02.06.2014<br>13.06.2014 | ජපානය | අ. ප. ශ. ඒ |
| 22 | එච්. ජී. පී. කරුණාරත්න මහතා | අධ්‍යක්ෂ, ජාත්‍යන්තර සහයෝගිතා අංශය. | ව්‍යාපෘති අංක (RAS/0/069) කාර්මික සහයෝගිතා ජාතික සම්බන්ධිකරණ නිළධාරීන්ගේ රැස්වීම. | 05.05.2014<br>08.05.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 23 | එච්. එම්. එන්. ආර්. බණ්ඩාර මහතා | නි. අ. ජාත්‍යන්තර සහයෝගිතා අංශය. | | | | |
| 24 | යූ. ඩබ්. කේ. එච්. ද සිල්වා මහතා | ජ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය | විකිරණශිලි අමුද්‍රව්‍ය හා ප්‍රභවයන් ආරක්ෂාකාරි ප්‍රවාහනය වැඩි දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ යෙදවුම්. | 26.05.2014<br>30.05.2014 | මැලේසියාව | අ. ප. ශ. ඒ |
| 25 | එස්. එස් කුලතුංග මිය | අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය | ආසියාව තුල න්‍යෂ්ටික බලය සඳහා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර රැස්වීම. | 19.03.2014<br>20.03.2014 | ජපානය | ජපාන රජය |
| 26 | වී. ඒ. වඩුගේ මහතා | අධ්‍යක්ෂ,<br>ජෛව විද්‍යා අංශය. | ආහාර ආරක්ෂාව ප්‍රමිතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය: න්‍යෂ්ටික හා අදාළ තාක්ෂණික ක්‍රම පිළිබඳ යෙදවුම්. | 10.11.2014<br>13.11.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 27 | කේ. කේ. පී. අයි. කේ. කඩදුන්න මහතා | ජ.වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | INES ජාතික නිළධාරීන්ගේ තාක්ෂණික රැස්වීම. | 13.10.2014<br>17.10.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 28 | ඒ. ජයලත් මහතා | නි.අ. විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය. | ප්‍රධාන රාජ්‍ය උත්සවයන් සඳහා න්‍යෂ්ටික අධීක්ෂණය ලබා දීම පිළිබඳ රැස්වීම. | 22.04.2014<br>25.04.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 29 | පී. ඩී. මහකුමාර මයා | ජ. වි. නි, සා. වි.අංශය. | | | | |
| 30 | එච්. එම්. එන්. එල්. හඳගිරිපතිර මිය | ජ. වි. නි,<br>ජෛව විද්‍යාත්මක අංශය, ප.ශ.අ. | න්‍යෂ්ටික ක්‍රියාකාරකම් තුලින් සාගර පරිසර වලට නිදහස් වන අපවිත්‍ර කාරකයන් ඉවත් කිරීම සඳහා ආයතනිකව දත්ත හුවමාරුව හා මාත්‍රාව තක්සේරු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව. | 11.08.2014<br>22.08.2014 | මැලේසියාව | අ. ප. ශ. ඒ |
| 31 | මහේෂිකා කල්පගේ මිය | වි. නි, ජෛව විද්‍යාත්මක අංශය, | CSSI සහ FRN දත්ත ගබඩා ස්ථාපනය හා නඩත්තු කිරීම පිළිබඳ ජා. ප. බ. ඒ/ක. ස. ගි වැඩමුළුව. | 08.09.2014<br>12.09.2014 | නේපාලය | අ. ප. ශ. ඒ |

**විදේශීය සම්මන්ත්‍රණ /පුහුණු වැඩසටහන් වැඩමුළු/ රැස්වීම් සඳහා ප.ශ.අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වය 2014 - ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

| අංකය | නිළධාරියාගේ නම | තනතුර | පාඨමාලාවේ/සම්මන්ත්‍රණයේ/වැඩමුළුවේ/රැස්විමේ හෝ සමුළුවේ අදාළ අංගයේ නම | කාලවකවානුව | රට | අනුග්‍රාහක ආයතනය |
|---|---|---|---|---|---|---|
| 32 | එච්. එම්. එන්. ආර්. බණ්ඩාර මහතා | නි. අ, ජාත්‍යන්තර සහයෝගිතා අංශය, ප. ශ. අ. | ව්‍යාපෘති අංක (RAS/5/069) පළමු සමායෝජන රැස්වීම. | 02.06.2014 06.06.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 33 | ඒ. ජයලත් මහතා | නි. අ, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | ආසියානු හා පැසිපික් කලාපයේ විකිරණවේදි හා න්‍යෂ්ටික අනතුරු වලට සූදානම් විමේ වර්තමාන තත්වය විමර්ශනය කරන කලාපිය රැස්වීම. | 16.06.2014 20.06.2014 | ඉන්දුනිසියාව | අ. ප. ශ. ඒ |
| 34 | එස්. එස්. කේ. කොළඹගේ මහතා | ජ. වි නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | විකිරණ ආරක්ෂණ නිළධාරින් සඳහා පුහුණු පාඨමාලාව. | 23.06.2014 27.06.2014 | මැලේසියාව | අ. ප. ශ. ඒ |
| 35 | වි. ඒ. වඩුගේ මහතා | අධ්‍යක්ෂ, ජෛව විද්‍යා අංශය, ප. ශ. අ. | QMS වැඩසටහන ක්‍රියාවට නැංවිම සඳහා වු වැඩමුළුව. | 24.11. 2014 28.11.2014 | කාම්බෝජියා | අ. ප. ශ. ඒ |
| 36 | වි. ඒ. වඩුගේ මහතා | අධ්‍යක්ෂ, ජෛව විද්‍යා අංශය, ප. ශ. අ. | ජා. ප. බ. ඒ/ක. ස. ගි (RAS/7/021) 3වන වාර්ෂික ව්‍යාපෘති විමර්ශන රැස්වීම. | 07.07. 2014 11.07.2014 | කොරියාව | අ. ප. ශ. ඒ |
| 37 | කේ. කේ. පි. අයි. කේ. කඩදුන්න මහතා | ජ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | න්‍යෂ්ටික අධිකරණ හදුන්වාදීම පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව. | 20.05. 2014 23.05.2014 | නේදර්ලන්තය | අ. ප. ශ. ඒ |
| 38 | දුලාංජලි මදූෂා මිය | වි. නි, ජෛව විද්‍යා අංශය, ප. ශ. අ. | න්‍යෂ්ටික අධිකරණ හදුන්වාදීමේ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව. | 20.05. 2014 23.05.2014 | නේදර්ලන්තය | අ. ප. ශ. ඒ |
| 39 | පි. එන්. ජී. නිරාශා රත්නවීර මිය | වි. නි, සාමාන්‍ය විද්‍යාත්මක අංශය, ප. ශ.අ. | | | | |
| 40 | එච්. එල්. අනිල් රංජිත් මහතා | අධ්‍යක්ෂ, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | න්‍යෂ්ටික හා විකිරණශිලි ද්‍රව්‍ය ජාත්‍යන්තරව හා අභ්‍යන්තරව ප්‍රවාහනය කිරිමේදි න්‍යෂ්ටික ආරක්ෂණය පිළිබඳ රැස්වීම. | 10.06. 2014 13.06.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 41 | එච්. එම්. එන්. ආර්. බණ්ඩාර මහතා | නි. අ, ජාත්‍යන්තර සහයෝගිතා අංශය, ප. ශ. අ. | න්‍යෂ්ටික බලය සඳහා වු මානව සම්පත් සංවර්ධනයට අදාළ ජාත්‍යන්තර පාඨමාලා. | 12.05.2014 16.05.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 42 | සී. කාසීගේ මහතා | අධ්‍යක්ෂ, සාමාන්‍ය විද්‍යාත්මක අංශය, ප. ශ.අ | වෘත්තිකයන්ට අදාළ විකිරණ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර පාඨමාලාව. | 01.12.2014 05.12.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 43 | පි. ඩි. මහකුමාර මහතා | ජ. වි. නි, සාමාන්‍ය විද්‍යාත්මක අංශය , ප. ශ.අ. | විකිරණ මනින උපකරන වල අනතුරු ඇඟවීම් සඳහා වැඩිදියුණු කිරිම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ වැඩසටහන. | 10.06.2014 12.06.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 44 | එච්. එම්. එන්. එල්. හඳගිරිපතිර මිය | ජ. වි. නි, ජෛව විද්‍යාත්මක අංශය, ප.ශ.අ. | XRF වර්ණාවලිමානය යොදා ගනිමින් APM විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහන. | 28.07.2014 01.08.2014 | නවසීලන්තය | අ. ප. ශ. ඒ |
| 45 | ටි. එම්. ආර්. තෙන්නකෝන් මහතා | අධ්‍යක්ෂ, නිර්විනාශක පර්යේෂණ මධ්‍යස්ථානය, ප. ශ. අ. | ව්‍යාපෘති අංක (RAS/1/013) අවසාන ක්‍රියාකාරි විමර්ශන රැස්වීම. | 18.08.2014 22.08.2014 | වියට්නාමය | අ. ප. ශ. ඒ |
| 46 | ජී. එම්. නදීරා හේමමාලි මිය | වි. නි, සාමාන්‍ය විද්‍යාත්මක අංශය, ප.ශ. ම. | න්‍යෂ්ටික ක්ෂේත්‍රෙය් කාන්තාවන් සඳහා වු 22 වන වාර්ෂික ලෝක සමුළුව. | 22.10.2014 24.10.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 47 | කේ. එන්. ආර්. ප්‍රනාන්දු මහතා | ජ. වි නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | තෙල් හා ගෑස් කර්මාන්ත තුල විකිරණ ආරක්ෂාව පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව. | 19.10.2014 23.10.2014 | අබු ධාබි | අ. ප. ශ. ඒ |
| 48 | ආර්. එම්. එන්. ප්‍රියංග රත්නායක මහතා | වි. නි, ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය, ප. ශ. අ. | ප්‍රවිකරණ යෙදවුම් පිළිබඳ පුහුණු වැඩසටහන. | 02.12.2014 05.12.2014 | පිලිපීනය | අ. ප. ශ. ඒ |

**විදේශීය සම්මන්ත්‍රණ පුහුණු වැඩසටහන් / වැඩමුළු රැස්වීම් සඳහා ප. ශ. අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වය 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

| අංකය | නිළධාරියාගේ නම | තනතුර | පාඨමාලාවේ/සම්මන්ත්‍රණයේ/වැඩමුළුවේ/රැස්විමේ හෝ සමුළුවේ අදාළ අංගයේ නම | කාලවකවානුව | රට | අනුග්‍රාහක ආයතනය |
|---|---|---|---|---|---|---|
| 49 | ඩී. ජී. එල්. වික්‍රමනායක මහතා | අධ්‍යක්ෂ ජෙනරාල්, ප.ශ.අ. | 43 වන RCA GCM සහ 58 වන ජා. ප. බ. ඒ පොදු සමුළුව. | 19.09.2014<br>26.09.2014 | ඔස්ට්‍රියාව | ශ්‍රී ලංකා රජය |
| 50 | එච්. එම්. එන්. ආර්. බණ්ඩාර මහතා | නි. අ, ජාත්‍යන්තර සහයෝගිතා අංශය, ප. ශ. අ. | 58 වන ජා. ප. බ. ඒ පොදු සමුළුව. | 22.09.2014<br>26.09.2014 | ඔස්ට්‍රියාව | ශ්‍රී ලංකා රජය |
| 51 | ඊ. ඒ. එන්. වී. එදිරිසිංහ මහතා | ජෙ. වි. නි, සමස්ථානික ජල විද්‍යා අංශය, ප. ශ. අ. | ට්‍රිටියම් ධනරෝපය දත්ත සැකසුම හා වාර්තාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව. | 06.10.2014<br>10.10.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 52 | ඊ. ඩී. වී. සම්පත් මහතා | ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය, ප. ශ. අ. | විකිරණශීලි ප්‍රභවයන්ගේ ආරක්ෂාව පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව. | 22.09.2014<br>26.09.2014 | ජපානය | අ. ප. ශ. ඒ |
| 53 | කේ. එන්. ආර්. ප්‍රනාන්දු මහතා | ජෙ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | න්‍යෂ්ටික ආරක්ෂා පුහුණුව හා නඩත්තු මධ්‍යස්ථාන පිළිබඳ වාර්ෂික ක්‍රියාකාරි රැස්වීම. | 18.08.2014<br>20.08.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 54 | ටී. එච්. එස්. තේනුවර මහතා | නි. අ, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | විකිරණ ආරක්ෂාව සම්බන්ධ වෘත්තිය තත්වය පිළිබඳ කලාපිය රැස්වීම. | 13.10.2014<br>17.20.2014 | නේපාලය | අ. ප. ශ. ඒ |
| 55 | වී. ඒ. වඩුගේ මහතා | අධ්‍යක්ෂ, ජෛව විද්‍යා අංශය, ප. ශ. අ. | ALMERA පිළිබඳ 11වන සහයෝගිතා රැස්වීම. | 07.10.2014<br>10.10.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 56 | එච්. එම්. එන්. එල්. හඳගිරිපතිර මිය | ජෙ. වි. නි, ජෛව විද්‍යාත්මක අංශය, ප.ශ.අ. | කිරි නිෂ්පාදන වල Sr මැනිම පිළිබඳ ALMERA පුහුණු වැඩසටහන. | 03.11.2014<br>07.03.2014 | කොරියාව | අ. ප. ශ. ඒ |
| 57 | වී. ඒ. වඩුගේ මහතා | අධ්‍යක්ෂ, ජෛව විද්‍යා අංශය, ප. ශ. අ. | දේශගුණ විපර්යාස හා සාගර ජෛව පද්ධති වලට ඇති බලපෑම පිළිබඳ න්‍යෂ්ටික හා සමස්ථානික දත්තවල වැදගත්කම පිළිබඳ වැඩමුළුව. | 08.12.2014<br>12.12.2014 | මෝනා කෝ | අ. ප. ශ. ඒ |
| 58 | ටී. ජී. එස්. සංජීවනි මිය | වි. නි, ජෛව විද්‍යාත්මක අංශය, ප.ශ.අ. | APM සඳහා QA වල වැදගත්කම පිළිබඳ පුහුණු වැඩසටහන. | 22.09.2014<br>26.09.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 59 | නිර්මලී කරුණාරත්න මිය | වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | පුහුණු වැඩසටහන් හා KM පද්ධතිය වර්ධනය කිරිම සඳහා SARCON ක්‍රම විද්‍යාව භාවිතය පිළිබඳ වැඩමුළුව. | 09.09.2014<br>12.09.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 60 | ටී. එච්. එස්. තේනුවර මහතා | නි. අ, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | RASIM ජාතික සම්බන්ධීකරුවන්ගේ වැඩමුළුව. | 09.12.2014<br>12.12.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 61 | ඒ. කේ. රත්නායක මිය | නි. අ,<br>විකිරණ පිරිසැකසුම් අංශය, ප. ශ. අ. | විකිරණ තාක්ෂණය හා එහි භාවිතය පිළිබඳ 2014 RCARO/KAERI කලාපිය වැඩමුළුව. | 13.10.2014<br>24.10.2014 | කොරියාව | RCARO/KAERI |
| 62 | එච්. ජී. ප්‍රේමකුමාර මහතා | වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | නියාමනය බලාත්මක කිරිම පිළිබඳ කලාපිය පුහුණු පාඨමාලාව. | 12.10.2014<br>24.10.2014 | කටාර් | අ. ප. ශ. ඒ |
| 63 | එච්. එල්. අනිල් රංජිත් මහතා | අධ්‍යක්ෂ, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | විකිරණ ආරක්ෂණ ප්‍රතිචාර පිළිබඳ වැඩමුළුව. | 20.10.2014<br>30.10.2014 | වෝෂිංටන් | GTRI |
| 64 | එස්. එස්. කේ. කොළඹගේ මහතා | ජෙ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | | | | |

**විදේශීය සම්මන්ත්‍රණ පුහුණු වැඩසටහන් වැඩමුළු/ රැස්වීම් සඳහා ප. ශ. අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වය 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

| අංකය | නිළධාරියාගේ නම | තනතුර | පාඨමාලාවේ/සම්මන්ත්‍රණයේ/වැඩමුළුවේ/රැස්වීමේ හෝ සමුළුවේ අදාළ අංගයේ නම | කාලවකවානුව | රට | අනුග්‍රාහක ආයතනය |
|---|---|---|---|---|---|---|
| 65 | පි. එන්. ජී. නිරාෂා රත්නවීර මිය | වි. නි, සාමාන්‍ය විද්‍යාත්මක අංශය, ප. ශ.අ. | න්‍යෂ්ටික ආරක්ෂණය සඳහා තොරතුරු හා පරිගණක ආරක්ෂාව වැඩිදියුණු කිරීම පිළිබඳ කලාපීය පාඨමාලාව. | 10.11.2014<br>14.11.2014 | ඉන්දියාව | අ. ප. ශ. ඒ |
| 66 | එච්. එල්. අනිල් රංජිත් මහතා | අධ්‍යක්ෂ, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | න්‍යෂ්ටික අධීක්ෂණය පිළිබඳ මාර්ගෝපදේශක පොත්මාලාව වැඩිදියුණු කිරීම පිළිබඳ වැඩමුළුව. | 15.09.2014<br>19.09.2014 | ඔස්ට්‍රියාව | අ. ප. ශ. ඒ |
| 67 | ඒ. කේ. රත්නායක මිය | නි. අ, විකිරණ පිරිසැකසුම් අංශය, ප. ශ. අ. | පරිසර දූෂකාරක භාවිතය හා ආහාර හා කර්මාන්ත නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා ඉලෙක්ට්‍රෝන කදම්භ වල යෙදවුම් පිළිබඳ රැස්වීම. | 19.11.2014<br>20.11.2014 | මියන්මාරය | RCARO |
| 68 | කේ. එන්. ආර්. ප්‍රනාන්දු මහතා | ජෙ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය පිළිබඳ වැඩමුළුව. | 08.12.2014<br>12.12.2014 | පලාවු | අ. ප. ශ. ඒ |
| 69 | කේ. කේ. පි. අයි. කේ. කඩදුන්න මහතා | ජෙ. වි. නි, විකිරණ ආරක්ෂණ හා රෙගුලාසි අංශය, ප. ශ. අ. | අධ්‍යාපන හා පුහුණුව සඳහා ජාතික ක්‍රමයෝපායක් ගොඩනැගීම පිළිබඳ වැඩමුළුව. | 11.11.2014<br>13.11.2014 | මැලේසියාව | අ. ප. ශ. ඒ |
අධ්‍යක්ෂ අනුමැතිය මත, වාර්ෂිකව අළුත් කරන බදු කුලී ගිවිසුවක් මත ප.ශ.අ. භාවිතයට නොගෙන පවතින බිම් අඩි 545 ක ප්‍රමාණයක් පොලිප්ටෝ ලංකා (පෞද්ගලික) ආයතනයට ලබා දී ඇත. මෙම ආයතනය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ ගැසට් කර ඇති අතර, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

<u>5.තීන්දු ලබා දී නොමැති උසාවි නඩු</u>

| නඩු අංකය | පෙත්සම්කරු | වග උත්තරකරු | වර්තමාන තත්වය |
|---|---|---|---|
| HCALT 119/2010 LT/Case 08/278/2009 | පරමාණුක ශක්ති අධිකාරිය (ප.ශ.අ.) | ටී.එස්. අයිලප්පෙරුම ප.ශ.අ. හි හිටපු සේවක | LT 08/278/2009. අංක දරණ නඩුවේ කම්කරු උසාවිය විසින් හිඟ වැටුප් රහිතව වග උත්තරකරු නැවත සේවයේ පිහිටුවන ලෙස දෙන ලද තීන්දුවට එරෙහිව ප.ශ.අ. විසින් මහාධිකරණයේ අභියාචනාවක් කර ඇත.<br>කම්කරු උසාවිය දෙන ලද උපදෙස් මත රු. 223,560/- ක මුදලක් වග උත්තරකරු වෙනුවෙන් තැන්පත් කර ඇති අතර අදාල ඉතිරිකිරීමේ ගිණුම කම්කරු උසාවිය භාරයේ තබා ඇත. |
| උපරිමාධිකරණ නඩුව FR 662/2010 | ප.ශ.අ. මහතකු විසින් කළමණාකරන සේවා අංක 30 දරණ චක්‍රලේඛය අනුව සේවා කාණ්ඩ කිරීමේ දී ඇති වූ වැටුප් විමර්ශන පිළිබඳව නඩු පවරා ඇත. | වැටුප් කොමිසම හා ප.ශ.අ. | මෙම නඩුව 2015 ඔක්තෝබර් 15 දින නැවත සාකච්ඡාවට ගැනීමට නියමිතය. |

**6.බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ ව්‍යාපෘතියේ ඇති වත්කම් වල අයිතිය තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මඟින් පරමාණුක ශක්ති අධිකාරියට පැවරීම**

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2011 මාර්තු 25 දින පැවති රැස්වීමේ දී බහුකාර්යය ගැමා ප්‍රවිකිරණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිම කල බවට සහතිකය ලද පසු හා යන්ත්‍රාගාරය ස්ථාපිත කළ පසු එහි අයිතිය පරමාණුක ශක්ති අධිකාරියට පැවරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වන ලදී.

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව 2013 හා 2014 වසරේ දී අවශ්‍ය බඳවා ගැනීම් සිදුකර ඇත. 2014 ජනවාරි මස සිට ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය නමින් එහි ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන ලදී.

මෙම ගැමා මධ්‍යස්ථානය පිහිටුවා ඇති ඉඩමේ අයිතිය ආයෝජන මණ්ඩලය විසින් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත බදු ගිවිසුමක් මත පවරා ඇති අතර, 2014 නොවැම්බර් 20 දින පැවති කමිටු රැස්වීමේ දී උප බදු ගිවිසුමක් මගින් ඉඩමේ අයිතිය පරමාණුක ශක්ති අධිකාරිය වෙත පවරන බව දැනුම් දී ඇත.
ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ වත්කම් හා අයිතම් ලේඛණ ගත කිරීම දැනට සිදුකෙරෙමින් පවතින අතර, ඒවා ඉදිරියේ දී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට පවරාගැනීම සිදුකෙරෙනු ඇත.

ගැමා මධ්‍යස්ථානයේ නිල අයිතිය මෙතෙක් පරමාණුක ශක්ති අධිකාරිය වෙත පවරා නොමැති බැවින් අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය විසින් ප්‍රදානය කරනු ලැබූ විද්‍යාත්මක උපකරණ හා මිළදී ගත් වත්කම් ගැමා ප්‍රවිකිරණ ව්‍යාපෘතිය යටතේ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර ඇති අතර කොබෝල්ට් 60 විකිරණශීලී ද්‍රව්‍යයේ වැයවීම එම ආයතනයේ මෙහෙයුම් වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත.

**6.1 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය විසින් අසුරුම් ද්‍රව්‍ය වෙනුවෙන් අයකිරීම්**

ගැමා මධ්‍යස්ථානයේ ප්‍රධාන ගනුදෙනු ආයතනය විසින් අදාළ අයිතම් ප්‍රවිකිරණය කළ පසු කෘමි උවදුරු වලට ලක්වූ බැවින් 2014 අගෝස්තු 01 දිනැති ලිපියෙන් හානි පූරණය සඳහා රු. 1,389,140.00 ක මුදලක් ද බහාලුම සඳහා රු.365,450.00 ක මුදලක් ද ඉල්ලා ඇත.

ඉහතින් ඉල්ලා ඇති මුදල අඩුකරවා ගැනීමට හෝ අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ගබඩා කිරීමේ ගාස්තුවට හිලව් කිරීමට අදාල ආයතනය සමග සාකච්ඡා කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් ලබා දී ඇත.

6.2 නිෂ්පාදන අනුරුව ( Dummy Products) සඳහා දරණු ලැබූ වියදම්

ඉහත සඳහන් Dummy අයිතම් සකස් කිරීම සඳහා මිළදී ගනු ලැබූ මිරිස් කුඩු හා සහල් නිවුඩ්ඩ සඳහා පිළිවෙලින් රු. 67,500/= හා රු.429,247.50 ක මුදලක් වියදමට කපා හැර තිබුණි.

7.තාක්ෂණ හා සහයෝගීතාව යටතේ අන්තර්ජාතික පරමාණුශක්ති ඒජන්සියෙන් ලද ප්‍රදාන

ශ්‍රී ලංකාවේ පරමාණුක ශක්ති අධිකාරිය අන්තර්ජාතික පරමාණු ශක්ති ඒජන්සියේ නාභි ලක්ෂ්‍ය ලෙස ක්‍රියා කරමින් එහි තාක්ෂණික සහයෝගීතා වැඩසටහන් යටතේ න්‍යෂ්ටික තාක්ෂණය ශ්‍රී ලංකාවේ දියුණු කිරීමට කටයුතු කරමින් සිටී.

අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය මගින් පහත සඳහන් තාක්ෂණ සහයෝගීතා ව්‍යාපෘති යටතේ පරමාණු ශක්ති අධිකාරිය වෙත ප්‍රදානය කරන ලද වත්කම් හා පාරිභෝගික ද්‍රව්‍ය ගිණුම් ගත කර ඇත.

| | ව්‍යාපෘති අංකය | විස්තරය | වෙන් කරන ලද යූරෝ (€) | වෙන් කරන ලද මුදල රු. | වත්කම් හා පාරිභෝගික ද්‍රව්‍ය වටිනාකම මුදල් රු. |
|---|---|---|---|---|---|
| | SRL/0/010 | විකිරණශීලී ආරක්ෂිත වැඩසටහන ශක්තිමත් කිරීම හා න්‍යෂ්ටික විශ්ලේෂණ හා පර්යේෂණ ආයතනය | 103035 | 18,000,000 | 16,654,970 |
| | එම | එම | | | 1,318,900 |
| | SLR/1008 | ගැමා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු ආරක්ෂාකාරීව හා ක්‍රමවත්ව කරගෙන යාම සඳහා ලබාදෙන තාක්ෂණ සහයෝගීතාව | 122,000 | 21,960,000 | 1,709,400 |
| | | **මුළු එකතුව** | | | **19,683,270** |

ඉහත සඳහන් තාක්ෂණ සහයෝගීතාවයට අමතරව පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් මඟින් අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සියෙන් ආධාර ඇතිව පරමාණුක ශක්ති අධිකාරියේ නිළධාරීන් හා වෙනත් ආයතන වල නිළධාරීන් පුහුණු කර ඇත.

පරමාණුක ශක්ති අධිකාරිය වෙත අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය මඟින් ලබාදෙන ඉහතකී දායකත්වය සඳහා ශ්‍රී ලංකා රජය ජාතික සහභාගිවීමේ පිරිවැය (NPC) ලෙස පහත සඳහන් ගෙවීම් සිදු කරන ලදී.

1. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් 2014 වසර සඳහා නිත්‍ය අයවැය ලෙස ගෙවිය යුතු ශ්‍රී ලංකා රුපියල් මිලියන 15 ක මුදලක් ගෙවන ලදී.

2. වැඩසටහන් තක්සේරු කිරීමේ පිරිවැය (CPC) හා ජාතික සහභාගීත්ව පිරිවැය (NPC) ලෙස ශ්‍රී ලාංකා රු මි. 6 ක් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ගෙවන ලදී.

7.1 පිරිවැය බෙදාගැනීමේ පදනම මත භාණ්ඩ ප්‍රසම්පාදනය

අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සියේ සාමාජික රටවල න්‍යෂ්ටික තාක්ෂණය නංවාලීමට අදාළ ව්‍යාපෘති සඳහා අවශ්‍ය විද්‍යාත්මක උපකරණ හා පාරිභෝගික ද්‍රව්‍ය පිරිවැය බෙදාගැනීමේ පදනම මත මිලදී ගැනීමේ ක්‍රමවේදයක් ඇත. අමාත්‍ය මණ්ඩල අංක 12/0881/516/028 TBR පත්‍රිකාවට අනුකූලව මේ සඳහා අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව ,

පහත සඳහන් අයිතම් 3 මිලදී ගැනීමේ කටයුතු කරන ලදී.

| | විස්තරය | උපකරණය | වටිනාකම රු. |
|---|---|---|---|
| | 2013.12.31 දිනට ඉ/ගෙ ශේෂය | X-කිරණ උපකරණය – සාමාන්‍ය විද්‍යාත්මක අංශය හා ජෛව විද්‍යාත්මක අංශය සඳහා ගැමා වර්ණාවලි මිතික උපකරණය | 38,905,871 |
| | 2014 වසරේ දී ප්‍රේෂණය කරන ලද මුදල | අතේ ගෙන යා හැකි X-කිරණ වර්ණාවලි මිතික උපකරණය | 6,016,403 |
| | මුළු එකතුව | | 4,922,274 |
| | 2014 වසර තුලදී ප්‍රසම්පාදනය කල වත්කම් | X-කිරණ උපකරණය - සාමාන්‍ය විද්‍යාත්මක අංශය හා ජෛව විද්‍යා අංශයේ ගැමා වර්ණාවලිමිතික උපකරණය | 35,314,671 |
| | අන්තර්ජාතික පරමාණුබල ඒජන්සියෙන් ලැබීමට නියමිත විද්‍යාත්මක උපකරණ වලට අදාල ප්‍රේෂණය කරන ලද මුදල | | 9,607,603 |

**8.** 1981 -2014 වසරවල් වලට අදාලව ගෙවිය යුතු හිඟ සේවක අර්ථසාධක හා සේවක භාර අරමුදල්

පරමාණුක ශක්ති අධිකාරිය සේවක අර්ථසාධක මුදලට දායක වීමේ ප්‍රතිපත්තිය 2011.05.26 දින සිට 12% සිට 15% දක්වා වැඩි කිරීමට 2012.12.07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත තීරණය විය.

ප.ශ.අ. සේවක මණ්ඩලයේ ඉල්ලීම මත 1981 සිට බලපැවැත්වෙන පරිදි හිඟ EPF මුදල අදාල සේවකයන්ට ගෙවන ලෙස ඉල්ලීමක් කර ඇති අතර අදාල අනුමැතිය සඳහා මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.

දඩ මුදල් රහිත අපේක්ෂිත වැය පහත පරිදි වේ.

රු. මිලියන

| විස්තරය | අනු එකතුව රු. | මුළු එකතුව රු. |
|---|---|---|
| 1981 සිට 2011 දක්වා සේවක අර්ථ සාධක අරමුදල් ගෙවිය යුතු මුදල | 5.9 | |
| 2017 සිට 2011 දක්වා ජීවන වියදම් දීමනා වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් | 3.7 | |
| 2014 ජනවාරි සිට 2014 මැයි දක්වා ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් | 1.4 | 11.00 |
| | | |
| 2007 සිට 2014 දක්වා සේවක භාර අරමුදල් ගෙවිය යුතු මුදල | | 5.70 |

**9.** ආවරණය කරන ලද අලාභ (**Liquidated Damages**)

**ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කරමින් ප.ශ.අ. යේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරන අතර සැපයුම් කරුවන් විසින් අදාල ගිවිසුම් උල්ලන්ගනය කිරීම හේතුවෙන් පහත පරිදි දඩ මුදල් අයකර ගන්නා ලදී.**

| සැපයුම්කරුවන්ගේ නම | උපකරණයේ නම | කොන්ත්‍රාත් වටිනාකම | ප්‍රමාදය | අඩු කරන ලද මුදල % | අයකරගත් දඩ මුදල |
|---|---|---|---|---|---|
| **හේලීස් ලයිෆ් සයන්ස් පුද්ගලික සමාගම** | **අයන වර්ණලේඛ උපකරණය** (Iron Chromatography) | 8,345,000 | **සති** 10 | 10% | 834,500 |
| **පෝටෝන් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම** | **අතේ ගෙන යා හැකි ගැමා මිණුම් උපකරණය** (Hand held gamma survey meters) 5 **කි.** | 11,755,000 | **සති** 3 | 3% | 352,650 |

**මුළු එකතුව රු.** 1,187,150

අයකර ගන්නා ලද මුදල ප්‍රාග්ධන හා සංචිත යටතේ ප්‍රාග්ධන ලැබීම (Capital Gain) ලෙස මූල්‍ය තත්වය ප්‍රකාශනයේ හා ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනයේ දක්වා ඇත.

## ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය - අපනයන සැකසුම් කලාපය - බියගම
## 2014.12.31 දිනට ආදායම් වියදම් ලේඛණය

| | | | |
|---|---|---|---|
| විකුණුම් ආදායම | | 44,008,113.07 | |
| **විකුණුම් පිරිවැය** | | | |
| ආරම්භක තොගය | 466,583.89 | | |
| **එකතුකලා** | | | |
| ගැණුම් | 1,133,623.90 | | |
| | 1,600,207.79 | | |
| **අඩු කලා** | | | |
| අවසාන තොගය | 1,021,087.17 | 579,120.62 | |
| ශුද්ධ ලාභය | | | 43,428,992.45 |
| **පරිපාලන මෙහෙයුම් වියදම්** | | | |
| වැටුප් | 7,519,663.07 | | |
| යන්ත්‍ර ක්‍රියාකිරීමේ කළමණාකරුගේ දීමනාව | 234,000.00 | | |
| පුහුණු සේවකයින්ගේ දීමනාව | 84,500.00 | | |
| අතිකාල දීමනා | 1,219,990.91 | | |
| වැඩමුර දීමනාව | 1,657,000.00 | | |
| ආහාර දීමනා | 124,000.00 | | |
| සේවක පුහුණු වියදම් | 74,928.05 | | |
| ප්‍රවාහන වියදම් | 1,541,589.73 | | |
| විදුලිය | 5,425,138.56 | | |
| දුරකතන | 262,641.75 | | |
| ජලය | 135,939.27 | | |
| ගොඩනැගිලි නඩත්තුව | 694,180.06 | | |
| ආයතනය විවෘත කිරීමේ උත්සවය වියදම් | 2,622,361.00 | | |
| කුලී | 263,666.67 | | |
| ආරක්ෂණ | 2,853,500.00 | | |
| මිනිස්බල සම්පත | 3,519,660.58 | | |
| ලිපිද්‍රව්‍ය | 655,482.50 | | |
| උපකරණ නඩත්තුව | 298,654.50 | | |
| ශ්‍රී ලංකා ප්‍රමිති වෙනුවෙන් වියදම් | 190,500.00 | | |
| ගමන් වියදම් | 3,700.00 | | |
| සුභ සාධන වියදම් | 210,143.85 | | |
| රක්ෂණය | 681,048.49 | | |
| නීති ගාස්තු | 3,000.00 | | |
| වෛද්‍ය ගාස්තු ප්‍රතිපූරණය | 292,625.67 | | |
| ප්‍රචාරණය | 62,850.00 | | |
| දොරටු අවසර පත්‍ර සඳහා | 17,572.68 | | |
| මුද්‍රණ වියදම් | 2,680.00 | | |
| සංග්‍රහ වියදම් | 36,848.79 | | |
| තැපැල් ගාස්තු | 9,323.00 | 30,697,189.13 | |
| **විකුණුම් හා බෙදාහැරීම් වියදම්** | | | |
| Co $60^0$ විකිරණශීලී ප්‍රභවයේ ක්ෂය වීමේ වැයවීම | 14,052,726.10 | | |
| මුදාගැනීමේ ගාස්තු | 91,233.93 | | |
| බහාලුම් කුලී ගාස්තුව | 365,450.00 | | |
| ඉන්ධන | 1,105,372.33 | 15,614,782.36 | |
| **මූල්‍ය හා වෙනත්** | | | |
| වෙනත් වියදම් | 57,807.37 | 57,807.37 | 46,369,778.86 |
| **ශුද්ධ ලාභය /(අලාභය)** | | | (2,940,786.41) |

සටහන: ක්ෂය හා ජංගම වත්කම් නොවන වියදම් හැර සංඛ්‍යා ලේඛණ ඉහතින් දැක්වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. ඊඑච්/බී/ඒඊඒ/1/14/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2015 දෙසැම්බර් 04 දින |

සභාපති

පරමාණුක බලශක්ති මණ්ඩලය

**පරමාණුක බලශක්ති අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පරමාණුක බලශක්ති අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය පනතේ 32(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පරමාණුක බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං රා ගි ප්‍ර)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව, මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන පිළියෙල කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) යන ප්‍රමිතීන් දෙකම යොදා ගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 7 දේපල, පිරියත හා උපකරණ හි දක්වා ඇති පරිදි ශේෂපත්‍ර දිනට තීරණය කළයුතු සාධාරණ අගයෙන්, ධාරණ අගයන් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව තහවුරු කර ගැනීම සඳහා අධිකාරිය විසින් එහි දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද, ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව අඛණ්ඩව භාවිතා කළ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් පිළිබඳ ඓතිහාසික පිරිවැය 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 129.39 ක් විය.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ සඳහා නියාමන අයවැයට (Regulatory Budget) අදාළව ගෙවිය යුතු රු.16,826,190 ක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියට (IAEA) ශ්‍රී ලංකා රජය විසින් නිරවුල් කළ යුතු මූල්‍ය වගකීම සඳහා රු.මිලියන 15 ක මුදලක් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණි. කෙසේ වුවද මෙම අරමුදල් යොදා ගනිමින් අධිකාරිය විසින් රු.14,864,257

ක මුදලක් පමණක් නිරවුල් කර තිබූ අතර, ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.1,961,933 ක් විය. තවද අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රදානය හා ගෙවිය යුතු මුදල නිරවුල් කිරීම සඳහා අධිකාරිය විසින් ගෙවන ලද මුදල ගිණුම්ගත කර නොතිබූ අතර අමාත්‍යාංශයෙන් ලැබුණු අරමුදල්වල ශේෂය වූ රු.136,049 පමණක් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වෙළඳ ශේෂය යටතේ දක්වා තිබුණි.

(ආ) රු.121,144,190 ක් වූ බහු කාර්ය ගැමා විකිරණ පහසුකම් (Multi – Purpose Gamma Irradiation Facility) ව්‍යාපෘතියට යොදා ගන්නා ලද කෝබල්ට් 60 ප්‍රභවයේ 250 KCi හි මුළු මිලදීගැනීම් පිරිවැය අධිකාරියේ ගිණුම්වලට ගෙන නොතිබූ අතර ඒ වෙනුවට 2014 වර්ෂය තුළ අධිකාරිය විසින් දරන ලද රු.33,156,406 ක මුදල හා රු.14,052,726 ක් වූ ක්ෂයවීම් පිරිවැය බහු කාර්ය ගැමා විකිරණ පහසුකම් ව්‍යාපෘති ගිණුමට (MGIF) ගිණුම්ගත කර සමාලෝචිත වර්ෂය අවසානයට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් (MGIF ව්‍යාපෘතිය) ලැබිය යුතු මුදල් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුදල සනාථ කරගෙන නොතිබුණි. කෙසේ වුවද බහුකාර්ය ගැමා විකිරණ පහසුකම් (MGIF) ව්‍යාපෘතියෙන් උපයන ලද ආදායම හා 2014 වර්ෂයේදී එම පහසුකම සම්බන්ධයෙන් අධිකාරිය විසින් දරන ලද වෙනත් වියදම් පිළිවෙලින් රු.44,008,113 ක් හා රු.35,020,267 ක් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එබැවින් 2014 වර්ෂය සඳහා බහුකාර්ය ගැමා විකිරණ පහසුකම් ව්‍යාපෘතියේ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවලින් සාධාරණව නිරූපනය වී නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල හා ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන මුදල අතර රු.276,517 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වෙළඳ ශේෂය වූ රු.4,803,479 න් රු.1,867,801 ක මුදලක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 1 සිට 9 දක්වා කාලයක් හිඟ හිට පැවතුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් විද්‍යාත්මක උපකරණ හා ජංගම නොවන වත්කම් සඳහා අත්තිකාරම් ගෙවීම් යටතේ ඇතුළත් එකතුව රු.9,639,453 ක් වූ විද්‍යාත්මක උපකරණ හා ප්‍රයෝජනයට ගත නොහැකි විෂයයන් සමීක්ෂණය කිරීම පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂය තුළදී අධිකාරියට භාර දෙන ලද රු.13,952,795 ක් වූ විකිරණශීලී ද්‍රව්‍ය සහ වෙනත් සමහර සමාන ද්‍රව්‍ය (වටිනාකම හඳුනාගත නොහැකි) පිළිබඳ භාරකාරීත්වය, බෙදාහැරීම හා උපයෝජනය සහ ඒවා ප්‍රයෝජනයට ගනිමින් සපයන ලද සේවා විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අදාළ ප්‍රතිග්‍රාහක ආයතන හා ප්‍රතිපාර්ශවීය ආයතන පිළිබඳ සම්බන්ධීකරණය සහිතව ලබා දී ඇති කාලපරිච්ඡේදය ඇතුළත අධිකාරිය විසින් ව්‍යාපෘති නිම කිරීම ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (International Atomic Energy Agency) විසින් අපේක්ෂා කරනු ලැබේ. කෙසේ වුවද ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් අනුමත කරන ලද අරමුදල් උපයෝජනයට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් අධිකාරිය විසින් පහත සඳහන් ක්ෂේත්‍ර පාලනය කිරීමේ කටයුතු පිළිබඳව විගණනයේදී තහවුරු නොවීය.

(i) ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරිය විසින් අනුමත කරන ලද ව්‍යාපෘතිවල කාර්යයන් සහ එහි ප්‍රගතිය සටහන් කිරීම හා වාර්තා කිරීම.

(ii) අනුමත ව්‍යාපෘති සඳහා ප්‍රදාන නියෝජිතායතන විසින් සපයන ලද අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව වෙන්කිරීම සහ උපයෝජනය

(iii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළවන වර්තමාන කාර්යසාධනය

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2014 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (SLGC) හා නිර්විනාශක පරීක්ෂණ සඳහා ජාතික මධ්‍යස්ථානය (National Centre for Non-destructive Testing) ආදී සමහර අංශවල ස්ථාවර වත්කම්වල පැවැත්ම සත්‍යාපනය කර නොතිබුණි. |
| (ආ) | යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.4 වගන්තිය | දේශීය/විදේශීය පුහුණුව සඳහා පුද්ගලයන් තෝරාගැනීම සම්බන්ධයෙන් පරිපාටි සකස් කිරීම සඳහා අධිකාරිය විසින් පුහුණු පිළිබඳ කමිටුවක් (අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක්) පත්කර නොතිබුණි. තවද සහභාගී වීම සඳහා වඩාත් සුදුසු නිලධාරීන්ට අවස්ථාව ලබාදීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් නැවත නැවත සහභාගී වීමේ අවස්ථා තිබුණි. |
| (ඇ) | 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පෙර මුදල් වර්ෂය තුළ පාඩුවක් වාර්තා කරන ලද හා අවසාන මුදල් වර්ෂයට සාපේක්ෂව පාඩුව අඩුකර ගැනීමට නොහැකි වූ රජයේ සංස්ථාවක සේවය කරන සේවකයින් 2014 වර්ෂය සඳහා රු.2,000 ක ප්‍රසාද දීමනා වලට පමණක් හිමිකම් දරනු ලැබේ. කෙසේ වුවද අධිකාරිය විසින් එක් සේවකයෙකුට රු.13,500 බැගින්, ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබූ අතර චක්‍රලේඛ උපදෙස් සැලකීමෙන් තොරව 2014 වර්ෂය සඳහා එසේ ගෙවන ලද මුදල රු.1,705,364 ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.25,596,777 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,176,945 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,419,832 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ මුළු ආදායම රු.50,637,815 කින් හෙවත් සියයට 38.5 කින් වැඩි වී තිබුණද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු වියදම රු.61,057,648 කින් හෙවත් සියයට 41.6 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් දායක වූ කරුණ විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (Sri Lanka Gamma Centre)

2006 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස බහුකාර්ය ගැමා විකිරණ පහසුකම් (Multipurpose Gamma Irradiator Facility) ව්‍යාපෘතිය අධිකාරිය විසින් ආරම්භ කරන ලද අතර බියගම අපනයන සැකසුම් කලාපයේ වර්ෂ 30 ක් සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට බදු දෙන ලද පරිශ්‍රය තුළ ස්ථානගත කර තිබුණි. ව්‍යාපෘතියේ වාණිජ කටයුතු 2014 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉඩමේ කල් බදු හිමිකම තවමත් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින බැවින් අධිකාරිය විසින් ආයෝජන මණ්ඩලය (BOI) සමඟ අවබෝධතා ලියවිල්ලකට (MOU) හෝ ගිවිසුමකට එළඹ නොතිබුණි. මෙම ගැමා මධ්‍යස්ථානය සඳහා අමාත්‍යාංශය දරන ලද මුදල රු.මිලියන 746.6 ක් විය.

(ii) මධ්‍යස්ථානයේ අයිතිය 2015 අගෝස්තු 31 වන විටත් අධිකාරියට පවරා ගෙන නොතිබුණි.

(iii) දේශීය වෙළඳපොලට නිෂ්පාදන සපයන සැපයුම්කරුවන් සඳහා සේවා සැපයීම සඳහා පමණක් ප්‍රමාණවත් වන ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ පද්ධතිය (Quality Management System) පමණක් ව්‍යාපෘතිය විසින් ලබාගෙන තිබුණි.කෙසේ වුවද ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා විශේෂයෙන් වෛද්‍ය ලාංඡන උපකරණවලට (medical devices) අදාළව ජාත්‍යන්තර වෙළඳපොලට අවශ්‍ය දේ සපයන සැපයුම්කරුවන් සඳහා සේවා සැපයීමට අවශ්‍යවන ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිති සහතිකය (ISO 13485:2003 තත්ත්ව කළමනාකරණ පද්ධතිය) ලබා ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය විසින් සේවා සැපයීම රටේ සමස්ත අවශ්‍යතාවය කේන්ද්‍ර කර ගෙන නොතිබුණි. ඉතා ඉහළ තත්ත්ව මට්ටමකින් එම සේවා සපයන වෙනත් සමහර ආයතන වෙළඳපොලෙහි ක්‍රියාත්මක වන බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(iv) ව්‍යාපෘතියේ විකිරණශීලි ප්‍රභවයේ සැලසුම්ගත කාර්යය කියුරිස් (curies) (kci) 3,000 ක් වුවද 250 (kci) විකිරණශීලි ප්‍රභවය පමණක් භාවිතා කර තිබුණි. එබැවින් ව්‍යාපෘතිය විසින් සම්පූර්ණ ධාරිතාවය ප්‍රශස්ත වශයෙන් භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(v) ව්‍යාපෘතියේ සැලසුම් කරන ලද මානව සම්පත් (HR) අවශ්‍යතාවයන් අනුමත සේවක සංඛ්‍යාවට අනුකූල නොවීය. එබැවින් මෙහෙයුම්වල අපේක්ෂිත මට්ටම හා වෙළඳපොල ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

## 4.2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

ගබඩා ස්වයංක්‍රීයකරණය කිරීමේ අරමුණ සඳහා 2011 වර්ෂය තුළදී රු.389,375 කට මිලදී ගත් පරිගණක මෘදුකාංග පැකේජයක් 2014 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. කෙසේ වුවද එම මෘදුකාංගය අරමුණු කළ කාර්යය සඳහා කිසිසේත්ම භාවිතා කර නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන කරුණු

---

යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ විධිවිධානවලට පටහැනිව තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවය සඳහා අධිකාරිය විසින් රු.2,153,424 ක මුදලක් ගෙවා තිබුණි.

4.4 ඵල රහිත වියදම්

---

රු.1,440,000 ක් වූ විකිරණශීලි ද්‍රව්‍ය විෂයයන් 15 ක් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද ඒ හා සමාන ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් තොරව අධිකාරියේ තොගවල පැවතුණි.

4.5 මානව සම්පත් කළමනාකරණය

---

කාලීන සමාලෝචනයක් කිරීම මගින් තාත්වික සේවක සංඛ්‍යා මට්ටමක් පවත්වා ගැනීමට අධිකාරියට නොහැකි වීම පෙන්නුම් කරමින් 2014 වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිවල තනතුරු 4 ක්, ද්විතිය ශ්‍රේණිවල තනතුරු 23 ක් හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු 12 ක් ඇතුළත් විවිධ සේවක වර්ගවල පුරප්පාඩු 39 ක් නිරීක්ෂණය විය.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

5.1 අභ්‍යන්තර විගණනය

---

අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය එක් නිලධාරියෙකුගෙන් පමණක් සමන්විත වී තිබූ අතර අතිරේක වැඩ ප්‍රමාණයක්ද අභ්‍යන්තර විගණකට පවරා තිබුණි. ඒ අනුව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය නියාමනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යයන් සුදුසු පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය

5.2 විගණන කමිටුව

---

විගණන කමිටුව විසින් කරන ලද නිර්දේශයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිචාර නොදැක්වීම් අවස්ථා නිරීක්ෂණය විය.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

අධිකාරිය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට හා අයවැය ලේඛනයට අනුකූල නොවිය.

## 5.4 අයවැය පාලනය

-----------------------

අයවැයගත හා තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ සැලකිය යුතු පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) දේපල, පිරියත හා උපකරණ පිළිබඳ පාලනය

(ආ) ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල්

(ඇ) නීති,රීති ආදියට අනුකූල වීම.

(ඈ) ප්‍රසම්පාදනයන්

(ඉ) සම්පත් උපයෝජනය

(ඊ) මානව සම්පත් කළමනාකරණය

(උ) වත්කම් කළමනාකරණය

(ඌ) අයවැය පාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

<u>2014 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු</u>

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** හැර මතය

පිළිගනී

**2.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.**

**2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති **(SLPSAS)**

(අ) සුදුසු සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූල වන පරිදි 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අයත් දේපල පිරියත හා උපකරණ සඳහා සාධාරණ අගයන් ගිණුම්වල දැක්වීමේ අරමුණින් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා පියවර ගෙන ඇත.

**2.2.2. ගිණුම්කරණ දෝෂ**

(අ) ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියට ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු 2014 වර්ෂයට අදාළ වාර්ෂික දායක මුදල් පියවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන විදුලිබල හා පුනර්ජනනීය අමාත්‍යාංශයෙන් අත්තිකාරමක් ලෙස ලැබුණු අතර අදාළ වාරික මුදල් ගෙවූ පසු ඉතිරිය 2015 වසරේදී අමාත්‍යාංශය වෙත පියවන ලදී.

(ආ) බහුකාර්ය ගැමා ප්‍රතක්කාරක ව්‍යාපෘතිය සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ අරමුදල් වලින් කරන ලද වියදම් රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදලක් සේ ගිණුම් ගත කරන ලදී. එසේ කරන ලද්දේ අදාළ ව්‍යාපෘතිය තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ බැවිනි. ව්‍යාපෘතිය අවසන් වී අදාළ වත්කම් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත පැවරූ පසුව අදාළ වියදම් සුදුසු පරිදි වත්කම් හෝ වියදම් ලෙස ශ්‍රී ලංකා පරමාණු බලශක්ති මණ්ඩලය යටතේ ගිණුම ගත කරන ලදී.

**2.2.3. පැහැදිළි නොකරන ලද වෙනස්කම්**

ස්ථාවර වත්කම් ලේඛණය සහ ගිණුම් අතර රු.276,517 ක වෙනසක් දක්නට ලැබේ. මෙකී වෙනස ආරම්භක ශේෂයන් අතර ඇති වෙනසක් වන අතර 1977 වසරට ද කලින් සිදුවී ඇති වෙනසකි අදාළ කාලසීමාව සඳහා වූ ලේඛණ වල අඩුපාඩු නිසා මෙකී වෙනසට හේතු සෙවීම අපහසු වී ඇත. කෙසේ වෙතත් අධිකාරියේ වත්කම් පැවරීමේ දී ආරම්භක ශේෂයන් භෞතිකව පරීක්ෂා කොට ගිණුම ගත කිරීමට අපේක්ෂා කරන අතර ඒ අනුව අදාළ ලේඛණ අතර ඇති වෙනස්කම් සැසඳීම කල හැකිවේ.

**2.2.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**රු. 191,368ක් වූ 2005 සිට 2013 දක්වා කාලසීමාව සඳහා වූ පැරණි ණයගැතියන් ද ඇතුළුව රු. 2,537,004 ක මුදලක් 2016 මාර්තු වන විට පියවා තිබුණි.**

දැනට **පුද්ගලමිතික (**TLD) සේවාව සහ නිර්විනාශක පරීක්ෂණ අධික්ෂණ සේවාව හා පුහුණු වැඩසටහන් සඳහා පමණක් ණය පදනම යටතේ සේවා සපයනු ලැබේ. අනෙකුත් සේවා සඳහා අදාළ සේවා ගාස්තු කලින් අය කරගනු ලැබේ.

**පුද්ගලමිතික සේවාව විකිරණ සඳහා ආවරණය වන සේවකයින් සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ නියාමන කටයුත්තක් ලෙස ඉටු කරනු ලැබේ. එම නිසා ප.ශ.අ. විසින් එකී සේවාව ණය පදනම යටතේ වුවද ඉටු කිරීමට සිදු වී ඇත.** ඊට අමතරව නිර්විනාශක පරීක්ෂණ සේවාව සඳහා අයකිරීම් සඳහා ඉන්වොයිස් කිරීමට අදාළ රාජකාරිය අවසන්වී එම වැඩ පරිමාණය මැනීම් කිරීමෙන් පසුව පමණක් හැකි වේ. කෙසේ වුවද 2015 වසරේ සිට නිර්විනාශක පරීක්ෂණ සේවා සැපයීමේ දී ප්‍රමාණවත් අත්තිකාරමක් අයකරගැනීමෙන් අනතුරුව සේවා ඉටු කරන ලෙස නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වෙත උපදෙස් දී ඇත.

**පරමාණුක ශක්ති අධිකාරිය යටතේ 2014.12.31 දිනට අයවීමට තිබූ විකිරණ ආරක්ෂණ අංශයට අදාළ ණය ගැතියන් 2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ** XIV **ඡේදයට අනුකූලව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත පැවරීමට කටයුතු යොදා ඇත.**

**2016 මාර්තු මාසය වන විට මුළු ණය ගැතියන්ගේ රු. මිලියන 2.6 ක් පමණ අයකරගෙන ඇති අතර ඉතිරි ණයගැතියන් අයකරගැනීමට ද අවශ්‍ය පියවර ගනු ලැබේ. ඉතිරි ණය ගැතියන්ගෙන් 90% ක් පමණ රාජ්‍ය ආයතන වේ.**

**2.2.5.විගණනය සඳහා ඉදිරිපත් නොකල සාක්ෂි**

(අ) රු. 31,850 ක් වූ ප්‍රයෝජනයට ගත නොහැකි උපකරණ සහ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය වෙත අත්තිකාරම් වශයෙන් ගෙවා ඇති රු. 9,607,602.79 ක් වූ ගෙවීම් මෙම කරුණට අදාළ වේ.

ප්‍රයෝජනයට ගත නොහැකි උපකරණ සම්බන්ධව වාර්තා ගබඩාව සතුව තිබෙන අතර ඒවා යථා කාලයේ දි ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

රු. මිලියන 9.6 ක් වූ මුදල ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ පිරිවැය බෙදාගැනීමේ ක්‍රමය යටතේ උපකරණ ආනයනය සඳහා පරමාණුක ශක්ති අධිකාරිය විසින් ගෙවන ලද අත්තිකාරම් මුදල වේ. මෙම මුදලින් රු මිලියන 6.6 ක් වටිනා භාණ්ඩ දැනටමත් ලැබී තිබේ. ඉතිරි මුදල ජා.ප.ශ. ඒජන්සියෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම වල සටහන් වේ. ඊට හේතුව වනුයේ ලැබුණු භාණ්ඩ සඳහා වූ ඉන්වොයිසියේ වටිනාකම හා ඒ සඳහා ගෙවා ඇති මුදල අතර ඇති වෙනසයි. මෙම වෙනසට හේතුව ජා.ප.බ.ශ. ඒජන්සිය සමග සාකච්ඡා කොට සමථයකට පත්කරගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ)**විකිරණ ආරක්ෂණ අංශය විසින් කිසිදු විකිරණශීලී ද්‍රව්‍යයන් GTRI ව්‍යාපෘතිය යටතේ ලබාගෙන නොමැත. විගණන වාර්තාවේ සඳහන් වනුයේ ඉහත ව්‍යාපෘතිය යටතේ ලැබුණු උපකරණ සම්බන්ධයෙන් යැයි අපගේ හැඟීමයි.**

**මෙම විගණන නිරීක්ෂණයට අදාළ වන උපකරණ ඇමරිකානු එක්සත් ජනපද තානාපති කාර්යාලය මඟින් GTRI ව්‍යාපෘතිය යටතේ විකිරණ ආරක්ෂණ හා නියාමන අංශය වෙත එකී ව්‍යාපෘතිය සම්බන්ධීකරණය සඳහා ලබාදී ඇති විකිරණ මනිණු ලබන උපකරණ වේ.**

**විකිරණ ආරක්ෂණ අංශය විසින් මෙම උපකරණ පුහුණු වැඩසටහන් සහ වෙනත් නියාමන කටයුතු සඳහා පාවිච්චි කරනු ලැබේ.**

**2010.02.18 දින ලැබී තිබුණු මෙම උපකරණ පරමාණුක ශක්ති අධිකාරියේ ගිණුම් පොත් වලට ඇතුලත් කර ගන්නා ලෙස අංශ ප්‍රධානී ( විකිරණ ආරක්ෂණ හා නියාමන අංශය) විසින් 2012 වසරේ දී ගිණුම් අංශය වෙත දැනුම් දී තිබුණි.**

**ඒ අනුව මෙම උපකරණ පරමාණුක ශක්ති අධිකාරියේ ගිණුම් පොත් වල 2010.02.18 දින ලැබුණු සේ ගිණුම් ගත කරන ලදී.**

**GTRI ව්‍යාපෘතිය යටතේ ලැබුණු සියළුම උපකරණ 2015 වසරේ දී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් බාර ගන්නා ලදී.**

**(ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව පිහිටුවු වන ලද්දේ ප.ශ.අ. යටතේ තිබූ විකිරණ ආරක්ෂණ අංශය සතු වූ කාර්යය මණ්ඩලය හා උපකරණ යොදාගනිමිනි.)**

**ඉන්වොයිස් රහිතව GTRI ව්‍යාපෘතිය යටතේ ලැබී තිබූ Radeye නම් වූ උපකරණ 80 එකී ව්‍යාපෘතියේ ඉල්ලීම පරිදි ආරක්ෂණ අඩවි වෙත බෙදා හරින ලදී. (Physical Protection Sites)**

**Radeye නම් වූ උපකරණයෙන් අයිතම් දෙකක් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත ලැබී ඇත.**

(ඇ) සැලසුම් කරන ලද කාලසීමාව තුල දී අනුමත ඇස්තමේන්තු වලට අනුකූලව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය මඟින් අරමුදල් සපයනු ලබන තාක්ෂණ සහයෝගීතා ව්‍යාපෘති වැඩසටහන් අවසන් කල යුතු බව පිළිගනිමු.

**අරමුදල් සැපයීමේ ස්වභාවය**

සෑම ව්‍යාපෘතියකම වැය ඇස්තමේන්තු සැලසුම් අවස්ථාවට සාපේක්ෂව ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවේ දී විවිධ හේතූන් විචල්‍යයන්ට භාජනය වේ. (විචල්‍යයන්හි වෙනස්වීම, විශේෂඥයන්ට කරනු ලබන ගෙවීම් වල විචලනය අනුග්‍රාහක දීමනා සහ අනුග්‍රහය දක්වන සේවා ලාභීන් සහ උපකරණ වල මිල වෙනස්වීම්) එසේ වුවද එක් ව්‍යාපෘතියකට වෙන් කල මුදලින් ඉතිරියක් වූ විට එම ඉතිරිය රටේ වෙනත් තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතියක් සඳහා අදාළ ව්‍යාපෘති භාර පාර්ශවයන් හා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ ජාතික සම්බන්ධීකරණ නිළධාරීගේ එකඟතාවය මත යොදා ගනු ඇත.

සැලසුම් කරන ලද සියළුම ව්‍යාපෘති අවසන් වූ පසුව එම ඉතිරිය රටේ වෙන යම් වැදගත්කමකින් යුත් විකිරණ තාක්ෂණික යොදාගැනීම් සම්බන්ධ කටයුතු සඳහා යොදා ගනු ලැබේ.

ජා.ප.බ.ඒජන්සිය මඟින් ආධාර කරනු ලබන්නේ විද්‍යාත්මක සංචාර, තාක්ෂණික සහයෝගීතා, විද්‍යාත්මක උපකරණ සහ විශේෂඥ සේවා සඳහා වන අතර කිසිදු අවස්ථාවක මුදල් ආධාර ලබාදෙනු නොලැබේ.

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්**

ජා.ප.බ.ඒජන්සිය මඟින් අධාර සපයනු ලබන ව්‍යාපෘති සඳහා සාමාජික රට සහ ජා.ප.බ.ඒජන්සිය හැර විවිධ පාර්ශවයන්ගේ සහභාගීත්වය අවශ්‍ය වන බැවින් නියමිත කාලය තුල දී ව්‍යාපෘති වල කටයුතු අවසන් කල නොහැකි වී ඇත. මේ යටතේ හඳුනාගත් සමහර හේතූන් පහතින් සඳහන් කර ඇත.

ජා.ප.බ.ඒජන්සිය සතු රසායනාගාර තුල දී සියළුම පුහුණු ලාභීන් (Fellows) ඔවුන්ගේ අවශ්‍යතා වලට අනුකූල වන පරිදි පුහුණුවීම් වලට යොමුකල නොහැකි වන අතර ඒ සඳහා සුදුසු ආයතන සාමාජික රටවල් තුලින් සොයා ගත යුතුය මෙසේ තෝරා ගනු ලබන උපකාරක රටවල් වල අදාළ ආයතන වල ප්‍රතිචාර දැක්වීම සමහර අවස්ථා වලදී ප්‍රමාදයන්ගෙන් යුක්ත වේ. ඒ අනුව සහයෝගීතා පදනමින් දෙනු ලබන පුහුණුවීම් විශේෂඥ සේවාවන් ආදියෙහි ප්‍රමාදයන් සිදුවනු ලැබේ.

සමහර අයදුම්කරුවන් විසින් ජා.ප.බ.ඒජන්සිය විසින් තෝරා දෙනු ලබන ආයතන තමාගේ පුහුණුව සඳහා භාර නොගන්නා අවස්ථා ඇතිවන අතර එවිට නැවත වතාවක් සුදුසු ආයතන සොයා ගැනීම වෙනුවෙන් අමතර කාලය ගත වන අතර එය ද ව්‍යාපෘති වල අවසන් කිරීමේ ප්‍රමාදයට බලපානු ලැබේ.

එබැවින් සමහර ආයතන පුහුණුව ලබාදීම සඳහා කැමැත්ත පල කල ද පසුව යම් යම් හේතූන් මත එකඟ වූ පුහුණුව ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී ද ප්‍රමාදවීම් සිදුවනු ඇත. එවැනි අවස්ථාවල දී නැවත වරක් එකම ක්‍රියාවලිය නැවත සිදු කිරීමට (සහයෝගීතාවය ලබාදීමට ආයතන සෙවීම) ජා.ප.බ.ඒජන්සියට සිදුවේ.

සමහර අවස්ථාවල දී සහයෝගීතාව ලබාදීමට ආයතන එකඟ වුවද අදාළ සුපරීක්ෂක නිළධාරියාවරයාගේ පුද්ගලික හෝ රාජකාරී කටයුත්තක් නිසා පොරොන්දු වූ කාල සීමාව තුල දී නියමිත පුහුණුව ලබාදීම සිදු නොවන අතර එම හේතුව නිසා වැඩිපුර කාලයක් ව්‍යාපෘතිය අවසන් කිරීමට ගත වන හේතුව නිසා වැඩිපුර කාලයක් ව්‍යාපෘතිය අවසන් කිරීමට ගත වන අවස්ථා ද ඇත.

වගකීම්**:**

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම ඒ ඒ ව්‍යාපෘතිවලට පත් කල සම්බන්ධීකරණ නිළධාරීන් සහ ඔවුගේ පාර්ශව කරුවන් වගකීමකි.ජාතික සම්බන්ධීකාරකව ඉටුකල හැක්කේ යම් ව්‍යාපෘතියක ප්‍රමාදයට බලපාන බාධක හෝ මතභේදයන් ශ්‍රී ලංකාව වෙනුවෙන් පත්කොට ඇති ව්‍යාපෘති කළමණාකරන නිළධාරී දැනුවත් කොට ඒවා නිරාකරණය කර දීමට කටයුතු කිරීමයි.

## 2.3 නීති රෙගුලාසි සහ කළමණාකාරණ තීරණ වලින් බැහැර වූ අවස්ථා

(අ) නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2014 වර්ෂය සඳහා සම්පූර්ණ කර ඇත.

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයට අයත් වත්කම් 2015 අගෝස්තු මාසයේ දී විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත පවරන ලදී. 2014 වසරේදී අදාළ වත්කම් වල අයිතිය පරමාණුක බලශක්ති අධිකාරිය සතු නොවූ බැවින් එම වසරේ භෞතික භාණ්ඩ සමීක්ෂණය සිදු නොකරන ලදී. කෙසේ වුවද 2015 වසරේ ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ භෞතික භාණ්ඩ සමීක්ෂණය සිදු කල අතර අදාළ වට්ටෝරු ලේඛණ ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ භාරයේ ඇත.

(ආ) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ වරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව පිහිටුවා ඇති අතර එම කමිටුවේ නිර්දේශ මත විදේශීය පුහුණුවීම් සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ.

(ඇ) මෙම ගෙවීම දීමනාවක් නොවේ. ගෙවනු වර්ෂය තුලදී ආයතනය අපේක්ෂා කල ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා ලබාදුන් දායකත්වය වෙනුවෙන් දිරිගැන්වීමේ දීමනාවක් ලෙස සහ සේවක කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් මෙම ගෙවීම් සිදු කරන ලදී.

## 3. මූල්‍ය විග්‍රහය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

පහත සඳහන් හේතුන් වසරේ මෙහෙයුම් ඌණතාවය වර්ධනය වීමට බලපා ඇත.

1. සමහර වියදම් ඇස්තමේන්තු ඉක්මවා ගොස් ඇත.
2. වාර්ෂික අයවැය ලේඛණය මඟින් වැටුප් වැඩිකිරීම
3. සමහර සේවා සඳහා වූ ඉල්ලුම අඩුවීම
4. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ මෙහෙයුම් වියදම් කොබෝල්ට් 60 ප්‍රභවයේ වැය වීම නිසා අධික වීම.

## 4. මෙහෙයුම් සමාලෝචන

### 4.1. කළමණාකරන දූර්වලතා

**(අ) ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය**

විගණකාධිපති වාර්තාවේ සඳහන් වන පරිදි මෙය ආයෝජන මණ්ඩලය අනුමත කල ව්‍යාපෘතියක් නොවේ.

**(i)** මෙම ව්‍යාපෘතිය දැනටමත් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත පවරා ඇත.
වාර්ෂික බදු කුලී ගෙවීමට යටත්ව ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය පිහිටි ඉඩම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත පැවරිය හැකි බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දැනුම් දී ඇත.

(ii) බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ ව්‍යාපෘතියට අදාල අනෙකුත් සියලුම වත්කම් 2015.08.04 දින සිට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත පවරා ඇත.

(iii)ISO 13485:2003 තත්ත්ව සහතිකය හා ISO 9001:2008 තත්ත්ව සහතිකය ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය සතු වන අතර ISO 13485 තත්ත්ව සහතිකය හිමි එකම රාජ්‍ය ආයතනය මෙම මධ්‍යස්ථානය වේ.
සේවාවේ ස්වභාවය සම්බන්ධව විගණන වාර්තාවේ දක්වා ඇති කාරණා සම්බන්ධව විද්‍යාත්මක සාක්ෂි රහිතව එකඟ විය නොහැක.

සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ජීවානුහරණය කරන ලද ශල්‍ය අත්වැසුම් සැපයීම සඳහා එම අත්වැසුම් ජීවානුහරණය කිරීමට 2014 වන විට ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය හැර වෙනත් දේශීය සමාගම් කිසිවක් සුදුසුකම් ලබා නොතිබුණි. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය සතු යන්ත්‍රාගාරය නිර්මාණය කර ඇත්තේ දේශීය සහ විදේශීය වෙළෙඳපොළ සඳහා ජීවානුහරිත රබර් අත්වැසුම් නිෂ්පාදනය කරන දේශීය සැපයුම් කරුවන්ට සේවාවක් ලබාදීම සඳහාය.

(iv)ලෝකයේ සෑම රටකම පාහේ විකිරණ යෙදවුම් සම්බන්ධ යන්ත්‍රාගාර සාමාන්‍යයෙන් නිර්මාණය කරනු ලබන්නේ විශාල ධාරිතාවක් සඳහාය. ( ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ සැලසුම්ගත ධාරිතාව කිලෝ කියුරි 3000) ඉදිරි වසර 10-20 ක් දක්වා කාලය සඳහා බැවින් යන්ත්‍රාගාර නිර්මාණය කරනු ලබන අතර ප්‍රාග්ධන ආයෝජනය අධික ව්‍යාපෘතියක් වන බැවින් යන්ත්‍රාගාර කිහිපයක් ගොඩනැගීම වෙනුවට වැඩි ධාරිතාවකින් යුක්ත එක් යන්ත්‍රාගාරයක් පිහිටුවීම වඩා වාසිදායක වේ. ඒ අනුව ඉදිරි වර්ෂ වලදී වැඩි වන ඉල්ලුමට සරිලන පරිදි මෙම ප්‍රභවය වැඩි ධාරිතාවක් සහිතව වැඩි දියුණු කරනු ලැබේ.

ඊට අමතරව කොබෝල්ට් 60 ප්‍රභවයේ ස්වභාවය නම් කාලයත් සමඟ ඒවායේ ශක්තිය ස්වයංක්‍රීයව හීන වනු ලැබේ. මෙය වාර්ෂිකව 12.5 % ක පමණ ක්ෂය වීමක් සිදු වේ. ඒ අනුව මෙම යන්ත්‍රාගාරයට උචිත ප්‍රභවයේ ධාරිතාව මධ්‍යස්ථානයේ සේවා සඳහා ඇති ඉල්ලුම අනුව තීරණය කල යුතු අතර ඊට අනුරූපීව කොබෝල්ට් 60 ප්‍රභවය ධාරිතාව ඉහල නංවනු ලැබේ.

**(v)** කර්මාන්තශාලා මෙහෙයුම් කලමණාකාර තනතුර සඳහා කිහිප වරක් අයදුම්පත් කැඳවුවද කිසිවකු ඒ සඳහා ඉල්ලුම් නොකර ලදි. එබැවින් අදාල තනතුර සඳහා වූ මූලික සුදුසුකම් සංශෝධනය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලදි. එනම් එම තනතුර සඳහා නියමකොට ඇති වැටුපට සරිලන පරිදි මූලික සුදුසුකම් අවම කරන ලෙසයි. ඊට ප්‍රතිචාර වශයෙන්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එකී තනතුරට අවශ්‍ය පලපුරුද්ද වසර ගණන අඩු කරන ලදි. එකී සංශෝධිත බඳවා ගැනීම් පරිපාටියට අනුව නැවත අයදුම්පත් කැඳවුවද ඒ සඳහාද කිසිම අයදුම්කරුවකු ප්‍රතිචාර දක්වා නැත. අනෙකුත් තනතුරු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සංශෝධිත බඳවා ගැනීම් පරිපාටිය සඳහා ලැබෙන තෙක් පියවර ගෙන නැත.

### 4.2 ප්‍රයෝජනයට නොගන්නා සහ අර්ධ වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම්

කාර්යාලීය ගිණුම්කරණ හා ගබඩා මෘදුකාංගය නවීන තාක්ෂණයන් පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයෙන් මිලට ගන්නා ලද්දකි. එම ආයතනය මඟින් මෙම මෘදුකාංගය නිර්මාණය කිරීම සඳහා යොදවන ලද කාර්ය මණ්ඩලය වරින් වර ආයතනයේ සේවයෙන් ඉවත් වීම නිසා එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කල නොහැකි විය.

කෙසේ වෙතත් මෙම මෘදුකාංගයේ අධාරයෙන් දෛනික මුදල් ශේෂය නිරීක්ෂණය , ලැබීම් සහ ගෙවීම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම මෙන්ම සේවා සඳහා ඉන්වොයිස් නිකුත් කිරීමටද නව මෘදුකාංගය නව මෘදුකාංගය ආරම්භ කරන තෙක් භාවිතා කරන ලදි.

මෙම මෘදුකාංග ව්‍යාපෘතිය සඳහා වූ කොන්ත්‍රාත්තුවට අදාල වැඩ ප්‍රමාද වීම සහ එම සැපයුම් ආයතන විසින් ඉතා ඉහළ වාර්ෂික නඩත්තු සේවා සඳහා ගාස්තු ඉල්ලා සිටීමත් හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට පරමාණුක ශක්ති අධිකාරිය තීරණය කරන ලදි.

### 4.3 මතභේදයට තුඩුදෙන ස්වභාවයේ කරුණු

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ ආරම්භක උත්සවය සඳහා ගෙවන ලද රු.2,153,424 ක මුදල තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි කරනු ලැබූ ගෙවීමකි.

### 4.4 ප්‍රතිඵල රහිත වියදම්

එකිනෙකට වෙනස් අවශ්‍යතා මෙන්ම වෙනස් අංශ සහ වෙනස් කාර්යයන් සඳහා පොකට් ඩොසිමීටර් නම් උපකරණ 15ක් මිලදී ගන්නා ලදී. මින් 5ක් ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයට ද 10 ක් හදිසි ආපදා දැනුම් දීමේ කාර්යෙහි නියුක්ත ඔරුගොඩවත්තේ පිහිටි කාර්යාලයේ විකිරණ සේවකයින් සඳහා මිලදී ගන්නා ලදී. මෙම අයිතම් වල අවශ්‍යතාවය වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් වලද ඇතුලත් කොට තිබුණි. ඊට අමතරව මෙම උපකරණ පිලිබඳ අවශ්‍යතාවය අධිකාරියේ ව්‍යාපෘති ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව මිලදීගෙන ඇති හෙයින් මෙම වියදම අර්ථ විරහිත වියදමක් ලෙස සැලකිය නොහැක.

### 4.5 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 වැනි දින වන විට පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පැවතිණි.

| සේවක කාණ්ඩය | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | | |
| * විද්‍යාත්මක අංශ වල අධ්‍යක්ෂ | 02 | |
| * අධ්‍යක්ෂ පරිපාලන | 01 | |
| * කර්මාන්තශාලා මෙහෙයුම් කළමණාකරු | 01 | 04 |
| ද්විතිය | | |
| * විද්‍යාත්මක නිලධාරී | 02 | |
| * මූල්‍ය/ පරිපාලන/අභ්‍යන්තර විගණන නිළධාරී | 03 | |
| * කළමණාකරන සහකාර | 05 | |
| * කාර්මික සහකාර | 13 | 23 |
| `ප්‍රාථමික | | |
| * කාර්යාල /විද්‍යාගාර සහායක | 09 | |
| * රියදුරු | 01 | |
| * විදුලි කාර්මික | 01 | |
| * පරිගණක දෘඩාංග කාර්මික | 01 | 12 |

ඉහත සඳහන් කළ සියළුම පුරප්පාඩු 2013 හා 2014 වර්ෂ වලදී ඇති වූ ඒවාය. මෙකී පුරප්පාඩු නොපිරවීමට බලපෑ ප්‍රධාන හේතු පහත සඳහන් වේ. 2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ක්‍රියාත්මක වීම තුලින් එතෙක් පැවති පරමාණුක ශක්ති අධිකාරිය අහෝසි වී නව ආයතන දෙකක් අතරේ කාර්යයන් බෙදා වෙන් වීමට නියමිත විය. රේඛීය අමාත්‍යාංශය වූ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් අදාළ බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටවන ලෙසත් අළුතින් ඇතිකරන ලද ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට නව බඳවාගැනීමේ පටිපාටියක් සහ සේවක සංඛ්‍යා සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගන්නා ලෙස දැනුම් දී තිබුණි. අදාළ අනුමැතීන් පිළිවෙලින් 2015.08.25 දින සහ 2015.12.04 දින ලැබී ඇත. නව බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව දැනට පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ යන්ත්‍රාගාර මෙහෙයුම් කළමණාකාර තනතුර සඳහා කිහිපවරක් ඉල්ලුම්පත් කැඳවා තිබුණද එකී තනතුරට අදාළව ඉල්ලා ඇති සුදුසුකම් හා පළපුරුද්ද එකී තනතුරට නියමිත වැටුප් පරිමානයට සාපේක්ෂව ප්‍රමාණවත් නොවන නිසා මෙම තනතුර සඳහා කිසිවෙකු ඉල්ලුම් කර නොමැත.

## 5. වගවීම සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

වාර්ෂික අභ්‍යන්තර සැලැස්ම සෑම වසරකම පිළියෙල කරනු ලබන අතර ඒ සඳහා විගණන කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගනී. අභ්‍යන්තර විගණන ඒකකය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති බැවින් බොහෝ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සිදුකරනු ලබන්නේ නියැදි විගණන පරීක්ෂණවේ.
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කාර්යයන් වර්ධනය වීමට අනුකූල වන පරිදි දැනට පවතින අභ්‍යන්තර විගණන ඒකකය වැඩි දියුණු කල යුතුය. දැනට පවතින අභ්‍යන්තර විගණක තනතුර ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස අධිශ්‍රේණි ගත කිරීම සඳහා කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වාචිකව දැනුම් දී ඇති පරිදි මෙම ඉල්ලීම ආයතනයේ සංවිධාන ව්‍යුහය සංශෝධනය කරන අවස්ථාවේදී සලකා බැලිය හැකි බව දන්වා ඇත. ඊට සමගාමීව රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ නිර්දේශ පරිදි සංශෝධිත සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරක් සහ සහකාර අභ්‍යන්තර විගණක (තාක්ෂණ) නමින් නව තනතුරු  දෙකක් යෝජනා කර ඇත.මේ අනුව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නව ජ්‍යෙෂ්ඨ කළමණාකරන මට්ටමේ තනතුරක් ඇතිවේ. තාවකාලික පියවරක් ලෙස කළමණාකාර සහකාර තනතුරක් ඇති කිරීමට විගණන කමිටුවේ තීරණය අනුව කටයුතු කරමින් පවතී.

### 5.2 විගණන කමිටුව

විගණන කමිටු වාර්තා අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කරනු ලැබේ.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

හදිසි අවශ්‍යතා සහ ප්‍රතිපූර්ණය වෙනුවෙන් අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට හැකිවන පරිදි වර්ෂය තුලදී කිහිප වතාවක් සංශෝධනය කරන ලදී.

### 5.4 අය වැය පාලනය

වාර්ෂිකව ලැබෙන පුනරාවර්තන ප්‍රදානයන් සහ සේවා සැපයීම වෙනුවෙන් ලැබෙන ආදායම් සැලකිල්ලට ගෙන පුනරාවර්තන වියදම් වැය ලේඛණය පිළියෙල කරනු ලැබේ. සත්‍ය වියදම හා අය වැය අතර වෙනස්වීම් වලට ප්‍රධාන හේතු පහත දක්වා ඇත.

1.වාර්ෂික අයවැය ලේඛණය අනුව සේවක වැටුප් වැඩිවීම
2. සේවකයින්ගේ ඉල්ලා අස්වීම්
3.ඉන්ධන මිළ ඉහල යාම
4. උපකරණ ක්‍රියා විරහිත වීම් හා අළුත්වැඩියා අධික වීම
5. නව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති
6. සේවා සඳහා ලැබෙන ආදායම් අඩුවීම්

ඉහත සඳහන් කල කරුණු ආයතනයේ පාලනයෙන් තොරවේ.

**6.** ක්‍රියාවලි හා පාලන ක්‍රම

**(a) to (e) and**
**(g) and (h)**

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කොට දැනට පවත්නා ක්‍රියාවලීන් වල තත්වය පරීක්ෂාකර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා යොමු කර ඇත.

**(f)** මානව සම්පත් කළමණාකරණය**:**

2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවා ඇත. දැනට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් පටිපාටියක් සකස් කරමින් පවතී. මෙහිදී පැරණි බඳවාගැනීමේ පටිපාටියේ වූ අඩුපාඩු සමනය කිරීම සම්බන්ධයෙන් සලකා බැලෙන අතර විශේෂයෙන් කණිෂ්ඨ ශ්‍රේණි සඳහා අභ්‍යාන්තර උසස්වීම් සහ ශ්‍රේණිගත උසස්වීම් සම්බන්ධයෙන් ද සලකා බැලේ.

පරමාණුක ශක්ති අධිකාරිය සඳහා වූ බඳවා ගැනීම් පටිපාටියට අදාළ සංශෝධන සමඟ තවදුරටත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා ක්‍රියාත්මක කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. නව බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කරගෙන යනු ලබන අතර දැනට වලංගු බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව පවතින පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන ඇත.



සභාපති
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
20.04.2016